# වාර්ෂික වාර්තාව 2022

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ஆண்டறிக்கை 2022

முகாமைத்துவ பட்டப்பின்படிப்பு நிறுவகம்

ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்

# Annual Report 2022

POSTGRADUATE INSTITUTE OF MANAGEMENT

University of Sri Jayewardenepura



# වාර්ෂික වාර්තාව 2022



Postgraduate Institute of Management
University of Sri Jayewardenepura

# පටුන


දැක්ම, මෙහෙවර සහ වටිනාකම් ---------- 03

අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය ---------- 05

හැඳින්වීම ---------- 06

සංවිධාන ව්‍යුහය ---------- 07

කළමනාකරණ මණ්ඩලය ---------- 08

අධ්‍යයන මණ්ඩලය ---------- 08

ඉගැන්වීම ---------- 09

පර්යේෂණ හා ප්‍රකාශන ---------- 15

හවුල්කාරීත්වය ---------- 22

තිරසරත්වය ---------- 25

පාලනය ---------- 39

අනාගත සැලසුම් ---------- 48

මූල්‍ය ප්‍රකාශනය ---------- 49

විගණන වාර්තාව ---------- 71

විගණන නිරීක්ෂණ සඳහා ආයතනයේ පිළිතුරු ---------- 79

# දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

**දැක්ම**

දකුණු ආසියාවේ කළමනාකරණ විශිෂ්ටත්වය සඳහා කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

**මෙහෙවර**

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සහතික කළ ගුණාත්මකභාවය, ආදර්ශවත් පාලනය සහ ප්‍රබෝධමත් තිරසාරත්වය තුළින් නව්‍ය ඉගෙනීම, ප්‍රතිවේදී පර්යේෂණ, සඵල හවුල්කාරිත්වයන් සහ අනාගත සංවර්ධනය මගින් පුද්ගලයින් සහ සංවිධාන තුළ වටිනාකම් නිර්මාණය කිරීමට මහත් පරිශ්‍රමයක් දරයි.

**මූලික වටිනාකම්**

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ මූලික වටිනාකම් තුන වනුයේ ඇල්ම, අවංකභාවය සහ අවධානයෙන් සිටීමයි. සෑම වටිනාකමක් යටතේ ම ප්‍රධාන *ප්‍රධාන හැසිරීම් සාධක (KBIs) කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු.*

**ඇල්ම**

ප්‍රතිඵල කෙරෙහි උද්යෝගය සහ උනන්දුව ප්‍රදර්ශනය කිරීමේ පරිචය ක්‍රියාවන්හි වෘත්තීයභාවය පෙන්වීම සහ නීති රීතිවලට අනුකූලව පූර්ණ සහයෝගයෙන් කටයුතු කිරීම.

***ප්‍රධාන හැසිරීම් සාධක** (KBIs)*

- අපේක්ෂිත පුරුදුවලින් බැහැර නොවී ස්වයං පාලනයක් පෙන්නුම් කරයි.
- නීති රීති ක්‍රියාත්මක කිරීමේදී කැමැත්තෙන් සහයෝගය දක්වයි.
- ප්‍රතිඵල ලබා ගැනීමට ඇති ආශාව පෙන්නුම් කරයි. ක්‍රියාවෙහි ශක්තිය සහ ගතිකත්වය විදහා දක්වයි.

**අවංකභාවය**

ලබා දී ඇති කාර්යයන් සමූහයක් ඉටු කිරීම සඳහා මුළු හදවතින්ම දායකත්වය ලබා දීම සහ ආයතනයේ යහපත ගැන සිතමින් සදාචාරාත්මකව කටයුතු කිරීම.

***ප්‍රධාන හැසිරීම් සාධක** (KBIs)*

- ආයතනයේ යහපත වෙනුවෙන් කාලය හා ශක්තිය කැප කරයි.
- පවරා ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉහළ මැදිහත්වීමක් පෙන්නුම් කරයි.
- ගැටලුවකට ප්‍රවේශ වීමේ ධනාත්මක සහ උද්යෝගිමත් ක්‍රම පෙන්වා දෙයි.

**අවධානයෙන් සිටීම**


කාර්යයන් ඉටු කිරීමේදී ඒකාග්‍ර අවධානය පවත්වා ගැනීම සහ වෙනත් පුද්ගලයෙකුගේ දෘෂ්ටිකෝණයෙන් බැලීමෙන් ඔහුගේ අත්දැකීම් අවබෝධ කර ගැනීම.

***ප්‍රධාන හැසිරීම් සාධක** (KBIs)*

- පවරා ඇති කාර්යයන් හැසිරවීමේදී අවධානයකින් යුතුව සිදු කරයි.
- රැකියාවට අදාළ වගකීම් ඉටු කිරීමේදී සවිස්තරාත්මකව අවධානය යොමු කරයි.
- රාජකාරි ඉටු කිරීමේදී උපරිම අවධානය යොමු කරයි.
- අනෙක් පුද්ගලයාගේ දෘෂ්ටිකෝණයට සවන් දෙන අතර අනෙකා ගැටලුවක් දෙස බලන ආකාරය වටහා ගැනීමට උත්සාහ කරයි.

## *සමස්ත ප්‍රවේශය*

## *අපගේ විශිෂ්ටත්වයේ ප්‍රාසාදය*




අපි අපගේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) අපගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ලෙස භාවිතා කරමු

## ඉලක්ක

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඉදිරි වසර පහ සඳහා ඉලක්ක හත පහත පරිදි වේ**.:

| | |
|---|---|
| **පළමු ඉලක්කය**: | සියලුම අධ්‍යයන පාඨමාලා සඳහා ලොව පිළිගත් ඉගෙනුම් අත්දැකීමක් ලබා දීම |
| **දෙවන ඉලක්කය**: | කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ විෂය පථය කර්මාන්තයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි අදාළ සහ කාලෝචිත ලෙස වැඩිදියුණු කිරීම |
| **තෙවන ඉලක්කය**: | කර්මාන්ත, උසස් අධ්‍යාපන ආයතන සහ වෘත්තීය සංගම් සමඟ හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම |
| **හතරවන ඉලක්කය**: | පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ විධායක ශක්‍යතාව ගොඩනැගීමේ ප්‍රමුඛයා වීම |
| **පස්වන ඉලක්කය**: | ඉගෙනීම, පර්යේෂණ, හවුල්කාරිත්වය සහ සංවර්ධනයේ ඉහළම ගුණාත්මකභාවයට ළඟා වීම සහ පවත්වා ගැනීම |
| **හයවන ඉලක්කය**: | ඉගෙනීම, පර්යේෂණ, හවුල්කාරිත්වය සහ සංවර්ධනය බලදායී කරමින් ප්‍රතිපත්ති, භාවිතයන් සහ ක්‍රියාවලීන්හි ආදර්ශමත් පාලනයක් සහතික කිරීම |
| **හත්වන ඉලක්කය**: | ආර්ථික, සමාජීය සහ පාරිසරික ඉදිරි මඟ ආවේශක තිරසරත්වය සහතික කිරීම. |

# අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය



2022 වර්ෂය තුළ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය කිරීමට ලැබීම ගැන මම අතිශයින් සතුටට වෙමි. අප ලද සමස්ත සාර්ථකත්වය කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ මගේ ක්‍රියාශීලී සහ කැපවූ කණ්ඩායම වෙත මම ආරෝපණය කරමි.

විශිෂ්ටත්වය යනු සුවිශේෂ ලෙස යහපත් වීමයි. ව්‍යවසායන් සඳහා අදාළ කරගත් කළ, එහි සංගත ආකාරයකින් සුවිශේෂ ජයග්‍රහණයන් ඇතුළත් වේ. නිවැරදි ගුණාත්මකභාවය සහ ප්‍රමාණය කෙරෙහි අවධානය යොමු කරන ස්වයං මූල්‍යයන සහ අර්ධ ස්වයං පාලන රාජ්‍ය ආයතනයක් වශයෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අභිමානය එයයි. අපි සුවිශේෂ හැකියාවන්ගෙන් සමන්විත විධායකයන් සමඟ ඔවුන්ගේ සැබෑ විභවය මුදා හැරීම සඳහා අත්‍යවශ්‍යයෙන්ම ඔවුන් ඒ සඳහා යොමු කරමින් විශිෂ්ටත්වය කරා පිය නගන්නෙමු. ඔවුන් විවිධ පැතිවලින් සමාජ-ආර්ථික උන්නතිය සඳහා දායක වනු ඇතැයි යන්න ජාතියේ අපේක්ෂාවයි.

වර්ෂය තුළ, 2020-22 සඳහා වූ ආයතනික සැලැස්ම මත පදනම්ව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය එහි කළමනාකරණ මණ්ඩලය සහ අධ්‍යයන මණ්ඩල විසින් මනාව මඟපෙන්වීම සහ මෙහෙයවීම සිදු කර ඇත. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ඉලක්ක පහ වන (i) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන වැඩසටහන්වල විෂය පථය වැඩි දියුණු කිරීම, (ii) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සහ ප්‍රකාශනවල විශිෂ්ටත්වයේ විෂය පථය වැඩි දියුණු කිරීම, (iii) කර්මාන්තය, විශ්වවිද්‍යාල සහ වෘත්තිමය සංගම් සමඟ හවුල්කාරිත්වය වර්ධනය කිරීම, (iv) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සංවර්ධනය කිරීම සහ හිතකර ඉගෙනුම් පරිසරයක් ලබා දීම සඳහා යටිතල පහසුකම් සහතික කිරීම සහ (v) මූල්‍ය හා පරිපාලන අනුකූලතාවයෙන් විදේශ ආදායම ඇතුළුව ආදායම් වර්ධනය සහතික කිරීම යන සමස්ත කාර්ය සාධනය ඉතා සතුටුදායක බව මා ප්‍රකාශ කරනුයේ අතිශය ප්‍රීතියෙනි.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) ස්වාධිපත්‍යය පරිපාලන, මූල්‍ය සහ මෙහෙයුම් නිදහස සඳහා සපයන නීති සම්පාදනය තුළ අන්තර්ගත වේ. එපමණක් නොව, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ නව ගොඩනැගිලි ඉදිකිරීම ඇතුළු එහි ප්‍රාග්ධන වියදම් සඳහා පවා මහා භාණ්ඩාගාරයේ කිසිදු අයවැය ප්‍රතිපාදනයක් මත රඳා නොපවතී.

පෞද්ගලික ව්‍යවසායන් සඳහා, ලාභදායීතාවය යනු කාර්යක්ෂමතාව මනිනු ලබන ප්‍රධාන දර්ශකය වේ. රාජ්‍ය ව්‍යවසායන් ලාභ නොලබන කාර්යයන් ඉටු කරන නිසා එවැනි බොහෝ ව්‍යවසායන් ලාභ උපරිම කිරීමට නිර්මාණය කර නොමැති බැවින්, ලාභදායිත්වය ප්‍රමාණවත් දර්ශකයක් නොවිය හැකිය. කෙසේ වෙතත්, අපගේ මතයට අනුව නම් භාණ්ඩාගාරයට වැය බරක් නොවී රාජ්‍ය ව්‍යවසායක් ක්‍රියාත්මක වන විට එවැනි ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කළ යුතුය. කාර්යසාධනය මත පදනම් වූ විගණනය පමණක් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය එහි මෙහෙයුම් කාර්යසාධනය සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීමට පොළඹවනු ඇත.

ජාතියේ කළමනාකරණ උපදේශකයා වශයෙන් හැඳින්වීමට යෝග්‍ය වන්නා වූ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, එහි දැක්ම, මෙහෙවර සහ වටිනාකම්වලට අනුකූලව, අවශ්‍ය නිපුණතාවයෙන් සහ විශ්වාසයෙන් යුත් නායකයින් බිහිකිරීම සම්බන්ධයෙන් වූ වටිනාකම් ගොඩනැගීමට දක්වන්නා වූ දායකත්වය ඉදිරියට ද එලෙසම ලබා දෙනු ඇත.



අත්. කළේ
**ආචාර්ය සේනක කැලුම් ගමගේ**
අධ්‍යක්ෂ

# හැඳින්වීම


ජාතියේ කළමනාකරණ උපදේශකයා ලෙස, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) එහි 2022 වාර්ෂික වාර්තාව අවශ්‍ය විස්තර සහිතව ඉදිරිපත් කරනු ලබනුයේ ඉමහත් ප්‍රීතියෙනි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් සහ කොවිඩ් 19 වසංගතයෙන් අනතුරුව සැලසුම් කළ සියලු වැඩසටහන් නියමිත වේලාවට නිම කිරීමත් සමඟ සුමට අඛණ්ඩ පැවැත්මක් සහතික කරමින් ආයතනය නැවත ප්‍රකෘතිමත් තත්ත්වයට පත්ව ඇති බව සඳහන් කිරීම අගනේය.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත අර්ධ-ස්වයංපාලිත ආයතනයකි. කළමනාකරණ සහ පරිපාලනමය අධ්‍යයනයන්හි විවිධ අංශවල පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ කළමනාකරණයේ උසස් අධ්‍යාපනය සහ වෘත්තිමයභාවය ප්‍රවර්ධනය කිරීම එහි අරමුණු වේ. මේ වන විට, එය ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරුවන් සහ පරිපාලකයින් දහස් ගණනකට ඉගෙනීම සහ කුසලතා සංවර්ධනය සඳහා අභියෝගාත්මක අවස්ථාවන් සපයමින් වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනයේ සහ පුහුණුවේ ජාතික අවශ්‍යතා ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ උසස් කළමනාකරණ අධ්‍යාපනයේ පුරෝගාමියා වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය කළමනාකරණ දැනුම නවෝත්පාදනයේ සහ ව්‍යාප්ත කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින අයට සහ උසස් ඉගෙනුම් විකල්ප සොයන අයට නායකත්වය සපයයි.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 1986 වර්ෂයේ දී ආඥාපනතක් මගින් පිහිටුවන ලද කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ පශ්චාත් උපාධි ආයතන එකොළහෙන් එකකි. එය සාපේක්ෂව ළාබාල වුවද, පශ්චාත් උපාධි ආයතන අතරින් විශාලතම ශිෂ්‍ය ගහනය හිමි ආයතනය එය වන අතර එය රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ එකම ස්වයං මූල්‍යයන උසස් අධ්‍යාපන ආයතනය ද වේ.

ආයතනයේ ඉතිහාසය 1981 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ පශ්චාත් උපාධි අධ්‍යයන අංශයක් පිහිටුවීම දක්වා අතීතයට දිව යයි. එම අංශය කැනේඩියානු අන්තර්ජාතික සංවර්ධන අරමුදල (CIDA) යටතේ කැනේඩියානු විශ්වවිද්‍යාල දෙකක්, එනම් ඔටාවා විශ්ව විද්‍යාලය සහ කාල්ටන් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීත්වයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. 1986 දී මෙම අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යටතේ වෙනම ආයතනයක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලදී. 1995 දී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය කොළඹ 8, ලෙස්ලි රණගල මාවතේ ඉදිකරන ලද නව ගොඩනැගිල්ලට ගෙන යන ලදී.

# කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය - ආයතනික ව්‍යුහය



# කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වන කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ:

ආචාර්ය සේනක කැලුම් ගමගේ, අධ්‍යක්ෂ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (සභාපති)

පී.කේ.ඒ ද සිල්වා මිය, අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ සහ මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

අශෝක හෙට්ටිගොඩ මහතා, කළමනාකාර අධ්‍යක්ෂ, හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාරය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලලීන් කරුණානායක, පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහාචාර්ය පී.ඩී.නිමල්, පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම් එම් පත්මලාල්, පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ආචාර්ය අසංග රණසිංහ, සභාපති, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ පීඨ සාමාජික

ඒ.කේ. සෙනෙවිරත්න මහතා, අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

දීපාල් සූරියආරච්චි මහතා, කළමනාකරණ උපදේශක

ලලිත් වීරතුංග මහතා, ජනාධිපතිතුමාගේ ප්‍රධාන උපදේශක

ලසන්ත වික්‍රමසිංහ මහතා, හවුල්කරු බී.ආර්. ද සිල්වා සහ සමාගම

# අධ්‍යයන මණ්ඩලය

ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය විසින් වසර තුළ ඉගැන්වීම්, විභාග සහ පර්යේෂණ සම්බන්ධ කරුණු නියාමනය කරන ලද අතර පහත සඳහන් සාමාජිකයෝ එය නියෝජනය කළහ.

ආචාර්ය සේනක කැලුම් ගමගේ, අධ්‍යක්ෂ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (සභාපති)

ආචාර්ය ෆෙඩ්‍රික් අබේරත්න, උපදේශක, ප්‍රතිපත්ති මූලපිරීම, එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල

මහාචාර්ය යූ. අනුර කුමාර, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි, හිටපු අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

ආචාර්ය දමිතා ද සොයිසා, හිටපු අධ්‍යක්ෂ ජනරාල්, මහා භාණ්ඩාගාරය

ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු, ආර්ථික උපදේශක

ආචාර්ය ඒ.කේ.එල්. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ උපදේශක, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ආචාර්ය ට්‍රෙවර් මෙන්ඩිස්, ජ්‍යෙෂ්ඨ උපදේශක, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ආචාර්ය ට්‍රැවිස් පෙරේරා, ජ්‍යෙෂ්ඨ උපදේශක, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

එම්.ආර්. ප්‍රෙලිස් මහතා, සභාපති, කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් පෞද්. සමාගම

ආචාර්ය සරත් රාජපතිරණ, ආර්ථික උපදේශක

ආචාර්ය ඩබ්ලිව් ඒ විජේවර්ධන, ආර්ථික උපදේශක

# ඉගැන්වීමේ කටයුතු

## පාඨමාලා සැලසුම් කිරීම හා පිරිනැමීම

වසර තුළ පවත්වන ලද දර්ශන විශාරද උපාධි, ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි (MBA), රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධි (MPA) වැඩසටහන් මෙන්ම අනෙකුත් අධ්‍යයන සහ වෘත්තිමය සංවර්ධන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩිදියුණු කිරීමට නව්‍ය ප්‍රයත්නයන් දරන ලදී. ශිෂ්‍යයාට වටිනාකමක් පිරිනමන අතරම තරඟයෙන් ඉදිරියෙන් සිටීම සඳහා, නැගී එන ප්‍රවණතා, නව දැනුම් ක්ෂේත්‍රවලට අනුකූලව පාඨමාලා විෂයමාලා වැඩිදියුණු කර ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF) අනුකූලව සකස් කරන ලදී.

## ප්‍රධාන පාඨමාලා

### ව්‍යාපාර/රාජ්‍ය පරිපාලනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය (Ph. D)

දශක තුනහමාරකට පෙර ආරම්භයේ සිටම, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මඟින් ඉතා උසස් ප්‍රමිතීන්ට අනුකූලව සිය ආචාර්ය උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. කෙසේ වෙතත්, නියමිත කාල රාමුව තුළ උසස් තත්ත්වයේ ආචාර්ය උපාධි නිබන්ධන සකස් කිරීම සඳහා යොමු කරන සෑම උත්සාහයක් සමඟ අපගේ ආචාර්ය උපාධි පාඨමාලා වඩාත් සංසක්තක, කේන්ද්‍රගත සහ අදාළ පාඨමාලා බවට පරිවර්තනය කිරීමට කාලය එළඹ ඇති බව අපි විශ්වාස කරමු.

### ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MBA)

දශක තුනහමාරකට අධික කාලයකට පෙරාතුව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි (MBA) පාඨමාලාවේ පුරෝගාමියා ලෙස කටයුතු කළ අතර ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නායකයින් තුන්දහසකට අධික සංඛ්‍යාවක් බිහි කර ඇත.මේ වන විට එය ශ්‍රී ලංකාවේ වැඩිම ඉල්ලුමක් සහිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව වේ. පරිණාමය වන ව්‍යාපාරික අවශ්‍යතා සහ අභියෝග මත පදනම්ව මෙම පාඨමාලාව සඳහා නිරන්තරයෙන් නැවත නැවත සංශෝධනයන් සිදු කරනු ලබන අතර, ශාස්ත්‍රඥයින් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් යන දෙඅංශයෙන්ම සමන්විත ඉහළම තත්ත්වයේ කණ්ඩායමක් හරහා ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලැබේ. පැවරුම් සහ ව්‍යාපෘති වැඩ මගින් පහසුකම් සපයන ක්‍රියාකාරී ඉගෙනීම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඉගෙනුම් හවුල්කරුවන්ට ඔවුන් රැස් කරන අති නවීන දැනුම ඔවුන්ගේ වැඩ ලෝකයට සම්බන්ධ කිරීමට සහ අදාළ කර ගැනීමට උපකාරී වේ. වසර දෙකක කාලයක් තුළ, වැඩසටහන තාර්කිකව සහ අනුක්‍රමිකව කළමනාකරණ පදනම් පිළිබඳ පාඨමාලා සිට සමෝධානිත අධ්‍යයන දක්වාත්, ඉන් අනතුරුව වරණිත පාඨමාලා සහ පර්යේෂණ ව්‍යාපෘතියක් දක්වා ගමන් කරයි. දේශීය හා ජාත්‍යන්තර ප්‍රතීතන ආයතන විසින් සකස් කරන ලද තත්ත්ව ප්‍රමිතීන් සහ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

### රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MPA)

1988 දී රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය හඳුන්වාදීමෙන් අනතුරුව, දශක තුනකට අධික කාලයක් පුරා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සිය ඉගෙනුම් හවුල්කරුවන් රාජ්‍ය අංශයේ ඉහළම තනතුරු කරා ළඟා වූ ආකාරය සහ පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු ඔවුන්ගේ සිහින සැබෑ කර ගත් ආකාරය පිළිබඳ අභිමානයෙන් යුක්තව සාක්ෂි දරයි.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව, ඉගෙනුම් හවුල්කරුවන්ගේ වෘත්තීය ගමන් මාර්ගය අමාත්‍යාංශ ලේකම්වරුන් සහ අතිරේක ලේකම්වරුන් වැනි ඉහළ මට්ටම් දක්වා පරිවර්තනය කරයි. ලේකම්වරුන්, කොමසාරිස් ජනරාල්වරුන්, අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යනාදී වශයෙන් ඉහළ තනතුරු දරන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරන ලද ආදි විද්‍යාර්ථීන්, මෙම ආයතනය විසින් සිය රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හරහා මෙතෙක් බිහි කර ඇති රාජ්‍ය අංශයේ ඉහළ නිලධාරීන්ගේ කුසලතාවයට ප්‍රමාණවත් සාක්ෂි සපයයි. මෙම පාඨමාලාව අතරතුර ඉගෙනුම් හවුල්කරුවන්ට ලැබෙන සමස්ත ප්‍රතිලාභ වනුයේ අදාළ විෂයයන් පිළිබඳ ලැබෙන උසස් දැනුම පමණක් නොව, රාජ්‍ය අංශයට වඩාත් අවශ්‍ය යහපත් සන්නිවේදනය, තීරණ ගැනීමේ හැකියාව, හොඳ විශ්ලේෂණාත්මක කුසලතා, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ ආචාර ධර්ම සහ පාලනය සඳහා ඔවුන් ඉතා හොඳින් ඔප් නැංවීමයි. මෑතකදී නැවත සැලසුම් කරන ලද කරන ලද රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා විෂය නිර්දේශය රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරන ලද අප ආදි විද්‍යාර්ථීන්ගෙන් ලද ප්‍රතිපෝෂණවල ප්‍රතිඵලයකි.

## ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධිය (EMBA)

2016 දී ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධිය හඳුන්වා දීමේ සිට අපගේ ඉගෙනුම් හවුල්කරුවන් ආයතනික ලෝකයේ ඉහළම තනතුරු කරා ළඟා වන ආකාරය සහ වැඩසටහන සාර්ථකව නිම කිරීමෙන් පසු ඔවුන්ගේ සිහින සැබෑ කර ගන්නා ආකාරය පිළිබඳව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය අභිමානයෙන් යුක්තව සාක්ෂි දරයි.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධි පාඨමාලාව ඉගෙනුම් හවුල්කරුවන්ගේ වෘත්තීය ගමන් පථය ආයතනික කළමනාකරණ මණ්ඩලය දක්වා සහ ඉන් ඔබ්බට පරිවර්තනය කරයි. මෙම පාඨමාලාව වසරක කාලයක් පුරා විහිදෙන අතර ඉගෙනුම් හවුල්කරුවන්ට දැනුම ලබා දීම සඳහා වැඩමුළු, සිද්ධි අධ්‍යයන, සාකච්ඡා, වීඩියෝ ඉදිරිපත් කිරීම් සහ වෙනත් ආකාරයේ දැනුම ලබා දීමේ ක්‍රම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි.

## අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPAEM)

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය යනු හුදෙක් රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධියක් තිබීම පමණක්ම නොවේ. එය අධ්‍යාපන කළමනාකරණයේ ප්‍රවීණත්වය ලබා ගනිමින් අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිධරයෙකු බවට පත්වීමයි. අධ්‍යාපන-වෘත්තිය තුළ පරිපාලන මට්ටමේ නිලධාරීන්ගේ විස්තීරණ දැනුම් අවශ්‍යතා පිළිබඳ අවශ්‍යතා-විශ්ලේෂණයක් මත පදනම්ව එය ප්‍රවේශමෙන් සැලසුම් කර ව්‍යුහගත කර ඇත. තවද, එය අපගේ ඉගෙනුම් හවුල්කරුවන්ට අධ්‍යාපන කළමනාකරණ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයක් ලබා ගැනීමට දේශීය හැඟීමක් සමඟ ගෝලීය මානසිකත්වයක් වර්ධනය කිරීමට උපකාර කිරීම සඳහා නව්‍ය පාඨමාලා පිරිනැමුම් ක්‍රමයක් අනුගමනය කරයි. මෙය කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යාපන පාඨමාලා ලැයිස්තුවට නව එකතු කිරීමකි.

## බදුකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBAT)

බදුකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBAT) 2015 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර මෙය අපගේ ඉගෙනුම් හවුල්කරුන්ගේ විශේෂ අවශ්‍යතා මත සැලසුම් කළ පාඨමාලා (signature programmes ) පෙළ සඳහා එක් කරන ලද්දකි. සත්‍ය වශයෙන්ම, එය දකුණු ආසියාවේ බදුකරණය පිළිබඳ පළමු විශේෂීකරණ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාව විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරීන් කණ්ඩායම් හයක පුහුණුව සාර්ථකව අවසන් කර ඇති අපි එහි හත්වන නිලධාරීන් කණ්ඩායම මේ වන විට පුහුණු කරමින් සිටිමු. එවැනි පාඨමාලාවක් දියත් කිරීමේ මූලික අරමුණ වූයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කළමනාකාරිත්ව හැකියාවන් වැඩිදියුණු කිරීම සහ එම දෙපාර්තමේන්තුව ජාතියේ බදු ආදායම සඳහා වඩාත් ඵලදායී දායකයෙකු බවට පත් කිරීමයි.

## රේගු සහ ජාත්‍යන්තර වෙළඳාම සහ සැපයුම් පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBACIT)

ආයතනය, සිය විශේෂ අවශ්‍යතා මත සැලසුම් කළ පාඨමාලා (signature programmes ) සඳහා විවිධත්වයක් සහ පුළුල් පදනමක් සැපයීමට දරන ප්‍රයත්නය තුළ, 2016 දී රේගු සහ ජාත්‍යන්තර වෙළඳාම සහ සැපයුම් පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBACIT) සිය පශ්චාත් උපාධි පාඨමාලා පෙළ සඳහා එක් කරන ලදී. .MBACIT පාඨමාලාවේ අරමුණ වනුයේ රාජ්‍ය ආදායම් එකතු කිරීමේ සහ සමාජ ආරක්ෂණ නීති ශක්තිමත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා රේගුවේ (SLC) නිලධාරීන්ගේ කළමනාකරණ හැකියාවන් ඉහළ නැංවීමයි. තවද, මෙම සුදුසුකම් ශ්‍රී ලංකා රේගුවේ එම නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍යතාවයක් ලෙස ක්‍රියා කරනු ඇත. MBA CIT හි තුන්වන කණ්ඩායම 2021 හි ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද අතර ඔවුන්ගේ දෙවන වසර අධ්‍යාපන කටයුතු 2022 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

## වර්ෂය තුළ ශිෂ්‍ය ලියාපදිංචිය

2022 වසර තුළ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය වගුව 01 හි දක්වා ඇත.

**වගුව** 01: 2022 **වර්ෂය තුළ ශිෂ්‍ය ලියාපදිංචිය**

| **පාඨමාලාව** | **සංඛ්‍යාව** |
|---|---|
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MBA) | 410 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධිය (EMBA) | 31 |
| බදුකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBAT) | 78 |
| අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPAEM) | 137 |
| එකතුව | 656 |

*මූලාශ්‍රය* : කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ දත්ත ගබඩාව

## වර්ෂය තුළ පශ්චාත් උපාධිධාරී නිමැවුම

අධ්‍යයන පාඨමාලා සාර්ථකව සහ නියමිත කාලසටහනට අනුව පවත්වන ලදී. වර්ෂය තුළ ආචාර්ය, පශ්චාත් උපාධි සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා අවශ්‍යතා සම්පූර්ණ කළ පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව 02 වගුවේ දක්වා ඇත.

**වගුව** 02: 2022 **වර්ෂය තුළ පශ්චාත් උපාධිධාරී නිමැවුම**

| **පාඨමාලාව** | **සංඛ්‍යාව** |
|---|---|
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය | 1 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය | 577 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධිය | 20 |
| බදුකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය | 54 |
| කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 11 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 03 |
| මුළු උපාධිධාරීන් සංඛ්‍යාව | 666 |

*මූලාශ්‍රය :* කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ දත්ත ගබඩාව



ආයතනයේ *2023-2025* උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා නේවාසික වැඩමුළුව




## වාර්ෂික පීඨ විවේකය (*Retreat*)

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පීඨ විවේකයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ වැඩිදියුණු කිරීම් සිදුකිරීමේ සහ වර්තමාන සහ අනාගත ඉල්ලීම් සපුරාලීමට සහ ආයතනය සඳහා වැඩි සාර්ථකත්වයක් අත්කර ගැනීමට නැවත ස්ථානගත කිරීමේ අරමුණ ඇතිව ආයතනයේ සියලුම ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වය පිළිබඳව විචාරවත් ලෙස සිතා බැලීම සහ වැඩිදියුණු කිරීම් සිදුකිරීමයි. ඇත්ත වශයෙන්ම, වටිනා පීඨ විවේකයක් ශාස්ත්‍රීය ප්‍රජාවට නව ජීවයක් ලබා දිය හැකිය. මනාව සංවිධානය කළ විවේකයක අන්තර්ගතය ආයතනයේ අනන්‍යතාවය වර්ධනය කිරීමට දායක විය හැකි අතර, අතීත ආවර්ජනයක් මෙන්ම ඉදිරි ප්‍රගමනය පිළිබඳ පොදු හැඟීමක් ඇති කරවයි. 2022 වර්ෂය සඳහා වාර්ෂිකව පවත්වනු ලබන පීඨ විවේකය රට තුළ පවතින තත්ත්වය හේතුවෙන් කල් දමන ලදී. කෙසේ වෙතත්, මාසික පීඨ රැස්වීම්වලදී අදාළ කරුණු ගැඹුරින් සාකච්ඡා කර, ඒ අනුව ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය විදේශයන්හි පිරිනැමීම

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සෑම විටම කළමනාකරණ අධ්‍යාපනයේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වන අතර එහි පියාපත් ශ්‍රී ලංකාවෙන් ඔබ්බට ද විහිදේ.

ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, ඕමානය, කුවේට්, බහරේන් සහ බංගලාදේශයේ සාර්ථක ලෙස දියත් කිරීම 2015-22 කාලය තුළ ලද සුවිශේෂ ජයග්‍රහණ විය. නුදුරු අනාගතයේ දී අනෙකුත් මැදපෙරදිග රටවලට සහ ආසියානු කලාපයට ද මෙම වෙළෙඳපොළ ව්‍යාප්ත කිරීමට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය කටයුතු කරමින් සිටී. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය යනු ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තම දේශීය පශ්චාත් උපාධි පාඨමාලා විදේශයන්හි පිරිනමන එකම උසස් අධ්‍යාපන ආයතනය වන අතර රටට සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් උත්පාදනය කරයි.



## වසර තුළ ලත් සුවිශේෂ ජයග්‍රහණ (ඉගැන්වීම)

1. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF) සමගාමීව නැගී එන ප්‍රවණතා සහ දැනුමේ නව ක්ෂේත්‍රවලට අනුකූලව සියලුම අධ්‍යයන පාඨමාලාවන්හි විෂයමාලා වැඩිදියුණු කරන ලදී.

2. ආයතනයේ ප්‍රමුඛතම පාඨමාලාව වන ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාව අඛණ්ඩව විකාශනය වන ව්‍යාපාරික අවශ්‍යතා සහ අභියෝග මත පදනම්ව ප්‍රතිනිර්මාණය කර ඇති අතර, හොඳම පන්තියේ විද්වතුන් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් කණ්ඩායමක් මගින් දැනුම ලබා දෙනු ලබයි.

3. එක්සත් අරාබි එමිරේට්ස්, ඕමානය සහ කුවේට් හි දියත් කරන ලද ඒකාබද්ධ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාව (PIM-MBA ) අඛණ්ඩව පවත්වාගෙන යාම.

4. නව අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPAEM) හඳුන්වා දෙන ලදී.

5. බදුකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි (MBAT) පාඨමාලාව සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හත්වැනි කණ්ඩායම බඳවා ගැනීම.

6. රට තුළ පවතින තත්ත්වය හේතුවෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සිසුන් සඳහා මාර්ගගත සැසි සහ නිවසේ සිට සිදු කරන පරීක්ෂණ පුළුල් කිරීම.

7. රට තුළ පවතින තත්ත්වය හේතුවෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සිසුන් සඳහා දෙමුහුන් දේශන සැසි (කොටසක් භෞතිකව සහ කොටසක් මාර්ගගතව) පුළුල් කිරීම.

8. ප්‍රඥා ඉගෙනුම් ද්වාරයෙහි විශේෂාංග භාවිතයෙන් සබැඳි සහ දෙමුහුන් සැසිවල සඵලතාවය පුළුල් කිරීම.

9. Turn-it-in මෘදුකාංගය හරහා සමානතා දර්ශකය වැනි ශාස්ත්‍රීය මාර්ගෝපදේශවලට අඛණ්ඩව අනුගත වීම.

10. අධ්‍යයන පරිපාලනය විධිමත් කිරීම සඳහා ආයතනයේ සියලුම අධ්‍යයන වැඩසටහන් සඳහා අධ්‍යයන සම්බන්ධීකාරකවරුන් පත් කිරීම ඉදිරියට පවත්වාගෙන යාම.

11. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය පිරිනමනු ලබන අධ්‍යයන පාඨමාලාවල ප්‍රගතිය සාකච්ඡා කිරීමට මාසිකව සම්බන්ධීකාරකවරුන්ගේ රැස්වීම් නිසි පරිදි පැවැත්වීම.

12. ආයතනය විසින් පිරිනමනු ලබන සියලුම අධ්‍යාපනික වැඩසටහන් වල ගුණාත්මක බව අධීක්ෂණය සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන මධ්‍යස්ථානයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම.

# පර්යේෂණ සහ ප්‍රකාශන

ශ්‍රී ලංකාවේ කළමනාකරණය පිළිබඳ පර්යේෂණ තවදුරටත් ඉහළ ප්‍රගතියක් අත්පත් කර ගත යුතුව ඇත. අපට තවමත් විෂය ක්ෂේත්‍රය තුළ පර්යේෂණ සම්ප්‍රදායක් වර්ධනය කර ගැනීමට අවශ්‍යව තිබේ. අභියෝගය වන්නේ අපගේ පර්යේෂණ ප්‍රයත්නයන් යොමු කළ යුතු සුසමාදර්ශය සැකසීමයි. අප විසින් ප්‍රත්‍යක්ෂ කරගෙන ඇති පරිදි, පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ වෘත්තියක් ලෙස කළමනාකරණය වඩාත් සඵල කිරීම සඳහා දේශීය හරයක් සෙවීම සඳහා ඉදිරියට යාමයි. මේ සඳහා අපි පර්යේෂණ නිමැවුම්වල ගුණාත්මක භාවය පිළිගත හැකි මට්ටම් දක්වා ඉහළ නැංවිය හැකි පර්යේෂණය සඳහා වූ ක්‍රම සහ තාර්කික ප්‍රවේශයන් කරා පිවිසිය යුතුය.

2022 වර්ෂය තුළ, ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘති 350 කට අධික ප්‍රමාණයක් සම්පූර්ණ කරන ලද අතර, ඒවා ආයතනයේ පුස්තකාලයෙන් දෘඪ ලේඛන ලෙස ලබා ගත හැකිය. පර්යේෂණ ව්‍යාපෘති පර්යේෂණ කාණ්ඩ හයක් අතර ව්‍යාප්ත කරන ලදී: කළමනාකරණ කුසලතා පර්යේෂණ ව්‍යාපෘති, ව්‍යවසායකත්ව කුසලතා පර්යේෂණ ව්‍යාපෘති, කළමනාකරණ ක්ෂේත්‍ර අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘති, කළමනාකරණ සිද්ධි අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘති සහ කළමනාකරණ පර්යේෂණ ව්‍යාපෘති. මෙම ව්‍යාපෘති තුළ ව්‍යවහාරික සහ සමාජ පර්යේෂණ යන දෙවර්ගයම අන්තර්ගතය.

## දර්ශන විශාරද උපාධි වැඩමුළු

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ මධ්‍යස්ථානය දර්ශන විශාරද උපාධි සිසුන් සඳහා පර්යේෂණ සැලසුම් කිරීම සහ සංකල්ප පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ දර්ශන විශාරද උපාධි වැඩමුළු මාලාවක් ආරම්භ කරන ලදී. දර්ශන විශාරද උපාධිය සම්පූර්ණ කිරීම සඳහා සක්‍රීයව නිරත වීමට වැඩි සිසුන් පිරිසක් දිරිමත් කිරීමේ නව මුලපිරීමක් ලෙස අනෙකුත් විශ්වවිද්‍යාලවලින් මෙන්ම කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වෙතින් ද සම්පත් දායකයන්ට ආරාධනා කරන ලදී. මෙම වැඩමුළුවලදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේදයන් මත පදනම් වූ පර්යේෂණ සැලසුම් කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම වැඩමුළුවල පදනම කුඩා කණ්ඩායම් සාකච්ඡා වූ අතර එහිදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රම දෙකටම විශේෂිත වූ ක්‍රමවේදයන් සාකච්ඡා කෙරිණි. සහභාගිවන්නන් පර්යේෂණ සැලසුම්වල විවිධ ප්‍රවේශයන් ඉදිරිපත් කළ අතර, මෙම වැඩමුළු දර්ශන විශාරද උපාධි සිසුන්ගේ කාර්යයේ ප්‍රවේශයන් ප්‍රසාදනය කිරීමට හේතු විය.

## විදේශීය විශ්වවිද්‍යාලවල දර්ශන විශාරද උපාධි සඳහා ස්ථානගත කිරීම්

ජාත්‍යන්තර උසස් උපාධියක් (Ph. D) සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන පර්යේෂණ සිසුන්ට ඒ සඳහා ස්ථානයක් ලබා ගැනීමේ අවස්ථාව ඇත.නමුත්, එය එය භාර ගැනීමේ ධාරිතාව සිසුන්ගේ නිපුණතා මත පමණක් රඳා පවතී. බොහෝ අවස්ථාවන්හිදී, සිසුන්ට පර්යේෂණ ව්‍යාපෘතිවල වැඩ කිරීමට අවශ්‍ය කුසලතා සහ පළපුරුද්ද නොමැති බැවින් ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයක ස්ථානයක් ලබා ගැනීම සාර්ථක නොවනු ඇත. නිබන්ධනය සහ ප්‍රකාශනයක් සමඟ පර්යේෂණ සම්පූර්ණ කරන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ උපාධිධාරීන් අපේක්ෂිත පර්යේෂණ කුසලතා මෙන්ම නොපසුබට උත්සාහය, විනය සහ ශාස්ත්‍රීය ලිවීමේ කුසලතාව ප්‍රදර්ශනය කර ඇත. ඔවුන් ඉතා ඉහළ තරඟකාරී මට්ටමක පවතින ඕස්ට්‍රේලියාව, නවසීලන්තය සහ එක්සත් රාජධානියේ ශ්‍රේණිගත විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශය ලබාගෙන ඇත. මෙම සාර්ථකත්වයන් පර්යේෂණ මගින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පර්යේෂණ පශ්චාත් උපාධිය (MBA)හි ශක්තීන් මනාව පෙන්නුම් කරයි. තවද, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුරා සිටින අනාගත තරුණ විද්වතුන් සඳහා ශාස්ත්‍රීය වෘත්තීය

මාර්ගයක් සපයා ඇත. 2022 දී සිසුන් දෙදෙනෙකු ඕස්ට්‍රේලියාවේ Wollongong විශ්වවිද්‍යාලයේ සහ ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද උපාධි ස්ථාන ලබාගෙන ඇත.

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව (PIMARC)




කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව (PIMARC 2021) පැවැත්වුණේ 2022 නොවැම්බර් මාසයේදීය. මෙම සම්මන්ත්‍රණය මහාචාර්ය අජන්ත එස්. ධර්මසිරි සහ ආචාර්ය නිලක්ෂි ගලහිටියාවේ යන මහත්ම මහත්මීන් විසින් සම සභාපතිත්වය දැරීය. ප්‍රධාන ආරාධිතයා වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතාය. ප්‍රධාන දේශනය ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ මහාචාර්ය අම්රික් සොහාල් මහතා විසින් පවත්වන ලදී. ගෞරවනීය ආරාධිතයා වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ මහාචාර්ය එම් එම් පද්මලාල් මහතාය.

සමුළුවට ප්‍රධාන ධාරාවන් තුනක් තිබුණි; ආචාර්ය උපාධි අධ්‍යයන සම්මේලනය; පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ කර්මාන්ත හා සබැඳි සංවාදයක්. ආචාර්ය උපාධි අධ්‍යයන සම්මේලනයේ දී පත්‍රිකා හයක් ඉදිරිපත් කරන ලදී. මෙම පත්‍රිකා මගින් රාජ්‍ය පර්යේෂණ ආයතන තුළ දැනුම ගවේෂණය සහ සූරාකෑම, “Ride-Hailing” හි නියැළී සිටින නොබැඳි (Gig) කම්කරුවන් සඳහා කාර්යයේ අර්ථය ගවේෂණය කිරීම, , සේවකයින්ගේ නව්‍ය රැකියා කාර්ය සාධනය මත ඉහළ කාර්ය සාධන මානව සම්පත් පරිචයන් වල සිරස් සහ තිරස් යෝග්‍යතාව පෙළගැස්වීමේ බලපෑම, දැනුම සක්‍රීය කිරීම, කළමනාකරුවන්ගේ කාර්යභාරය සහ ශ්‍රී ලංකාවේ සංවිධානවල ඩිජිටල් පරිවර්තනය තුළ දැනුම පරිවර්තනය සඳහා ඩිජිටල් තාක්ෂණයේ බලපෑම, මූල්‍ය වංචා සහ සංජානන ධනවාදයේ පරස්පරතා සංකල්පගත කිරීම සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ විමර්ශනය කරන ලදී.

PIMARC 2022 මගින් වර්ෂය තුළ සිදු කරන ලද සමාජ පර්යේෂණ ව්‍යාපෘති මත පදනම්ව පර්යේෂණ පත්‍රිකා දහයක් ඉදිරිපත් කරන ලදී. අධ්‍යයනයන් තේමා කිහිපයක් මත පදනම් විය. ධාරාව 1 හි දී , පත්‍රිකා "Store Environment and Store Patronage Intention; Influence of Sustainable Supply Chain Initiatives Towards Environmental Performance", "Personality Factors as Antecedents to Perceived Financial Well-Being", "The Role of Entrepreneurial Bricolage on Innovation Self-Efficacy and Innovation Performance in Sri Lankan SMEs", "Psychological Contract Violation on Turnover Intention" යන මාතෘකා කෙරෙහි අවධානය යොමු කරන ලදී. ධාරාව දෙකෙහි පත්‍රිකා "The Impact of Telecommuting on Work – Family Balance", "The Effect of Motivation on the Intention to Use Mobile Payments", "Reverse Mentoring and Work Engagement, "Destination Personality, Self-Congruity, and Destination Psychological Ownership on Revisit Intention" සහ "The Impact of Intellectual Capital on Exploratory Innovation Activities" යන මාතෘකා කෙරෙහි අවධානය යොමු කරන ලදී..

මගින් ව්‍යවසායකත්ව කුසලතා, කළමනාකරණ කුසලතා සහ ගැටළු විසඳීම කෙරෙහි අවධානය යොමු කළ කළමනාකරණ ක්ෂේත්‍ර අධ්‍යයන ව්‍යාපෘති යන ක්ෂේත්‍රවල ව්‍යවහාරික පර්යේෂණ ව්‍යාපෘති ඉස්මතු කරන ලදී. ව්‍යවසායකත්ව පර්යේෂණ ව්‍යාපෘති මගින් "Gekcolabs: A Marketplace Education Platform for Students and Teachers to Interact and ACE Acumen Business Process Outsourcing". ගැටළු විසඳීමේ යෙදුම හරහා කළමනාකරණ ක්ෂේත්‍ර අධ්‍යයන ව්‍යාපෘති ව්‍යාපාරවල ප්‍රධාන ගැටළු මතු කරන ලදී; "Reduction of Bonded Nurse Turnover at the DNS Hospital, Sri Lanka"; "Reduction of Machinery Downtimes in the Finishing Department at Teejay Lanka PLC"; "Sustained Performance through Entrepreneurial Leadership - Rajarata Hotels Ltd. Case Study" සහ "The Success Story of SMS Holding".

PIMARC 2022 යනු කර්මාන්ත පිළිබඳ සංවාදයක් (Industry Dialogue) වූ නමුත් එය සාමාන්‍ය ගැටලු අවධානයට ලක්වන වෙනත් කාර්මික සංසදයකට වඩා වෙනස් ය. මෙහිදී අප අදහස් කරන්නේ, පුළුල් ප්‍රජාවක අභිවෘද්ධිය සඳහා මූල් පර්යේෂණ දැනුම ප්‍රායෝගිකව පරිවර්තනය කිරීමයි. පත්‍රිකා හතරක් ඉදිරිපත් කරන ලදී.; "Establishing a Business to Provide Employee Performance Management Systems to IT Companies"; "Reducing Delays in the Budget Control Reporting Process at XYZ Company"; "Receiving Foreign Nationalities for Ship Repairing Projects during Pandemics" සහ "Integrated Thinking of the CEO, Transformation and Improved Systemic Performance: Case in Sri Lanka"

Mastercard හි අධ්‍යක්ෂ මහේෂා අමරසූරිය මහත්මිය සහ PBSS සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී අංජනා විජේසිංහ මහත්මිය විසින් විද්වත් කථිකාවක් පවත්වන ලදී. මහාචාර්ය අජන්ත එස්. ධර්මසිරි විසින් මෙහෙයවන ලද පත්‍රිකා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි සභාපති සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධීකාරක අසංග රණසිංහ මහතා, Ceylon Oxygen හි කළමනාකාර අධ්‍යක්ෂ සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංසදයේ (PIM Alumni) සභාපතිනි ශිරන්ති තෙවරප්පෙරුම මහත්මිය විසින් සමාලෝචනය කරන ලදී.

## IC **දායකත්වය සහ** H **දර්ශකය**

ශ්‍රේණිගත සහ සම-සමාලෝචනය (peer reviewed) කරන ලද සඟරාවල ප්‍රකාශන, සම්මන්ත්‍රණවල ඉදිරිපත් කිරීම් සහ ශ්‍රේණිගත සහ සම-සමාලෝචනය කරන ලද සඟරාවල උපුටා දැක්වීම් තුළින් පීඨයේ IC දායකත්වය අනාවරණය විය. 2022 කාලය තුළ, පීඨය ශ්‍රේණිගත/සමාලෝචනය කරන ලද සඟරාවල පත්‍රිකා 24ක් ප්‍රකාශයට පත් කරන ලද අතර සම්මන්ත්‍රණ පත්‍රිකා 24ක් ඉදිරිපත් කරන ලදී. පීඨය විසින් ශ්‍රේණිගත කරන ලද සඟරාවල වර්ෂය තුළ ඔවුන්ගේ කාර්යයන් පිළිබඳ උපුටා දැක්වීම් 28 ක් තිබුණි. පර්යේෂණ දායකත්වයේ ප්‍රතිඵලයක් ලෙස, සියලුම ප්‍රධාන පීඨ සාමාජිකයින්ට

2ක් හෝ ඊට වැඩි H දර්ශක තිබූ අතර පීඨයේ සාමාජිකයින් දෙදෙනෙකුට ඉහළ H දර්ශකයක් සහ I දහයේ දර්ශකය අටට වඩා වැඩි විය.

## පර්යේෂණ උපදේශක කමිටුව (RAC)

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පර්යේෂණ උපදේශක කමිටුවක් 2022 දී ආරම්භ කරන ලදී. පර්යේෂණ උපදේශක කමිටුව (RAC) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිපත්ති සහ රාමුව සමඟ සමපාත විය. 2022 දී පීඨ සාමාජිකයින් හතර දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ ව්‍යාපෘති පහක් සිදු කිරීම සඳහා රුපියල් 1,200,000 ක පර්යේෂණ ප්‍රදානයන් ප්‍රදානය කරන ලදී. සෑම පර්යේෂණ ව්‍යාපෘතියක්ම එක් සාමාජිකයෙකුට රුපියල් 350,000.000කට සීමා වූ අතර ඒවා ප්‍රධාන පීඨ සාමාජිකයින්ට ලබා දෙන ලදී. වෙනත් විශ්වවිද්‍යාල සමඟ ජාලකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා, ප්‍රධාන පීඨ සාමාජිකයෙකුට වෙනත් විශ්වවිද්‍යාලවල සම-විමර්ශකයින් සමඟ පර්යේෂණ ව්‍යාපෘති කරගෙන යා හැක.

## ප්‍රකාශන අංශය - දළ විශ්ලේෂණය

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, කළමනාකරණ අධ්‍යාපන මට්ටම තුළට පැමිණ, අනෙකුත් දෑ අතර සමාජයට ප්‍රධාන ආකාර තුනකින් බලපෑම් කරයි, එනම්,

i). ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බන්ධ වීම,

ii). සංසද නිර්මාණය කිරීම සහ අලුතින් සොයාගත් දැනුම අනාවරණය කර ගැනීමට උපකාර කිරීම

iii). මෙම අලුතින් සොයාගත් දැනුම සුරැකීමට සහ සුදුසු පරිශීලකයින් අතර එවැනි දැනුම බෙදා හැරීමට උපකාර වන ප්‍රකාශන.

ප්‍රකාශන, නිසැකවම, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි බලපෑම් සැලැස්මේ ප්‍රධාන අංගයකි. මනාව පෙළ ගස්වා රචනා කර ඇති ප්‍රකාශන, වැදගත් සොයා ගැනීම් ඉලක්කගත ප්‍රේක්ෂකයා වෙත සම්ප්‍රේෂණය කිරීමටත් ආයතනයේ අඛණ්ඩ පර්යේෂණ වැඩිදියුණු කිරීම සහ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ බොහෝ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමටත් උපකාරී වේ. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ප්‍රකාශන අංශය එහි ප්‍රධානතම ප්‍රකාශන වන “Sri Lankan Journal of Management” සහ “Professional Manager” ඇතුළු ආයතනය විසින් ආරම්භ කරන ලද සියලුම ලේඛන ප්‍රකාශයට පත් කිරීමෙන් ආයතනයේ දායකත්වයේ අඛණ්ඩතාව පිළිබඳ නොමැකෙන දිය සලකුණක් ලෙස සේවය කරයි

තවද, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි පාඨමාලා රැස පුළුල් කිරීමේ ප්‍රයත්නයේ දී අඛණ්ඩව පවත්වනු ලබන MBA, MPA, EMBA, PhD, DBA සහ අනෙකුත් පාඨමාලා සඳහා සහ අලුතින් හඳුන්වා දෙන පාඨමාලා සඳහා පීඨය විසින් ආරම්භ කරන ලද පෙළපොත් සහ අනෙකුත් කියවීම් ද්‍රව්‍ය ප්‍රකාශනය කිරීමට මෙම අංශය සහාය වේ.

නිවැරදිව කිවහොත්, මෙම අංශය ආයතනයේ ව්‍යුහගත කිරීම, සැලසුම් කිරීම, සංස්කරණය කිරීම මෙන්ම පිරිසැලසුම් සකස් කිරීම සහ ඩෙස්ක්ටොප් ප්‍රකාශනය සඳහා විශේෂඥ දැනුමකින් යුක්ත වේ.


ඉහත සඳහන් කළ මූලික කාර්යයන්ට අමතරව, ප්‍රකාශන අංශයට ඉහළම නිපුණතා මට්ටමින් ඒවා ඉටු කිරීමට හැකියාව සහ විශේෂත්වය ඇති බැවින් පහත සඳහන් ප්‍රධාන අවශ්‍යතා ද සපුරාලයි.

i). කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ කුසලතා සහ නිපුණතා වැඩිදියුණු කිරීමට සහ ඔවුන්ගේ දැනුම පුළුල් කිරීමට ප්‍රධාන දායකත්වයක් ලෙස සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම,

ii). 5S සහ ඵලදායිතාව වැනි සංකල්ප හරහා සියුම්, පිරිසිදු හා වඩා ඵලදායී පරිපාලන සැකසුමක් ප්‍රවර්ධනය කිරීම.

iii). විශේෂ ලිපි, වෙබ් වාර්තා සහ පුවත්පත් නිවේදන සංස්කරණය කිරීම

## 2022 **දී සම්පූර්ණ කරන ලද ප්‍රකාශන**



සම්පූර්ණ කරන ලද ප්‍රකාශන අතුරින්, “Sri Lankan Journal of Management (SLJM)”, සහ “The Professional Manager” යන ප්‍රමුඛතම සඟරා දෙක ප්‍රකාශයට පත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

### Sri Lankan Journal of Management (SLJM)

SLJM, 1996 දී දියත් කරන ලද ආයතනයේ කාර්තුමය සඟරාව, ප්‍රකාශනය සහ සාකච්ඡා සඳහා සංසදයක් අඛණ්ඩව සපයයි. SLJM හි “bumper” කලාප දෙකක් 2022 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලදී. SLJM හි මූලික අරමුණ වන්නේ කළමනාකරණයේ අදාළ ගැටළු විසඳීමට සහ පීඨයේ සහ සිසුන්ගේ විශිෂ්ට පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රතිඵල බෙදා හැරීම සඳහා මාධ්‍යයක් සැපයීමයි. ප්‍රකාශනය සඳහා ඔවුන්ගේ දායකත්වය ද දක්වන ලෙස ක්ෂේත්‍රයේ නියැලී සිටින පුද්ගලයන්ට ද ආරාධනා කෙරේ. SLJM හි කලාප දෙකක් 2022 දී ප්‍රකාශයට පත් කරන ලදී.

### The Professional Manager

SLJM ට අමතරව, මෙම ද්විවාර්ෂික සඟරාව නවීන කළමනාකරුවන්ගේ නැගී එන අවශ්‍යතා සපුරාලීම සඳහා දියත් කරන ලදී. එය විශේෂිත ක්‍රියාකාරී නැඹුරුවකින් තොරව, පහසුවෙන් තේරුම් ගත හැකි ශෛලියකින් අති නවීන කළමනාකරණ දැනුම ව්‍යාප්ත කරයි. සංකීර්ණ සහ කැලඹිලි සහිත පරිසරයක ක්‍රියාත්මක වන වර්තමාන කළමනාකරුවන් සඳහා කාලීන සහ වැදගත් වන ගැටලු The Professional Manager හි අවධාරණය කෙරේ. සඟරාවේ කලාප දෙකක් 2022 දී ප්‍රකාශයට පත් කරන ලදී.

## 2022 **දී සම්පූර්ණ කරන ලද අනෙකුත් ප්‍රධාන ප්‍රකාශන**

PIMARC, PIM වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2022, 2022-2023 MBA පාඨමාලා අත්පොත, 2022-2023 MPA පාඨමාලා අත්පොත, MPA-EM පාඨමාලා අත්පොත, PGDip (Mgmt) පාඨමාලා අත්පොත, 2023-2026 DBA පාඨමාලා අත්පොත, විධායක ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි අත්පොත, ශිෂ්‍ය අත්පොත 2022-2023, සහ උපාධි ප්‍රදානෝත්සව පොත 2022

## පුවත්පත් නිවේදන

වසර තුළ ආයතනය විසින් පවත්වන ලද විවිධ අධ්‍යාපනික සහ වෘත්තීය සිදුවීම් සම්බන්ධයෙන් ප්‍රවෘත්ති ලිපි 30 කට අධික ප්‍රමාණයක් දේශීය පුවත්පත්වල පළ විය.

## 2022 **වර්ෂය තුළ සැලකිය යුතු ජයග්‍රහණ (පර්යේෂණ)**

1. 2022 දී, ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘති 350කට අධික ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇති අතර, ඒවා ආයතනයෙහි පුස්තකාලයේ දෘඪ-බැඳි ලේඛන ලෙස ලබා ගත හැකිය.
2. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ මධ්‍යස්ථානය ආචාර්ය උපාධි සිසුන් සඳහා පර්යේෂණ සැලසුම් කිරීම සහ සංකල්ප පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ ආචාර්ය උපාධි වැඩමුළු මාලාවක් ආරම්භ කරන ලදී.
3. 2022 හි, සිසුහු දෙදෙනෙක් ඕස්ට්‍රේලියාවේ Wollongon විශ්වවිද්‍යාලයේ සහ ඕස්ට්‍රේලියාවේ ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි ස්ථාන ලබා ගත්හ.

4. PIMARC 2022 වර්ෂය තුළ සිදු කරන ලද සමාජ පර්යේෂණ ව්‍යාපෘති මත පදනම්ව පර්යේෂණ පත්‍රිකා දහයක් ඉදිරිපත් කරන ලදී.

5. PIMARC 2022 ව්‍යවසායකත්ව කුසලතා, කළමනාකරණ කුසලතා සහ ගැටළු විසඳීම කෙරෙහි අවධානය යොමු කළ කළමනාකරණ ක්ෂේත්‍ර අධ්‍යයන ව්‍යාපෘති යන ක්ෂේත්‍රවල ව්‍යවහාරික පර්යේෂණ ව්‍යාපෘති ඇතුළත් විය.

6. 2022 තුළ, පීඨය ශ්‍රේණිගත කරන ලද / සමකාලීන සමාලෝචනය කරන ලද (peer reviewed) සඟරාවල පත්‍රිකා 24 ක් ප්‍රකාශයට පත් කරන ලද අතර සම්මන්ත්‍රණ පත්‍රිකා 24 ක් ඉදිරිපත් කරන ලදී.

7. ශ්‍රේණිගත කරන ලද ජර්නලවල වසර තුළ පීඨයට ඔවුන්ගේ කාර්යයන් පිළිබඳ උපුටා දැක්වීම් 28 ක් තිබුණි.

8. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි පර්යේෂණ කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පර්යේෂණ උපදේශක කමිටුවක් 2022 දී ආරම්භ කරන ලදී.

9. 2022 දී පීඨ සාමාජිකයින් හතර දෙනෙකු විසින් සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති පහක් සිදු කිරීම සඳහා රුපියල් 1,200,000ක් වටිනා පර්යේෂණ ප්‍රදානයන් ලබා දෙන ලදී.

10. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ප්‍රකාශන අංශය එහි ප්‍රධානතම ප්‍රකාශන දෙක වන Sri Lankan Journal of Management සහ The Professional Manager ඇතුළුව ආයතනය විසින් ආරම්භ කරන ලද සියලුම ලේඛන ප්‍රකාශයට පත් කිරීමෙන් ආයතනයේ දායකත්වයේ අඛණ්ඩතාව පිළිබඳ නොමැකෙන දිය සලකුණක් ලෙස සේවය කරයි.

11. Sri Lankan Journal of Management (SLJM) සඳහා EBSCO මගින් දිගටම සත්කාරකත්වය දරයි.

12. SLJM හි “Bumpur” නිකුතු දෙකක් 2022 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලදී.

13. “The Professional Manager” ප්‍රකාශනයේ නිකුතු දෙකක්, 2022 තුළ ප්‍රකාශයට පත් කරන ලදී.

14. එක් ආචාර්ය උපාධිධාරියෙක් ඔහුගේ අවසාන නිබන්ධනය සම්පූර්ණ කළේය.

15. ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි අවසන් වසර සිසුන් විසින් පවත්වනු ලබන කාර්මික සමීක්ෂණ මත පදනම් වූ Monographs හඳුන්වාදීම.

16. වසර තුළ ආයතනය විසින් පවත්වන ලද විවිධ අධ්‍යාපනික සහ වෘත්තීයමය සිදුවීම් සම්බන්ධයෙන් දේශීය පුවත්පත්වල ප්‍රවෘත්ති ලිපි 30 කට අධික ප්‍රමාණයක් පළ කරන ලදී.

17. ආයතනයේ වෙබ් අඩවියට නව විද්‍යාර්ථීන්ගේ සංචිතයක් ((Digital Repository) එක් කරන ලදී.

# හවුල්කාරීත්වය

## කර්මාන්ත සබඳතා හා උපදේශනය

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, කළමනාකරණ මණ්ඩලයේ සහ අධ්‍යයන මණ්ඩලවල සහ අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන පීඨ සාමාජිකයින්ගේ සාමාජිකත්වය/සහභාගීත්වය සමාන ආයතනික විධිවිධානවල නියෝජනය තුළින් කර්මාන්තය, වාණිජ්‍යය කටයුතු සහ රජය සමඟ විධිමත් සම්බන්ධතා පවත්වනු ලබයි. පාඨමාලා න්‍යායාත්මක අධ්‍යයන කටයුතුවලදී සහ පර්යේෂණවලදී හොඳින් කටයුතු කරන සිසුන් සඳහා සම්මාන ගණනාවක් වෙන් කර ඇත. ඒවායින් සමහරක් ආයතනයට පිරිනමන ආධාර සහ ත්‍යාගයන් වේ.

ප්‍රතිපත්තිමය කරුණක් ලෙස, ප්‍රායෝගික කළමනාකරණ ගැටලුවලට නිරාවරණය වීම තුළින් පීඨ ඉගැන්වීමේ අන්තර්ගතය සහ කුසලතා වැඩිදියුණු කිරීමට ඉඩ සලසන කළමනාකරණ උපදේශන පැවරුම් ආයතනය භාර ගනී. කලකට ඉහත, ආයතනික සැලසුම්කරණය, ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම, රැකියා විශ්ලේෂණය සහ වේතන ප්‍රතිපත්ති, පුහුණුව සහ සංවර්ධනය සහ ආයතනික සංවර්ධනය වැනි ක්ෂේත්‍රවල කළමනාකරණ උපදේශන කිහිපයක් සාර්ථකව නිම කර ඇත. පාරිභෝගිකයින් අතර නිෂ්පාදන, බැංකු, මූල්‍ය, රක්ෂණ, නාගරික සංවර්ධන වැනි සේවාවන්හි නියැලී සිටින රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සහ අගතියට පත් සමාජ කණ්ඩායම්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් විශේෂ සේවාවන් ඇතුළත් විය.

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය - නිව් සවුත්වේල්ස් විශ්වවිද්‍යාලය (PIM – UNSW) අතර හවුල්කාරිත්වය

PIM – UNSW සහයෝගිතා ගිවිසුම යටතේ, වර්ෂය තුළ ලැබුණු නිව් සවුත්වේල්ස් විශ්වවිද්‍යාලයෙන් **ලද** සහයෝගය සඳහන් කළ යුතුමය.. මෙම සහයෝගීත්වය පහත ආකාරයන් ගන්නා ලදී.

අ) ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති හරහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සහ දර්ශන විශාරද උපාධි සිසුන්ගේ අධ්‍යයන හා පර්යේෂණ කුසලතා වර්ධනය කිරීම.

ආ) පර්යේෂණයන්හි සුවිශේෂී දක්ෂතා දක්වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිධාරීන්ට දර්ශන විශාරද උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම.

වසර තුළ ආයතන දෙක අතර සම්බන්ධය සහ සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් විය.

## විදේශීය විශ්වවිද්‍යාල සමඟ හවුල්කාරිත්වය

රටේ රාජ්‍ය අංශයේ තෝරාගත් නිලධාරීන් කණ්ඩායම් සඳහා ජාත්‍යන්තර කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබා දීම සඳහා පහත සඳහන් විදේශීය විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් (MOU) අත්සන් කරන ලදී.

කසෙට්සාර්ට් විශ්වවිද්‍යාලය (Kasetsart), තායිලන්තය

මාස්ට්‍රිච් විශ්වවිද්‍යාලය (Maastricht ), නෙදර්ලන්තය

ෆ්රැන්ක්ෆර්ට් (Frankfurt) විශ්වවිද්‍යාලය, ජර්මනිය

Gadjamada විශ්වවිද්‍යාලය, ඉන්දුනීසියාව

හොංකොං විශ්වවිද්‍යාලය, හොංකොං

ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය, ජපානය

සිඩ්නි විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව

2022 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ වැඩසටහන් රටතුළ පවතින තත්ත්වය හේතුවෙන් 2023 වසරට කල් දමන ලදී.

"Queen Elizabeth" **පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන** (Queen Elizabeth Commonwealth Scholarship Programme)

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව සහ සාමාජිකත්ව සැලැස්ම (CSFP) මගින් අරමුදල් සපයන Queen Elizabeth පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන (QECS) විසින් පිළිගෙන ඇත. මෙමගින් අපේක්ෂකයින්ට පොදුරාජ්‍ය මණ්ඩලයේ අඩු හෝ මධ්‍යම ආදායම් ලබන රටක වසර දෙකක පශ්චාත් උපාධියක් හැදෑරීමට හැකියාව ලැබේ. Queen Elizabeth පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන (QECS) මගින් 2015 වසරේ සිට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා සිසුන්ට සම්පූර්ණයෙන්ම ගෙවන ලද ශිෂ්‍යත්ව 09ක් පිරිනමා ඇත. 2022 වර්ෂයේ දී පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන (QECS) මගින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය හදාරනු පිණිස කෙන්යාවේ එක් සිසුවෙකුට ශිෂ්‍යත්වයක් පිරිනමා ඇත.

## දේශීය ආයතන සමඟ හවුල්කාරිත්වය

වර්ෂය තුළ ආයතනය මඟින් අදාළ ආයතනවල නිලධාරීන් සඳහා විශේෂිත පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමඟ සිය සබඳතා ශක්තිමත් කර ගන්නා ලදී.




***කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් උපායමාර්ගික ආයතනික හවුල්කරුවෙකු ලෙස*** *"Mastercard"* ***ආයතනය සාදරයෙන් පිළිගන්නා ලදී***.

## විධායක සංවර්ධන වැඩසටහන් (EDP)

ව්‍යාපාරික ප්‍රජාවේ වැඩ කරන හවුල්කරුවෙකු වීමට දරන ප්‍රයත්නයන්හිදී ආයතනවල සේවකයින් සඳහා සේවාලාභීන් කේන්ද්‍ර කරගත් පුහුණුවක් පැවැත්වීම සම්බන්ධයෙන් ආයතනයට (PIM) ඇත්තේ අභිමානයකි. ආයතනයේ විධායක සංවර්ධන වැඩසටහන (EDP) එහි ආයතනික ගනුදෙනුකරුවන්ට දිගුකාලීන ස්වභාවයේ දැවැන්ත වටිනාකමක් සපයයි. ආයතනයේ විධායක සංවර්ධන වැඩසටහනේ (EDP) අරමුණ වන්නේ ඔවුන්ගේ ආයතනික ධුරාවලියේ විවිධ මට්ටම්වල ක්‍රියාත්මක වන විවිධ අංශවල විධායකයින්ට අදාළ පුහුණුව සහ සංවර්ධනය ලබා දීමෙන්

ආයතනික කළමනාකරණ පද්ධති සහ භාවිතයන් වැඩිදියුණු කිරීමට උපකාර කිරීමයි. සමස්තයක් වශයෙන්, විධායක සංවර්ධන වැඩසටහන් විවිධ කළමනාකරණ ප්‍රවාහයන් පුරා විහිදෙන නවතම මෙවලම්, ශිල්පීය ක්‍රම සහ කුසලතා සමඟින් සන්නද්ධ වීමට සහභාගිවන්නන්ට උපකාර විය. වසර තුළ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ආයතනික පාරිභෝගිකයින් සඳහා විධායක සංවර්ධන වැඩසටහන් 16ක් සාර්ථකව පවත්වන ලදී.

## වර්ෂය තුළ සැලකිය යුතු ජයග්‍රහණ (හවුල්කාරීත්වය)

1. UNSW සමඟ ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති හරහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන පීඨයේ සහ ආචාර්ය උපාධිධාරීන්ගේ අධ්‍යයන හා පර්යේෂණ කුසලතා වර්ධනය කිරීම.
2. ආයතනික ගනුදෙනුකරුවන් සඳහා විධායක සංවර්ධන වැඩසටහන් දහසයක් (16) පැවැත්වීම.
3. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිය පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව සහ සාමාජිකත්ව සැලැස්ම (CSFP) මගින් අරමුදල් සපයන Queen Elizabeth පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන (QECS) විසින් පිළිගෙන ඇත.
4. 2022 දී, Queen Elizabeth පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන මගින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා කෙන්යාවේ ශිෂ්‍යයෙකුට එක් ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී.
5. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා “Globus simulation”සමඟ විධායක සංවර්ධන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ ප්‍රමාණය වැඩි කිරීම.
6. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයට ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි ශිෂ්‍යත්වයක් පිරිනැමීම.

# තිරසරත්වය

රටේ කළමනාකරණ අධ්‍යාපනයේ ප්‍රමුඛතම ආයතනය වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, රට වෙනුවෙන් සිය කැපවීම් සහ බැඳීම් පිළිබඳව සැමවිටම දැනුවත් ය. එබැවින්, කළමනාකරණ ගැටලු සම්බන්ධයෙන් එහි ප්‍රවේශය තුළ එය අනාගතවාදී විය. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ විශිෂ්ටත්වයේ ප්‍රාසාදයේ ' විශිෂ්ටත්වයේ ස්ථම්භ පහෙන් එකක් ලෙස'තිරසාරත්වය ඇතුළත් වේ.

## තිරසාරත්වයේ ස්ථම්භය පහත සඳහන් උපාය මාර්ග හරහා ක්‍රියාත්මක වේ.

(i) ආයතනයේ කටයුතු වත්මනේ දී හෝ අනාගතයේ දී පරිසරයට හානියක් නොවන පරිදි කරගෙන යාම.

(ii) පරිසරය සහ එහි සම්පත් සංරක්ෂණය කිරීම සඳහා උපරිමයෙන් කටයුතු කරන අතරම ජීවිතයේ ගුණාත්මක භාවය සලසන පරිපාලන පද්ධතියක් නිර්මාණය කිරීම මෙන්ම ඉතා අවශ්‍ය පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා ස්වාභාවික සම්පත් ක්ෂය වීම වළක්වා ගැනීම.

(iii) ශිෂ්‍ය ප්‍රජාව ඇතුළු පාර්ශවකරුවන්ගේ සිත් තුළ තිරසාරභාවය පිළිබඳ සංකල්පය ඇති කිරීම.

(iv) පීඨය සහ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලා සිසුන් විසින් මෙන්ම කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩල සුභසාධක සංගමය විසින් දියත් කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති හරහා තිරසාරභාවය ප්‍රගුණ කිරීම.

(v) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ 5S සංකල්ප භාවිතයන් හරහා හරිත, සිහින් සහ පිරිසිදු වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම.

(vi) සියලුම අභ්‍යන්තර සන්නිවේදනය, ශිෂ්‍ය ප්‍රවේශය, පැවරුම් සහ අවසාන ව්‍යාපෘති සඳහා විද්‍යුත් ලේඛන ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම මගින් කඩදාසි භාවිතය ප්‍රතිස්ථාපනය කිරීම සහ රැහැන් රහිත (WiFi) ජාල පද්ධති සඳහා අනුගත වීම.

## ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘති: පාසල් ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ පරිසරය හා ප්‍රාදේශීය ප්‍රජාව සමඟ පාසල්වල බැඳීම ඇති කරලීම.

ශ්‍රී ලංකාව මේ වනවිට විශේෂයෙන් ඉදිරි වසර පහළොව තුළ පෘථිවිය ආරක්ෂා කරමින් ඔවුන් ජීවිත වැඩිදියුණු කරන ආකාරයට තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) කෙරෙහි අවධානය යොමු කරයි. තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමෙන්, පළාත් පාලන ආයතනවලට ඔවුන්ගේ ප්‍රජාවන් සමඟ හවුල් වී පුරවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කළ හැකි අතර ගෝලීය පරිසරය ආරක්ෂා කිරීමට දායක විය හැකිය. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් තිරසර සංවර්ධන අරමුණු සඳහා සහාය වන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. ආයතනය විසින් එනම් පාසල, පන්සල සහ ප්‍රජාව යන පාද තුන ඒකාබද්ධ කිරීම හරහා ප්‍රජා සංවර්ධනය ආරම්භ කරන ලදී. සෑම වයස් කාණ්ඩයකම පුරවැසියන් සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික කිරීම සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල් ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් දියත් කරන ලදී. මීට අමතරව සෞඛ්‍ය කඳවුරු, පන්සල හා සම්බන්ධ වීම, දහම් පාසල් ප්‍රවර්ධනය, කාබනික පොහොර නිෂ්පාදනය වැනි සංවර්ධන වැඩසටහන් රාශියක්

තුළින් ප්‍රජා සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරන ලදී. 2013 වසරේ ආරම්භ කරන ලද පාසල් ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන මේ වන විට ව්‍යාපෘති 9ක් සම්පූර්ණ කර ඇත.




*කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් ලෝක ප්‍රමිති දිනය සහ ජාතික තත්ත්ව සතිය - 2022 සමරන ලදී.*

## **තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය** (CQAA)

## **කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන** (PIM) **තත්ත්ව ප්‍රතිපත්තිය**

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) ඉගැන්වීම, පර්යේෂණ, උපදේශන සහ අඛණ්ඩ අධ්‍යාපනයේ විශිෂ්ටත්වයේ ගෝලීය ප්‍රමිතීන් අනුගමනය කිරීමට සහ එහි සියලුම මෙහෙයුම් සහ සහාය ක්‍රියාවලීන්හි වගකීමෙන් සිටීමට කැපවී සිටී. ආයතනය පර්යේෂණ, සමාලෝචන, ඇගයීම් සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් තුළින් මේවා සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරයි.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) කැපවී සිටිනුයේ:

- එහි අධ්‍යයන පාඨමාලාවන්හි ගුණාත්මකභාවය සහ විෂය පථය වැඩි දියුණු කිරීම,,
- තත්ත්ව කළමනාකරණ පද්ධතිය අඛණ්ඩව වැඩිදියුණු කිරීම,
- එහි පර්යේෂණ සහ සංවර්ධනය තුළින් උපායමාර්ගික ජාත්‍යන්තර සබඳතා වැඩිදියුණු කිරීම සහ පර්යේෂණ සහ ප්‍රකාශනවල විශිෂ්ටත්වයට පත් වීම,
- කර්මාන්ත, විශ්වවිද්‍යාල සහ වෘත්තිමය සංගම් සමඟ හවුල්කාරිත්වයන් පෝෂණය කිරීම,
- පුහුණු අවස්ථා සහ අනෙකුත් ආධාරක පහසුකම් ලබා දීම මගින් නිපුණත්වයෙන් යුතු සහ පාරිභෝගික කේන්ද්‍රීය කාර්ය මණ්ඩලය සහ පීඨය සංවර්ධනය කිරීම,
- ආයතනයේ පරිපාලන හා මූල්‍යමය ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව සහ සඵලතාවය වැඩි දියුණු කිරීම,
- අදාළ වන සියලුම ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නියාමන අවශ්‍යතා සපුරාලීම සහ

- එහි ක්‍රියාකාරකම් සමාජය සමඟ සම්බන්ධ කිරීමේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස ආයතනික සමාජ වගකීම් ප්‍රවර්ධනය කිරීම.

වර්තමානය වන විට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව අඛණ්ඩව ඉහළ නැංවීමට ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. වත්මන් යුගයේ දී, විශේෂයෙන්ම අධ්‍යාපන සේවා සපයන ආයතන අතර පවතින දැඩි තරඟකාරීත්වය මධ්‍යයේ, වත්මන් සිසුන්, අනාගත සිසුන් සහ සේවා යෝජකයන් ඇතුළු පාර්ශවකරුවන් විසින්, අධ්‍යයන පාඨමාලා තෝරාගැනීමේ දී සහ රැකියා ලබාදීමේදී ආයතන විසින් සපයනු ලබන අධ්‍යාපනයේ ගුණාත්මක භාවය සලකා බලනු ලබයි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි එක් ප්‍රධාන ඉලක්කයක් වන්නේ ඉගෙනීම, පර්යේෂණ, හවුල්කාරීත්වය සහ සංවර්ධනයේ ඉහළම ගුණාත්මකභාවයට ළඟාවීම සහ තිරසාරව පවත්වාගෙන යාම සඳහා එහි අධ්‍යයන පාඨමාලාවන්හි ගුණාත්මකභාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීමයි.

2021 ජූලි මාසයේ දී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි පිහිටුවන ලද තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA), ආයතනයෙහි සියලුම අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලීන් සහ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි. ඊට අමතරව, එය තත්ත්ව සහතිකකරණ සභාව (QAC) සමඟ සම්බන්ධ වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) මෙන්ම ජාත්‍යන්තර ප්‍රතීතන ආයතන මගින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා පිළිගැනීම සහ ප්‍රතීතනය ලබා ගැනීම.

2022 දී, තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය මගින් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය පිළිබඳ මගපෙන්වීම අඛණ්ඩව ලබා දීම, තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර හොඳ භාවිතයන් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ, තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථාන ප්‍රධානී, සියලුම පාඨමාලා සම්බන්ධීකාරකවරුන්, පර්යේෂණ සම්බන්ධීකාරක, ISO සම්බන්ධීකාරක, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, තොරතුරු තාක්ෂණ ජ්‍යෙෂ්ඨ කළමනාකාර සහ සහකාර පුස්තකාලයාධිපති යන අයගෙන් සමන්විත තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කණ්ඩායම 2022 වර්ෂය තුළ සෑම මසකම රැස්වූහ. එම රැස්වීම්වල දී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය තුළ සිදු කරන ලද තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලද අතර, ගුණාත්මය පිළිබඳ අඩුපාඩු හඳුනාගෙන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලදී.

ආරම්භයේ සිට තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය මගින් ප්‍රතිපත්ති 27ක් සකස් කර ඇති අතර, ඉන් 13ක් 2022 දී සංවර්ධනය කරන ලදී. 2022 දී සකස් කරන ලද ප්‍රතිපත්ති පහත පරිදි වේ:

- ප්‍රතිපත්ති අංක 14- MIS ප්‍රවේශ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 15- ශාස්ත්‍රීය ආචාර ධර්ම සහ වගවීම පිළිබඳ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 16- මූල්‍ය සම්පත් ප්‍රතිපාදන ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 17- තොරතුරු උපස්ථ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 18- ශිෂ්‍ය තේරීම් සහ ප්‍රවේශ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 19- අධ්‍යයන ප්‍රතිඵල ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීම

- ප්‍රතිපත්ති අංක 20- පර්යේෂණ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 21- වැඩසටහන් ඇගයීම් ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 22- කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 23. සිසුන්ගේ කාර්යසාධන අධීක්ෂණ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 24. Wistleblowing Policy (මහජන යහපත සඳහා හෙළිදරව් කිරීම)
- ප්‍රතිපත්ති අංක 25. පිළිගැනීම සහ විශිෂ්ටත්තිත්වය සඳහා ත්‍යාග පිරිනැමීම පිළිබඳ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 26. පර්යේෂණ ප්‍රදාන පරිපාලනය පිළිබඳ ප්‍රතිපත්තිය

මෙම ප්‍රතිපත්ති අධ්‍යයන පාඨමාලාවන්හි ගුණාත්මකභාවය සහ ආයතනයේ සමස්ත ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට දායක වේ.

- තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව අධීක්ෂණය කරන අතර පවතින ප්‍රතිපත්තිවලට අවශ්‍ය සංශෝධන සිදු කරයි. ආචාර්යවරුන් දැක්වූ අදහස් සැලකිල්ලට ගනිමින්, 2021 දී සකස් කරන ලද ප්‍රතිපත්ති තුනක් 2022 වර්ෂයේ දී සංශෝධනය කරන ලදී. ඒවා පහත පරිදි වේ:
- ප්‍රතිපත්ති අංක 03. පුස්තකාල ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති අංක 06. ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම් ප්‍රතිපත්තිය.
- ප්‍රතිපත්ති අංක 10. රචනා චෞරත්ව(Plagiarism) ප්‍රතිපත්තිය

2022 වර්ෂයේ දී, තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් නිර්ණායක හතක් යටතේ වි.වි. කො. විසින් හඳුනාගෙන ඇති තත්ත්ව ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනය විසින් පිරිනමනු ලබන වැඩසටහන් ස්වයං-ඇගයුමක් සිදු කිරීම ආරම්භ කරන ලදී:

- වැඩසටහන් කළමනාකරණය
- වැඩසටහන් නිර්මාණය සහ සංවර්ධනය
- මානව සහ භෞතික සම්පත් සහ ඉගෙනුම් සහාය
- ඉගැන්වීම-ඉගෙනීම සහ පර්යේෂණ
- සිසුන් ඇගයීම සහ සුදුසුකම් ප්‍රදානය කිරීම
- වැඩසටහන් ඇගයීම
- නව්‍ය සහ සෞඛ්‍ය සම්පන්න භාවිතයන්

ඉහත නිර්ණායක මත පදනම්ව ස්වයං ඇගයීම් සිදු කරන ක්‍රියාකාරී කණ්ඩායම් හතක් පත් කරන ලද අතර මෙම ක්‍රියාකාරී කණ්ඩායම් සඳහා වගකීම්, යොමු නියමයන් සහ වැඩ කාලසටහන් සකස් කරන ලදී. මෙම ස්වයං තක්සේරුව පාඨමාලාවන්හි ගුණාත්මක භාවය තවදුරටත් ඉහළ නැංවීම සඳහා ආමන්ත්‍රණය කළ යුතු ඇතැම් හිඩැස් හඳුනා ගැනීමට උපකාරී විය.

ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) විසින් ආයතනයේ පීඨ සාමාජිකයින්, පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය පිළිබඳ විවිධ අංශ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වනු ලබයි. 2022 දී එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. ආමන්ත්‍රණය කරන ලද මාතෘකා පහත පරිදි විය:

- මානව සම්පත්, භෞතික සම්පත් සහ ඉගෙනුම් සහාය සඳහා හොඳම භාවිතයන් සහ සම්මතයන්
- පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය සහ රාජ්‍ය පරිපාලන (අධ්‍යාපන කළමනාකරණ) පශ්චාත් උපාධිය යන උපාධි පාඨමාලාවන්හි වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල (PLOs) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) ප්‍රකාරව අදාළ සුදුසුකම් මට්ටම්වල ඉගෙන ගන්නන්ගේ අපේක්ෂිත ගුණාංගවලට සමාන වන පරිදි සංශෝධනය කරන ලදී.

ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලා තුළ හඳුනාගත් වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ උපාධිධාරීන් 448ක් අතර සමීක්ෂණයක් සිදු කරන ලදී. උපාධිධාරීන්ගෙන් 90% කට වඩා වැඩි පිරිසක් පෙන්වා දුන්නේ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාවන්හි සියලුම වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල (PLOs) සාක්ෂාත් කර ඇති බවයි.

පාඨමාලා දළ සටහන් (Course Outlines) ඒවා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන මෙහෙවර හා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව තුළ හඳුනාගෙන ඇති ජාතික වශයෙන් වැදගත් ඉගෙනුම් ප්‍රතිඵල සමඟ පෙළගැසී ඇති බව සහතික කිරීම පිණිස කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන ඉගෙනුම් ද්වාරය වන ප්‍රඥා "Prajna" වෙත උඩුගත කිරීමට පෙර මධ්‍යස්ථානය (CQAA) විසින් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලැබේ.

ප්‍රතීතන ක්‍රියාවලීන්හි වැදගත් වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සඳහා Organogram සහ සන්නිවේදන නාලිකාව සංවර්ධනය කිරීමට මධ්‍යස්ථානය (CQAA) මූලික විය.

මධ්‍යස්ථානය (CQAA) එහි ව්‍යාපාර පරිපාලන ආචාර්ය (DBA) උපාධි පාඨමාලාව සඳහා වි.වි.කො. වෙතින් අනුමැතිය ලබා ගැනීම සඳහා වි.වි.කො. සමඟ සම්බන්ධ විය. මෙම ක්‍රියාවලියේදී, බලධාරීන්ට ඒත්තු ගැන්වීම සඳහා ආචාර්ය උපාධිය සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධිය (MD) වැනි ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි දැනටමත් පවතින 12 මට්ටමේ වැඩසටහන් සමඟ ව්‍යාපාර පරිපාලන ආචාර්ය (DBA) උපාධි පාඨමාලාව සංසන්දනය කිරීම සිදු කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාර පරිපාලන ආචාර්ය (DBA) උපාධි පාඨමාලාව ඉහළම මට්ටමට ඇතුළත් විය. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි සහ අනුමත කිරීමට පෙර වි.වි.කො හි දැඩි ඇගයීම් ක්‍රියාවලියට භාජනය වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම ව්‍යාපාර පරිපාලන ආචාර්ය (DBA) උපාධි පාඨමාලාව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලන ආචාර්ය (DBA) උපාධි පාඨමාලාව බවට පත් වීම.

මධ්‍යස්ථානය (CQAA), පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් පර්යේෂණ ව්‍යාපෘති ඉදිරිපත් කිරීම සහ ඇගයීම සම්බන්ධයෙන් අවශ්‍ය ආකෘති සමාලෝචනය කරන ලදී. පර්යේෂණ යෝජනා පිළිබඳ සමාලෝචකයන්ගේ අදහස් ඉදිරිපත් කිරීමේ ආකෘති, ශිෂ්‍ය ප්‍රකාශය, නිබන්ධනය සඳහා අධීක්ෂකගේ අනුමැතිය සඳහා පිරික්සුම් ලැයිස්තුව, නිබන්ධනය ඉදිරිපත් කිරීම සඳහා අධීක්ෂකගේ අනුමත කිරීමේ පෝරමය, නිබන්ධනය පිළිබඳ පරීක්ෂකගේ වාර්තා, වාචික (viva-voce) පරීක්ෂණයේ ක්‍රියා පටිපාටිය, තහවුරු කිරීමේ පෝරමය මේවාට ඇතුළත් විය. වාචික (viva-voce) පරීක්ෂණයෙන් පසු ලකුණු සහ අවසාන ඉදිරිපත් කිරීමට පෙර අධීක්ෂකවරුන් විසින් එවන ලද පරිච්ඡේද සමාලෝචන වාර්තාව.

පර්යේෂණ සම්බන්ධීකාරක සමඟ එක්ව, මධ්‍යස්ථානය (CQAA) විසින් නිබන්ධන ඇගයීම සහ නිබන්ධන සඳහා වාචික (viva-voce) පරීක්ෂණ පැවැත්වීම සඳහා වන ක්‍රියා පටිපාටිය සංශෝධනය කරන ලදී.

මධ්‍යස්ථානය (CQAA) විසින් පීඨ සාමාජිකයින් සම්බන්ධ සම්‍ය (peer) සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර මෙම ක්‍රියාවලියේදී භාවිතා කළ යුතු ආකෘතිය සකස් කරන ලදී. 2022 දී සම්‍ය (peer) සමාලෝචන තුනක් පවත්වන ලදී. ප්‍රතීතන ආයතනවලට අවශ්‍ය පරිදි තත්ත්ව සහතිකකරණය සඳහා මෙම සම්ය සමාලෝචන තීරණාත්මක සාධකයකි.

තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා ආචාර ධර්ම සහ හැසිරීම ද වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2022 දී, මධ්‍යස්ථානය (CQAA) විසින් පර්යේෂණ අධීක්ෂකවරුන් සඳහා ආචාර්ය ධර්ම මාර්ගෝපදේශ සහ සිසුන්ගේ චර්යාධර්ම සංග්‍රහය සකස් කරන ලදී.

පර්යේෂණ අධීක්ෂණය පිළිබඳ සිසුන්ගේ ප්‍රතිපෝෂණ (feedback) ලබා ගැනීමේ ක්‍රියා පටිපාටියක් හඳුන්වා දුන් අතර එම ප්‍රතිපෝෂණය ලබා ගැනීමේ ආකෘතිය සකස් කරන ලදී.

ඉගෙනීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ආයතනයේ (PIM) ඩිජිටල් ගබඩාව (Digital Repository) සංවර්ධනය කිරීම සහ ආයතනයේ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් සඳහා සිසුන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීමේ අරමුණින් තත්ත්ව සහතිකකරණ වෙබ් පිටුව සංවර්ධනය කිරීම පිළිබඳව මධ්‍යස්ථානය (CQAA) විසින් මාර්ගෝපදේශ සපයන ලදී.

2022 දී, මධ්‍යස්ථානය (CQAA) විසින් එහි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ සම්මතයන් සහ වැඩ බර තීරණය කිරීමේදී භාවිතා කළ යුතු නිර්ණායක සමාලෝචනය කර අවසන් කරන ලදී. ආයතනයේ (PIM) කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද වැඩ බර සහ වැඩ සම්මතයන් සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා පීඨ සාමාජිකයින්ගේ වැඩ බර සහ වැඩ සම්මතයන් ගණනය කරන ලදී.

මධ්‍යස්ථානය (CQAA) අතථ්‍ය (virtual) ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සහ සමානාත්මතා මධ්‍යස්ථානය පිහිටුවීමට සහ මධ්‍යස්ථානයේ ප්‍රධානියා පත් කර ගැනීමට මූලික විය. කෙසේ වෙතත්, ආයතනයේ (PIM) ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සහ සමානාත්මතා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි කිසිවක් 2022 දී වාර්තා වී නොමැත.

- මධ්‍යස්ථානය (CQAA) විසින් එහි ප්‍රකාශන ආයතනයේ (PIM) ප්‍රතිපත්ති සහ සම්මතයන්ට අනුකූල බව සහතික කිරීම සඳහා පූර්ව විගණනය සිදු කරනු ලබයි. 2022 දී, මධ්‍යස්ථානය (CQAA) විසින් පහත ශිෂ්‍ය අත්පොත් සහ යෝජනා පූර්ව විගණනය කර අවසන් කරන ලදී:
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියෙහි ශිෂ්‍ය අත්පොත
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියෙහි (අධ්‍යාපන කළමනාකරණය) ශිෂ්‍ය අත්පොත
- ව්‍යපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධියෙහි ශිෂ්‍ය අත්පොත
- ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර පිළිබඳ පශ්චාත් උපාධි සහතික පත්‍ර වැඩසටහන සඳහා වූ යෝජනාව.

- ව්‍යවසායක සංවර්ධනය සහ ව්‍යවහාරික කාර්මික පර්යේෂණ සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වූ යෝජනාව
- කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය විසින් පිරිනමනු ලබන තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය පිළිබඳ යෝජනාව

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා සඳහා ජාත්‍යන්තර ප්‍රතීතනය ලබා ගැනීමේ අරමුණින්, මධ්‍යස්ථානය (CQAA) ජාත්‍යන්තර ප්‍රතීතන ආයතන දෙකක් සමඟ සම්බන්ධ විය. ඒවා නම්, “Advanced Collegiate Schools of Business (AACSB)” සහ දකුණු ආසියානු සුදුසුකම් පද්ධතිය (SAQS) වේ.

## 1. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව හා අනුකූලත්වය සහතික කිරීම

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි, ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි (රේගු සහ ජාත්‍යන්තර වෙළඳාම) සහ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාවල පාඨමාලා ඉගෙනුම් ප්‍රතිඵල ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට අනුව 10 මට්ටමේ සුදුසුකම්ලාභීන්ගේ අපේක්ෂිත උපලක්ෂණවලට සමාන වන පරිදි සංශෝධනය කරන ලදී.

ශ්රී ලංකා සුදුසුකම් රාමුවේ දක්වා ඇති ඇති ජාතික වශයෙන් වැදගත් ඉගෙනුම් ප්‍රතිඵල සමඟ පාඨමාලා වල අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල සිතියම් ගත වන ආකාරය දැක්වීමට පාඨමාලා දළ සටහන් වල ආකෘතිය සංශෝධනය කරන ලදී.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඉගෙනුම් ද්වාරය වන ප්‍රඥා වෙත උඩුගත කිරීමට පෙර පාඨමාලා දළ සටහන් අඛණ්ඩව නිරීක්ෂණය කරන ලදී.

## 2. සදාචාරාත්මක මාර්ගෝපදේශ සහ ආචාර්යධර්ම සංග්‍රහයන් සකස් කිරීම

පර්යේෂණ අධීක්ෂකවරුන් සඳහා සදාචාරාත්මක මාර්ගෝපදේශ තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද අතර අනුමැතිය සඳහා කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

ශිෂ්‍ය ආචාරධර්ම සංග්‍රහය සකස් කර අනුමැතිය සඳහා කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

## 3. තත්ත්ව සහතිකකරණය සඳහා දායකත්වය වැඩි දියුණු කිරීම

**තත්ත්ව සහතිකකරණය සංවර්ධනය කිරීම**. තත්ත්ව සහතිකකරණය සඳහා වන දායකත්වය ඉහළ නැංවීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරකවරයාගේ රාජකාරි සංශෝධනය කරන ලදී.

පහත ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ රැකියා විස්තර තත්ත්ව සහතිකකරණය සඳහා ඔවුන්ගේ දායකත්වය වැඩිදියුණු කිරීම පිණිස සංශෝධනය කරන ලදී

i. ජ්‍යෙෂ්ඨ කළමනාකරු/තොරතුරු තාක්ෂණය

ii ජ්‍යෙෂ්ඨ කළමනාකරු / ප්‍රකාශන

iii. ජ්‍යෙෂ්ඨ කළමනාකරු / ජාත්‍යන්තර වැඩසටහන්

iv. ජ්‍යෙෂ්ඨ කළමනාකරු / විශේෂ වැඩසටහන්

ඉගෙනීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ආයතනයේ ඩිජිටල් ගබඩාව (Digital Repository) සංවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ සපයන ලදී.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ තත්ත්ව සහතිකකරණ ක්‍රියාකාරකම් සමඟ සිසුන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීමේ අරමුණින් තත්ත්ව සහතිකකරණ වෙබ් පිටුව සංවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ සපයන ලදී.

### **උපාය මාර්ගික සැලැස්ම** 2022-2025

පහත සඳහන් ඉලක්ක සහිතව 2022-2025 සඳහා තත්ත්ව සහතිකකරණ උපායමාර්ගික සැලැස්ම සකස් කරන ලදී. මේ පිළිබඳව පීඨය සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ නිර්දේශය අනුමැතිය සඳහා කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**ඉලක්කය** 1: අධ්‍යයන පාඨමාලා කළමනාකරණය වැඩිදියුණු කිරීම

**ඉලක්කය** 2: පශ්චාත් උපාධි පාඨමාලා සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සවිමත් කිරීම

**ඉලක්කය** 3: ඉගෙනුම ලබන්නන් සඳහා ලබා දෙන සහාය සහ මානව සම්පත් වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම

**ඉලක්කය** 4: ඉගැන්වීමේ, ඉගෙනීමේ සහ තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටිවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම

**ඉලක්කය** 5: අධ්‍යයන සහ සහාය ක්‍රියාකාරකම්වල සෞඛ්‍ය සම්පන්න භාවිතයන් ප්‍රවර්ධනය කිරීම

## **තත්ත්ව සහතිකකරණ ක්‍රියාකාරී සැලැස්ම** 2022 **සංවර්ධනය කිරීම**

2022 -2025 සඳහා තත්ත්ව සහතිකකරණ උපාය මාර්ගික සැලැස්ම මත පදනම්ව, 2022 වසර සඳහා තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර, පීඨය සමඟ සාකච්ඡා කර, අනුමැතිය සඳහා කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

## 2022 **වර්ෂයේ සිදු කරන ලද විශේෂිත** 5S **ක්රියාකාරකම්**

භෞතික පසුබිම සහ සීමාවන්: 2020-2021 වසර දෙක තුළ ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ආයතන අත්විඳින ලද සහ අත්විඳින ලද බාධක, අවහිරතා සහ බාධා කිරීම් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් ද අත්විඳින ලදී. නියමිත කාලයට වඩා පසුගාමී වූ නව ඉදිකිරීමේ දී (wing) ඇති වූ දූවිලි හා අක්‍රමවත් පරිසරය නිසා ආයතනයේ කටයුතු තවදුරටත් අඩපණ විය. එබැවින්, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ 5S ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් වැඩ ඒකකවල 5S මූලික කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ඉතාමත් අවහිරතාවන් මධ්‍යයේ සිදු කරන ලදී.

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර ඉනිකියුබේටරය"Genesis"

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) පුළුල් පරාසයක ව්‍යවසායකත්වය උත්තේජනය කිරීම සහ සහාය දීම අරමුණු කරගත් මුලපිරීම් අතර, එහි ව්‍යාපාර ඉනිකියුබේටරය"Genesis" මූලිකවම ස්ථාපනය කරන ලද්දේ අවසාන ව්‍යාපෘතිය ලෙස ව්‍යවසායකත්ව කුසලතා පර්යේෂණ ව්‍යාපෘතියක් හරහා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ විකල්පය අනුගමනය කරන ආයතනයේ ව්‍යාපර පරිපාලන පශ්චාත් උපාධි සිසුන් සඳහා ය. "Genesis" හි ප්‍රධාන අරමුණ වන්නේ කෙටි කාලීනව ගතහොත් ඔවුන්ගේ ගැටලුවලට විසඳුම් ලබා දීම සහ ව්‍යවසායකත්වය ගොඩනැගීම සඳහා ව්‍යවසායකත්ව ව්‍යාපෘති සඳහා වැඩි වැඩියෙන් සිසුන් සහභාගී කරවා ගැනීම වන අතර දිගු කාලීනව ජාතියේ ආර්ථික වර්ධනයට දායක වීමයි. "Genesis," පර්යේෂණ වලින් පැන නගින නවෝත්පාදන වාණිජකරණය කිරීමේ අරමුණ සඳහා ඔවුන්ගේ විශේෂීකරණය හරහා මූලික පර්යේෂණ සිදු කරන දේශීය විශ්වවිද්‍යාල සමඟ ද හවුල්කාරීත්වයන් ඇති කරගෙන ඇත. මෙසේ විකසනය වෙමින් පවතින ඔවුන්ගේ මාදිලියේ ව්‍යාපෘති සඳහා සහාය වීමට කාර්මික ඉන්කියුබේටර ගණනාවක් සමඟ ද එය සම්බන්ධව ඇත.

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සඳහා AACSB සාමාජිකත්වය

“Association of Advance Collegiate of Business (AACSB)” ඊළඟ පරම්පරාවේ ශ්‍රේෂ්ඨ නායකයන් බිහි කිරීමේ දී අනුගමනය කළ යුතු පොදු ඉලක්කයක් සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපනඥයන්, සිසුන් සහ ව්‍යාපාර සම්බන්ධ කරයි. AACSB සාමාජික සංවිධාන 1600කට අධික සංඛ්‍යාවකට සහ ලොව පුරා පිළිගත් ව්‍යාපාරික පාසල් 800කට ආසන්න සංඛ්‍යාවකට තත්ත්ව සහතිකකරණය, ව්‍යාපාර අධ්‍යාපන බුද්ධිය සහ වෘත්තීය සංවර්ධන සේවා සපයයි. 2016 දී, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සඳහා AACSB හි සාමාජිකත්වය පිරිනමන ලද අතර, ආයතනය නුදුරු අනාගතයේ දී AACSB වෙතින් කීර්තිමත් ප්‍රතීතන තත්ත්වය ලබා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

## සංවර්ධනය සඳහා 5 M රාමුව

ඉදිරි වසරවලදී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ගමන් මගෙහි ප්‍රගමනය සඳහා , මේ වන විටත් අනුගත කරගෙන තිබූ පංචමාන වැඩසටහන (five-dimensional programme), පෙරටත් වඩා සවිමත්ව ඉදිරියට ගෙන යන ලදී. එයට වෙළඳපොළ (Market), සාමාජිකයින් (Members) (පීඨය සහ කාර්ය මණ්ඩලය), උපදේශකයින් (Mentors) ( තනි තනිව උපකාර සහ මගපෙන්වීම සහ ප්‍රතිපෝෂණ සැපයීමට පීඨය මඟින් අනුයුක්ත කර ඇති), නිරීක්ෂකයින් (Monitors) (එක් එක් කණ්ඩායම සඳහා පන්ති නියෝජිතයින් පත් කිරීම) සහ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධීන් ( MBA’s ) (ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිධාරී ආදි විද්‍යාර්ථීන්) හි නිරන්තර සහභාගීත්වය ඇතුළත් විය. අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කරන ලද පීඨ රැස්වීම් සහ රැස්වීම්වල සාකච්ඡා තුළින් මෙම පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීමට අවධාරණය කරන ලදී.

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සඳහා ISO 9001:2015 තත්ත්වය ලබා ගැනීම

ISO 9001:2015 සහතිකය ලබා ගැනීම ඉතිහාසය තුළ අප ලද විශිෂ්ටතම ජයග්‍රහණයක් විය. එය ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම මෙන්ම අධ්‍යාපනික, පරිපාලන සහ මූල්‍ය පරිපාලනය ඇතුළත් ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ වැඩිදියුණු කිරීම් ඇති කිරීමට හේතු වූ බැවින් සහතිකකරණයට තුඩු දුන්

ක්‍රියාවලිය වඩාත් ප්‍රතිලාභදායක විය. ISO 9001:2015 පදනම් වූ තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) දැනට QMS මගින් ආවරණය වන විෂය පථය වැඩි දියුණු කිරීම සමඟ නැවත සහතික කිරීමේ ක්‍රියාවලියට භාජනය වෙමින් පවතී.

## කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා වැඩි දියුණු කළ පහසුකම්

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැගිලි ව්‍යාපෘතිය II අදියර: කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැගිලි සංකීර්ණයේ II අදියර ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාවක් 2012 ජූනි මස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මුළු ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 240 කි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2019 සැප්තැම්බර් 10 වන දින ආරම්භ කරන ලද අතර, ආයතනය විසින් උපයා ගන්නා අරමුදල් සම්පූර්ණ ගොඩනැගිලි ව්‍යාපෘතිය නිම කිරීම සඳහා යොදවනු ඇත. ගොඩනැගිල්ල නිම කළ පසු, ආයතනය මඟින් සිසුන්ට මෙන්ම ආයතනික ප්‍රජාවටද විස්තීරණ සහ පුළුල් සේවාවන් සැපයීමට හැකි වනු ඇත.

## පුස්තකාල පහසුකම් සංවර්ධනය

සහකාර පුස්තකාලයාධිපතිවරයාගේ මඟපෙන්වීම යටතේ පුස්තකාල සහකාරවරුන් තිදෙනෙක් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි මහාචාර්ය උදිත ලියනගේ අනුස්මරණ පුස්තකාලයේ රාජකාරි කරමින් සිටියහ.

ඉගෙනුම් හවුල්කරුවන්ට සහ සම්පත් දායකයින්ට තොරතුරු සඳහා වැඩි ප්‍රවේශයක් ලබා දෙමින් පුස්තකාලය මඟින් පරිශීලකයින්ට සපයනු ලබන පහසුකම් එනම් මුද්‍රිත ග්‍රන්ථ සඳහා ප්‍රවේශය, විද්‍යුත් ග්‍රන්ථ එකතුව, සඟරා එකතුව, වාර සඟරා සහ පුවත්පත් එකතුව වසර පුරා යාවත්කාලීන කරන ලදී. එසේම, පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් පරිශීලකයින්ට විද්‍යුත් තැපැල සහ දුරකථන සංවාද හරහා දුරස්ථ ආධාරක පහසුකම් ලබා දෙමින් අන්තර්ජාල දත්ත සමුදායන් සහ විද්‍යුත් එකතුව වෙත ප්‍රවේශ වීමට සහාය විය.

පුස්තකාලයේ ප්‍රකාශනයක් වන ආයතනයේ පුවත් පත්‍රිකාව වන "Wisdom Window" මාසික පදනමින් දිගටම ප්‍රකාශයට පත් විය. ඒ සඳහා https://wisdomwindow.pim.sjp.ac.lk/ හරහා ප්‍රවේශ විය හැක.

EBSCOhost යනු ප්‍රමුඛ පෙළේ විද්වත් පර්යේෂණ දත්ත ගබඩාවක් වන අතර බොහෝ දුරට සම්පූර්ණ පාඨ ග්‍රන්ථ, සමියුරු සමාලෝචිත සඟරා කෙරෙහි අවධාරණය කරයි. ආයතනය මඟින් පළ කරන "Sri Lankan Journal of Management (SLJM)" හි අන්තර්ගතය මේ වන විට EBSCOhost - Business Source Corporate Plus සහ Business Source Ultimate හි වෙනස් දත්ත සමුදායන් දෙකක් හරහා ප්‍රවේශ විය හැක. SLJM, EBSCOhost දත්ත ගබඩාවේ සත්කාරකත්වය ලබා ගත් පළමු ශ්‍රී ලාංකික සඟරාව බවට පත් විය. මෙය ඇත්ත වශයෙන්ම, SLJM ලිපිවල උපුටා දැක්වීමේ අනුපාතය වැඩි කර ඇති අතර, එය ආයතනයේ ප්‍රමිතිය වැඩිදියුණු කිරීමට උපකාරී වේ.

## තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පශ්චාත් උපාධි සිසුන්, කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ ආශ්‍රිත තාක්ෂණික සහාය ලබා දෙමින් ආයතනය පුරා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම්, සේවාදායක පරිපාලනය, ඉලෙක්ට්‍රොනික සේවා සහ යෙදුම් සංවර්ධනය සහ නඩත්තු කිරීම කළමනාකරණය කරන පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ මූලික ආයතනයයි.

## ප්‍රචාරය සහ ප්‍රතිරූපය

2022 දී ආයතනය සිදු කරන ලද සියලු ක්‍රියාකාරකම්/සිදුවීම් පුවත්පත් සහ රූපවාහිනී ආවරණය සමඟ ප්‍රචාරය කිරීමට සවිඥානක උත්සාහයක් ගන්නා ලද අතර එමඟින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි දෘශ්‍යතාව ඉහළ නංවන ලදී. නිරන්තරයෙන් යාවත්කාලීන කරන ලද කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය ආයතනය විසින් පවත්වනු ලබන විශේෂ සිදුවීම් ද ආවරණය කරයි.

## කාර්ය මණ්ඩල පුහුණුව

ආයතනයේ කාර්ය මණ්ඩලය මනා සමතුලිත කණ්ඩායමකින් සමන්විත වන අතර, තරුණ සාමාජිකයින් අපේක්ෂිත කුසලතා, නිපුණතා සහ උපදෙස් ලබා ගැනීමේදී ජ්‍යෙෂ්ඨයින් සමඟ සම්බන්ධ වේ. කාර්යමණ්ඩල පුහුණු වැඩසටහන මඟින් කාර්යමණ්ඩලය මනා ලෙස හැඩගස්වා ගැනීමට අවශ්‍ය අන්තර් පුද්ගල කුසලතා, තොරතුරු තාක්ෂණ නිපුණතා සහ සාමාන්‍ය යෙදවුම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සමස්ත දැනුම ලබා දීමෙන් අපේක්ෂිත වැඩි දියුණු කිරීමේ ප්‍රතිඵලය (cushioning effect) ඇති කරයි . 2022 වර්ෂයේදී ඉහත අරමුණු ඉටුකරගැනීමේ අරමුණින් මාසික පුහුණු සැසි 12කට අධික ප්‍රමාණයක් පවත්වන ලදී.

## පීඨ සම්පත්

දශක තුනක කාලයක් පුරා, ආයතනය වැඩිහිටි ඉගෙනුම්, පර්යේෂණ සහ උපදේශන පිළිබඳ අත්දැකීම් සම්භාරයක් රැස් කර ගෙන ඇත. මේ වන විට ආයතනයේ සේවය කරන බොහෝ ආචාර්යවරුන් වසර ගණනාවක් එම කාර්යයේ යෙදී සිටිති. එබැවින්, ඔවුන් ප්‍රමිතීන් සකස් කරන, දේශීයව සොයාගත් දැනුම නිතිපතා විෂයමාලාවලට ඒකාබද්ධ කරන සහ අනෙකුත් පීඨ සාමාජිකයින් සමඟ වේගයෙන් හා කාර්යක්ෂමතාවයෙන් සම්බන්ධීකරණය කරන මූලික ශාස්ත්‍රාලික කණ්ඩායමක් සාදයි. පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි මට්ටමේ සිසුන්ගේ පාඨමාලා කටයුතු සහ පර්යේෂණ පත්‍රිකා සහ නිපුණතා ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ කාර්යයේ අධ්‍යයන පීඨය නිරත විය. පීඨ කණ්ඩායම ස්ථිර ආචාර්යවරුන්, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ආචාර්යවරුන් සහ බාහිර කථිකාචාර්යවරුන් සහ වෘත්තිකයන්ගෙන් සමන්විත විය.

## මානව සම්පත් සංවර්ධනය සහ සේවක සංඛ්‍යාව

වර්ෂය තුළ පීඨයේ මෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශිෂ්ට සේවාවක් ඉටු කළහ.

## **අනුමත සේවක සංඛ්‍යාව** 2022

## **සේවක වර්ගීකරණය**

| **සේවක කාණ්ඩය** | **වැටුප් කේතය** | **සේවක සංඛ්‍යාව** | **තත්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු** | **තත්‍ය කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| **ප්‍රාථමික මට්ටම** | | | | | |
| ප්‍රාථමික මට්ටම – නුපුහුණු | PL -1 | 02 | - | 02 | 01 |
| ප්‍රාථමික මට්ටම – අර්ධ පුහුණු | PL -2 | 03 | 02 | 01 | - |
| ප්‍රාථමික මට්ටම - පුහුණු | PL -3 | | | | |
| **ද්විතියක මට්ටම** | | | | | |
| කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන | U-MN1 | 15 | 09 | 06 | 05 |
| කළමනාකරණ සහකාර – තාක්ෂණික | U – MT 1 | 02 | 02 | - | - |
| ආශ්‍රිත නිලධාරී– ඛණ්ඩය 2 | U – MN 2 | - | - | - | - |
| ආශ්‍රිත නිලධාරී– ඛණ්ඩය 1 | U – MN 3 | - | - | - | - |
| කාර්ය මණ්ඩල සහකාර /අධි ශ්‍රේණිය සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහකාර | U – MN 4 | - | - | - | - |
| **තෘතික මට්ටම** | | | | | |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය – ඛණ්ඩය 2 | U – AS 1 | - | - | - | - |
| කණිෂ්ඨ – විධායක/ කළමනාකරු | U – EX 1 | 01 | - | 01 | 05 |
| අධ්‍යයන සහාය – ඛණ්ඩය 1 | U – AS 2 | 01 | - | 01 | 01 |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | |
| වෛද්‍ය නිලධාරී | U – MO 1 | - | - | - | - |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | U – MO 2 | - | - | - | - |
| මධ්‍යම මට්ටමේ විධායකයින් | U – EX 2 | 02 | 02 | 01 | 01 |
| මධ්‍යම මට්ටමේ විධායකයින් | U–EX 2 (a) U–EX 3 | | | | |
| **කථිකාචාර්ය**<br>**සහාය මහාචාර්ය**<br>**මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය** | U – AC 3<br>U – AC 4<br>U – AC 5 | 06 | 04 | 02 | 07 |
| | | 32 | 19 | 12 | 19 |

## වර්ෂය තුළ සැලකිය යුතු ජයග්‍රහණ (තිරසාරභාවය)

1. 2022 වර්ෂයේ දී, තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) මගින් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය පිළිබඳ මගපෙන්වීම අඛණ්ඩව ලබා දීම, තත්ත්ව සහතිකකරණයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර හොඳම භාවිතයන් බෙදා ගැනීමට පහසුකම් සැලසීම.

2. අධ්‍යයන පාඨමාලාවන්හි ගුණාත්මකභාවය සහ සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සමස්ත ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට දායක වන නව ප්‍රතිපත්ති 13ක් 2022 දී සකස් කරන ලදී.

3. 2022 වර්ෂයේ දී, තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) මගින් වි.වි.කො. විසින් හඳුනාගත් තත්ත්ව ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන පාඨමාලා පිළිබඳ ස්වයං ඇගයීමක් ආරම්භ කරන ලදී.

4. තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) විසින් ආයතනයේ පීඨ සාමාජිකයින්, පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා විවිධ අංශ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් ද පවත්වනු ලබයි.

5. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මගින් පිරිනමනු ලබන රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය සහ රාජ්‍ය පරිපාලන (අධ්‍යාපන කළමනාකරණ) පශචාත් උපාධි පාඨමාලාවල වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල (PLOs) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) අනුව අදාළ සුදුසුකම් මට්ටම්වල ඉගෙන ගන්නන්ගේ අපේක්ෂිත ගුණාංගවලට සමාන වන පරිදි සංශෝධනය කරන ලදී.

6. ව්‍යාපාර පරිපාලන පශ්චාත් පාඨමාලා තුළ හඳුනාගත් වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ උපාධිධාරීන් 448ක් අතර සමීක්ෂණයක් සිදු කරන ලදී.

7. ප්‍රතීතන ක්‍රියාවලීන්හි වැදගත් වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සඳහා "Organogram" සහ සන්නිවේදන නාලිකාව සංවර්ධනය කිරීමට තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය මූලික විය.

8. තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) එහි ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධි පාඨමාලාව සඳහා වි.වි.කො හි අනුමැතිය ලබා ගැනීම සඳහා වි.වි.කො සමඟ කටයුතු කරන ලදී.

9. තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) මඟින් පීඨ සාමාජිකයින්ගේ සම (peer) සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර මෙම ක්‍රියාවලියේදී භාවිතා කළ යුතු ආකෘතිය සකස් කරන ලදී. 2022 දී සම (peer) සමාලෝචන තුනක් පවත්වන ලදී. ආයතනයේ පීඨ සාමාජිකයින් සඳහා ගොඩනැගිල්ලේ අඛණ්ඩ පුළුල් කිරීම සිදු කරන ලදී.

10. 2022 වර්ෂයේ දී, තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) පර්යේෂණ අධීක්ෂකවරුන් සඳහා ආචාරධර්මී මාර්ගෝපදේශ සහ සිසුන්ගේ චර්යාධර්ම සංග්‍රහය සකස් කරන ලදී.

11. 2022 වර්ෂය තුළ, තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ සම්මතයන් සහ වැඩ භාරයන් තීරණය කිරීමේදී භාවිතා කළ යුතු නිර්ණායක සමාලෝචනය කර අවසන් කරන ලදී.

12. අතථ්‍ය ( virtual) ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සහ සමානාත්මතාවය පිළිබඳ මධ්‍යස්ථානය පිහිටුවීමට සහ මධ්‍යස්ථානයේ ප්‍රධානියා පත් කර ගැනීමට තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) මූලික විය.

13. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ තත්ත්ව සහතිකකරණ ක්‍රියාකාරකම් සමඟ සිසුන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීමේ අරමුණින් තත්ත්ව සහතිකකරණ වෙබ් පිටුව සංවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ සපයන ලදී.

14. 2022-2025 සඳහා තත්ත්ව සහතිකකරණ උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇත.

15. ලොව පුරා දියත් කර ඇති නවීකරණය කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ව්‍යාපාර උසස් අධ්‍යාපනික පාසල් සඳහා සංගමය (AACSB) ක්‍රියාකාරකම් වේගවත් කිරීම.

16. 2022 වර්ෂය තුළ ආයතනය විසින් පිරිනමනු ලබන සියලුම අධ්‍යයන පාඨමාලා සඳහා ISO 9001:2015 සහතිකය ලබා ගැනීම.

17. තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා වූ මධ්‍යස්ථානය (CQAA) ඉගෙනීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා යොදා ගනු ලබන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඩිජිටල් සුරක්ෂිතාගාරය (Digital Repository) සංවර්ධනය කිරීම සඳහා මග පෙන්වීමක් ද ලබා දෙන ලදී.


18. පරිසර හිතකාමී ඉගෙනීම සහතික කිරීම සඳහා Zoom සහ අනෙකුත් තාක්ෂණයන් භාවිතය වැඩි කිරීම.

19. 2022 දී කාර්ය මණ්ඩලය සඳහා මාසික පුහුණු සැසි 12කට අධික ප්‍රමාණයක් පවත්වන ලදී.


# පාලනය

## මූල්‍ය විශ්ලේෂණය 2022


කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන ඉතිහාසය ගත් කළ පසුගිය වසර වඩාත් අභියෝගාත්මක එකක් විය. අප කටයුතු කරන ලද්දේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ ය. මෙම දුෂ්කරතාවන් හමුවේ වුවද උද්යෝගය සහ නම්‍යශීලීභාවය තුළින්, ආයතනය මූල්‍යමය වශයෙන් ඔරොත්තු දෙන තත්ත්වයක් අත්පත් කරගෙන ඇති අතර, සිය අනාගත අභිලාෂයන් සඳහා මූල්‍යයන කිරීමේ හැකියාව ද නිර්මාණය කරගෙන ඇත. ආයතනයේ මෙහෙයුම් භූ දර්ශනයේ පවතින ඇදහිය නොහැකි අවිනිශ්චිතතාවයකින් වසර ආරම්භ විය. කොවිඩ් වසංගතය හේතුවෙන් අපගේ ශිෂ්‍ය බඳවා ගැනීම් පුරෝකථනය කිරීම අභියෝගාත්මක වූ අතර, කලින් අත්විඳින ලද හැසිරීම් රටා කිසිවක් ප්‍රතිනිර්මාණය නොවීය. 2022 වර්ෂය තුළ මෙම සියලු අවහිරතා සහිතව, ආයතනය දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා එහි මූල්‍ය කළමනාකරණය කරන ලදී.




**සමස්ත ආදායම** : **රු.මිලියන** 489




**සමස්ත වියදම රු.මිලියන** 329



## පරිපාලන හා මූල්‍ය කාර්යක්ෂමතාව


පහත සඳහන් ප්‍රකාශවලින් පිළිබිඹු වන පරිදි පරිපාලන හා මූල්‍ය කාර්යක්ෂමතාව සැලකූ විට, ආයතනයට මෙම වසර සතුටුදායක වසරක් විය.

සංසන්දනාත්මක පුනරාවර්තන වියදම් දත්ත 7 වගුවේ දැක්වේ.

**වගුව** 7: **පුනරාවර්තන වියදම්**: 2020 (**රු**) 2021 (**රු**) 2022 (**රු**)

| **විෂය** | | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|
| a. | අ. පුද්ගල පඩිනඩි | 90,550,329 | 90,171,706 | 108,378,750 |
| b. | ආ. ගමනාගමනය | 10,732,537 | 5,331,530 | 7,136,800 |
| c. | ඇ. සැපයුම් | 9,887,879 | 16,326,131 | 24,110,159 |
| d. | ඈ. නඩත්තුව | 4,364,886 | 2,097,073 | 5,712,615 |
| e. | ඉ. කොන්ත්‍රාත් සේවා | 20,770,589 | 18,769,215 | 25,908,976 |
| f. | ඊ. වෙනත් | 72,709,071 | 103,981,559 | 157,554,048 |
| g. | එ. ව්‍යාපෘති ස්වාභාවයේ වියදම් | -- | -- | -- |
| සමස්ත වියදම | | 208,970,290 | 226,677,214 | 328,801,348 |

මූලාශ්‍රය: *කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ දත්ත ගබඩාව*




සංසන්දනාත්මක ප්‍රාග්ධන වියදම් දත්ත 8 වගුවේ දැක්වේ.

**වගුව 8: ප්‍රාග්ධන වියදම්**

| **විෂය** | 2020 (රු) | 2021 (රු) | 2022 (රු) |
|---|---|---|---|
| අ. ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම | 3,369,956 | 5,626,800 | 16,519,902 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | - | - | - |
| ඇ. ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කර ගැනීම | - | - | - |
| ඈ. වෙනත් (පුස්තකාල පොත්, මෝටර් වාහන, උපාධි ලෝගු ) | 1,064,012 | 421,305 | 109,587 |
| ඉ. ඉඩම සහ ගොඩනැඟිල්ල පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම | - | - | - |
| ඊ. අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 590,000 | | 150,000 |
| එකතුව | 5,023,968 | 6,048,105 | 16,779,758 |

*මූලාශ්‍රය:* කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ දත්ත ගබඩාව




සංසන්දනාත්මක වියදම් පිළිබඳ මූල්‍ය ප්‍රගතිය දත්ත 9 වගුවේ දැක්වේ.

**වගුව** 9: **මූල්‍ය ප්‍රගතිය (වියදම්)**

| **විෂය** | | 2022 **ප්‍රතිපාදන රු.** | 2022 **වියදම රු.** | **ඉතිරිය / අතිරික්තය රු.** |
|---|---|---|---|---|
| a. | අ. ව්‍යාපෘතිය හැර පුනරාවර්තන | 344,862,000 | 328,801,348 | 16,060,652 |
| b. | ආ. ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධනය | 68,000,000 | 16,779,758 | 51,220,242 |
| c. | ඇ.ව්‍යාපෘතිය - දේශීය අරමුදල් | - | - | - |
| d. | ඈ. ව්‍යාපෘතිය - විදේශ අරමුදල් | - | - | - |
| එකතුව | | 412,862,000 | 345,581,107 | 67,280,893 |

*සටහන: ඉහත (ආ) හි ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රතිපාදන රු. 173,435,000/-අන්තර්ගත නොවේ.*
*මූලාශ්‍රය:* කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ දත්ත ගබඩාව





උත්පාදිත ආදායමේ සංසන්දනාත්මක මූල්‍ය ප්‍රගතිය සංඛ්‍යා 10 වගුවේ දැක්වේ.

**වගුව** 10: **මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම)**

| **ආදායම් ප්‍රභවය** | 2022 **ප්‍රතිපාදන රු.** | **එකතු වූ මුදල** 2022 **රු.** | **හිඟය/අතිරික්තය රු.** |
|---|---|---|---|
| පශ්චාත් උපාධි අධ්‍යයන | 361,548,000 | 320,419,967 | (41,128,033) |
| උපදේශන | 20,000,000 | 18,505,910 | (1,494,090) |
| වෙනත් | 55,440,000 | 150,078,638 | 94,638,638 |
| එකතුව | 436,988,000 | 489,004,515 | 52,016,515 |

*මූලාශ්‍රය:* කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ දත්ත ගබඩාව




**මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය**, 2022:

1998 දී ස්ථාපිත ආයතනයේ ස්වයං මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රකාරව, වසර තුළ ආයතනයට රජයේ මූල්‍ය ප්‍රභවවලින් කිසිදු ප්‍රතිපාදනයක් ලැබී නැත. එම වසරේ සිට ආයතනයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන හෝ ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් ලැබී නැත. ආයතනය විසින් උපයන ලද අරමුදල්වලින් රුපියල් මිලියන 50 ක් බද්දක් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවා තිබීම ද විශේෂයෙන් සඳහන් කළ යුතුමය.


2022 මූල්‍යමය කාර්යසාධන විශ්ලේෂණ දත්ත 11 වගුවේ දැක්වේ.


**වගුව** 11: **මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය** , 2022


| **විෂය** | **ශිෂ්‍යයෙකු සඳහා වියදම රු.** |
|---|---|
| ශිෂ්‍යයෙකු සඳහා පුනරාවර්තන වියදම (RE) | 338,621.37 |
| ශිෂ්‍යයෙකු සඳහා ප්‍රාග්ධන වියදම (CE) | 17,280.90 |


*මූලාශ්‍රය:* කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ දත්ත ගබඩාව


**2015 සිට 2022 දක්වා අරමුදල් කළමනාකරණ සාරාංශයේ ප්‍රගතිය**





ආයෝජන කළමනාකරණය
700,000,000.00
600,000,000.00
500,000,000.00
400,000,000.00
300,000,000.00
200,000,000.00
100,000,000.00
-
570,441,582.00
641,776,451.00
624,768,363.00
541,048,334.00
538,557,179.00
443,611,669.00
309,785,818.00
272,847,368.00
2022
2021
2020
2019
2018
2017
2016
2015


භාණ්ඩ ලේඛනය කළමනාකරණය
35,000,000.00
30,000,000.00
25,000,000.00
20,000,000.00
15,000,000.00
10,000,000.00
5,000,000.00
-
33,256,393.00
15,294,660.00
15,419,511.00
10,024,648.00
3,292,349.00
2,112,640.00
1,810,795.00
2,851,651.00
2022
2021
2020
2019
2018
2017
2016
2015


ණයගැතියන් කළමනාකරණය
140,000,000.00
120,000,000.00
100,000,000.00
80,000,000.00
60,000,000.00
40,000,000.00
20,000,000.00
-
68,999,985.00
92,015,869.00
124,621,286.00
79,305,272.00
67,761,284.00
37,694,293.00
12,115,041.00
1,641,000.00
2022
2021
2020
2019
2018
2017
2016
2015

## සුවිශේෂ ජයග්‍රහණ (පරිපාලනය)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අපේක්ෂාවන්ට සහ AACSB ප්‍රමිතීන්ට අනුකූලව නවීකරණය කරන ලද පීඨයේ වැඩ සම්මතයන් සහ වැඩ භාරයන් (workloads) හඳුන්වාදීම.
2. ආයතනය විසින් උපයන ලද අරමුදල්වලින් රුපියල් මිලියන 50 ක් බද්දක් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවා තිබීම ද විශේෂයෙන් සඳහන් කළ යුතුමය.
3. මූල්‍ය හා වැටුප් හා වේතන කමිටුව (FRC) කළමනාකරණ මණ්ඩල අනු කමිටුවක් ලෙස පවත්වාගෙන යාම.
4. කළමනාකරණ පශ්චාත් ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලාවන් සඳහා ISO 9001:2015 තත්ත්ව සහතිකකරණය අඛණ්ඩව පවත්වා ගැනීම.
5. සැලසුම් කළ පරිදි කළමනාකරණ මණ්ඩල සහ අධ්‍යයන මණ්ඩල රැස්වීම් පැවැත්වීම
6. ආයතනය සඳහා ලබා ගත් AACSB සාමාජික තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීම.
7. දකුණු ආසියාවේ කළමනාකරණ සංවර්ධන ආයතන සංගමයේ විධායක සාමාජික තනතුරක් පවත්වාගෙන යන ලදී.
8. ආයතනයේ පාඨමාලා සඳහා දකුණු ආසියානු තත්ත්ව සහතික (SAQS) ප්‍රතීතනය සඳහා ඉල්ලුම් කරන ලදී.
9. භෞතිකව සහ මාර්ගගතව යන දෙයාකාරයටම සහභාගීවන්නන්ට අවස්ථා සලසාලමින් දෙමුහුන් පීඨ රැස්වීම් පැවැත්වීම.
10. මාසික පාඨමාලා සම්බන්ධීකාරකවරුන්ගේ රැස්වීම් පැවැත්වීම.
11. මාසික අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ රැස්වීම් පැවැත්වීම.

# අනාගත සැලසුම්

2020-2022 සඳහා සකස් කරන ලද උපායමාර්ගික සැලැස්මට අනුකූලව, ඉගැන්වීම, පර්යේෂණ, හවුල්කාරිත්වය, තිරසාරභාවය සහ පාලනය යන ස්ථම්භ පහේ නියමිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය කටයුතු කරනු ලබයි.

ආයතනය මඟින් පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ඇති වූ අහිතකර ප්‍රතිවිපාක සාර්ථකව ජයගත් අතර, දැනට කොවිඩ් 19 වසංගතය හමුවේ ඇති ව ඇති අහිතකර බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව සහ ඒවා මැඩ පවත්වාගෙන නැගී සිටීමේ හැකියාව පෙන්නුම් කරනු ලබයි.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ප්‍රමුඛතම පාඨමාලාව වන ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාව ජාත්‍යන්තර ගමනාන්ත හයක (ඩුබායි, දෝහා, මස්කට්, කුවේට් සිටි, ඩකා, සහ මනමා- බහරේන්) පිරිනමනු ලබන අතර, මාලදිවයිනේ මාලේ ද මේ සඳහා ඇතුළත් කර ගැනීම පිණිස සැලසුම් කර ඇත. විදේශීය අධ්‍යයන කණ්ඩායම් තවදුරටත් එකතු කිරීමත් සමඟ දිගු කාලීනව ගුණාත්මකභාවය සහ අදාළත්වය පවත්වා ගැනීම සම්බන්ධයෙන් ඉහළ වැදගත්මක් ලබා දිය යුතුය. එවැනි පියවරයන් මූලික වශයෙන් විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රවාසිකයන්ට ඔවුන්ගේ නායකත්වය සහ කළමනාකාරිත්ව නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා සහාය වේ.

අවසාන ව්‍යාපෘති ඇතුළුව සියලුම අංශවල පර්යේෂණවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය වැඩි අවධානයක් යොමු කරනු ඇත. පර්යේෂණ වාර්තාවල අන්තර්ගතයට අමතරව, ශාස්ත්‍රීය ඉදිරිපත් කිරීමේ අංගයන් වැඩිදියුණු කළ යුතුය. සිසුන් ගුණාත්මක හා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවල විශාල මාත්‍රාවලට නිරාවරණය කළ යුතුය. පීඨයේ පර්යේෂණ නිමැවුම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා “Sri Lankan Journal of Management” ශ්‍රේණිගත තත්ත්වයට පත් කර ගැනීමට ද සාමූහික උත්සාහයක් දැරීම එබැවින්, පර්යේෂණ මධ්‍යස්ථානයේ කාර්යභාරය සඳහා පුළුල් පදනමක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවය සුවිශාල වැදගත්කමකින් යුක්ත වේ.

මීට අමතරව, ආයතනය විසින් පවත්වනු ලබන රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාවේ අන්තර්ගතය මෙන්ම පිරිනැමීමේ ක්‍රමවේදය යන දෙඅංශයම වැඩිදියුණු කිරීමට උත්සාහ කළ යුතුය. තොරතුරු තාක්ෂණය භාවිත කරමින් මිශ්‍ර ඉගෙනුම් ක්‍රම භාවිතය තවදුරටත් වැඩිදියුණු කළ හැකි අතර එමගින් රටේ දුර බැහැර ප්‍රදේශයන්හි සිසුන්ගේ සාධනීය සහභාගිත්වයක් සහතික කෙරෙනු ඇත.

අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPA-EM) වැනි යම් කාණ්ඩයක් සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද (tailored) පාඨමාලා තවදුරටත් ව්‍යාප්ත කළ යුතු අතර නුදුරු අනාගයේ දී සෞඛ්‍ය පරිපාලනය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPAH) හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධියක් (DBA) නව පාඨමාලා ලෙස අනාගතයේ දී පිරිනැමීමට කටයුතු සැලසුම් කරගෙන යනු ලැබේ. විශේෂයෙන්ම පුද්ගලික අංශයෙන් සේවාලාභීන්ගේ විශේෂිත පුහුණු සහ සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කර ඇති විධායක සංවර්ධන වැඩසටහන් (EDP) කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතරතුර ආයතනයේ ප්‍රමුඛතම වරණීත ක්ෂේත්‍ර වන ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA), රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPA) සහ දර්ශන විශාරද උපාධි පාඨමාලා සහ පර්යේෂණවල අඛණ්ඩව විශිෂ්ටත්වය දැක්වීමට ආයතනය ප්‍රයත්න දරයි. යටිතල පහසුකම් සංවර්ධනය, පීඨය පුළුල් කිරීම සහ එහි අඛණ්ඩ සංවර්ධනය සමඟ, ඉහත සඳහන් කළ අධ්‍යයන, පර්යේෂණ සහ පුහුණු පාඨමාලා සැලසුම් කළ පරිදිම පිරිනැමීමට ආයතනයට හැකි වනු ඇත.

මෙම සියලු අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම පිණිස ආයතනය මේ වන විට 2023- 2025 කාල පරිච්ඡේදය සඳහා නව උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටියි.

# මූල්‍ය ප්‍රකාශන

# 2022 දෙසැම්බර් 31 දිනෙන්

# අවසන් වූ වර්ෂය සඳහා

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය** **02 පිටුව**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | සටහන | 2,022 | නැවත ප්‍රකාශිත අගය 2021 |
|---|---|---|---|
| **අයභාරය** | | | |
| පාඨමාලා ගාස්තු | **01** | 310,383,112 | 277,863,758 |
| විධායක සංවර්ධන වැඩසටහන් වලින් ලැබෙන ආදායම | | 18,505,910 | 9,158,967 |
| උසස් සහතික පත්‍ර පාඨමාලාවෙන් ලැබෙන ආදායම | | 1,850,000 | - |
| උපාධි ප්‍රදානෝත්සවයේ ගාස්තු | | 5,372,501 | - |
| ලියාපදිංචි ගාස්තු | | 1,326,354 | 2,113,621 |
| විභාග ගාස්තු | | 1,266,000 | 955,020 |
| අයදුම්පත් ගාස්තු | | 222,000 | 933,000 |
| වෙනත් ආදායම් | **02** | 150,078,638 | 43,609,133 |
| **මුළු අයභාරය** | | **489,004,516** | **334,633,500** |
| **වියදම** | | | |
| විධායක සංවර්ධන වැඩසටහන් | | 15,560,607 | 8,103,498 |
| උසස් සහතික පාඨමාලාවෙන් වියදම් | | 553,475 | - |
| සාමාන්‍ය පරිපාලනය | **03** | 89,890,885 | 70,179,963 |
| අධ්‍යයන සේවා | **04** | 129,625,478 | 80,215,274 |
| ඉගෙනුම් සම්පත් | **05** | 19,604,356 | 20,796,783 |
| අනුබද්ධ ක්‍රියාකාරකම් | **06** | 9,425,895 | 7,613,057 |
| ප්‍රකාශන වියදම් | | 1,972,911 | 4,083,317 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | 16,218,021 | 13,913,093 |
| විගණන ගාස්තුව | | 887,400 | 887,400 |
| පාඨමාලා ගාස්තු අඩු කිරීම | | - | 8,455,654 |
| කපා හැරීම් - ලැබිය යුතු පාඨමාලා ගාස්තු ශේෂයන් | **07** | 45,062,320 | 22,364,176 |
| විවිධ වියදම් | | - | 65,000 |
| **මුළු වියදම** | | **328,801,348** | **236,677,214** |
| | | - | |
| **දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනයට පෙර වර්ෂය සඳහා අතිරික්තය** | | **160,203,167** | **97,956,285** |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය තුලින් ලද ලාභය ක්‍රියාකාරකම් | | - | 16,000,000 |
| **දේපළ, පිරියත සහ උපකරණ මත ලාභය ප්‍රත්‍යාගණනයට පසු වර්ෂය සඳහා අතිරික්තය** | | **160,203,167** | **113,956,286** |
| මහා භාණ්ඩාගාරයට ගෙවා ඇති බදු | | **50,000,000** | |
| **බදු ගෙවීමෙන් පසු වසර සඳහා අතිරික්තය** | | **110,203,167** | **113,956,286** |

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය 03 පිටුව

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**2022 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | 2022 | 2021 |
|---|---|---|---|
| | | | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල,පිරියත සහ උපකරණ | 08 | 190,399,459 | 189,472,160 |
| කෙරෙමින් පවතින වැඩ - ගොඩනැගිල්ල (අදියර II) | 09 | 216,577,152 | 124,482,283 |
| සේවයේ යෙදවීමේ අත්තිකාරම් - ගොඩනැගිල්ල (අදියර II) | 10 | 11,953,708 | 20,113,086 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 1,411,376 | 1,776,938 |
| ස්ථාවර තැන්පතු | 12 | 530,441,582 | 438,996,485 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **950,783,277** | **774,840,952** |
| **ජංගම වත්කම්** | | | |
| ගබඩා තොග | 13 | 33,256,393 | 15,294,660 |
| අත්තිකාරම් සහ පෙරගෙවීම් | 14 | 15,278,840 | 6,666,589 |
| ලැබිය යුතු දෑ | 15 | 142,346,071 | 105,516,418 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 16 | 215,856,559 | 348,492,712 |
| **මුළු ජංගම වත්කම්** | | **406,737,863** | **475,970,378** |
| **මුළු වත්කම්** | | **1,357,521,140** | **1,250,811,331** |
| **ස්කන්ධ සහ වගකීම්** | | | |
| **ස්කන්ධ සහ වගකීම්** | | | |
| ප්‍රාග්ධන දීමනාව | | 166,986,090 | 166,986,090 |
| ප්‍රත්‍යාගණන සංචිත | 17 | 177,734,566 | 177,734,566 |
| පොදු රක්ෂිතය | | 896,578,961 | 782,304,660 |
| **මුළු ස්කන්ධ** | | **1,241,299,616** | **1,127,025,315** |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන | 18 | 10,393,326 | 16,954,659 |
| පරිත්‍යාග අරමුදල | 19 | 437,608 | 437,608 |
| රඳවා තබා ගැනීම-ගොඩනැගිල්ල අදියර II | | 9,032,644 | 9,032,644 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **19,863,577** | **26,424,911** |
| **ජංගම වගකීම්** | | | |
| ප්‍රතිපාදන | 20 | 13,185,994 | 12,103,074 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු | 21 | 436,000 | 130,000 |
| අත්තිකාරම් වශයෙන් ලැබුණු ආදායම | 22 | 60,593,928 | 61,631,060 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම් | 23 | 22,142,024 | 23,496,970 |
| **මුළු ජංගම වගකීම්** | | **96,357,946** | **97,361,104** |
| **මුළු වගකීම්** | | **116,221,524** | **123,786,015** |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | | **1,357,521,140** | **1,250,811,331** |

ආයතනයේ ඉහත මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකසන ලද 1985 අංක 03 දරන ආඥාපනතේ අදාළ වගන්තිවල අවශ්‍යතාවලට අනුකූල වන බව අපි සහතික කරමු.

……………………  ……………………

උපුල් සෙනෙවිරත්න — ජේ. කේ. එස්. රණපුර

**නියෝජ්‍ය මූල්‍යාධිකාරී** — **ජ්‍යෙෂ්ඨ සහකාර රෙජිස්ට්‍රාර්**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වගකිව යුතුය.

………………………  ...…………………

ආචාර්ය ඩබ්ලිව්.ජී.එස්.කැළුම් — ඒ.එන්. රණසිංහ

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

රු.

| | සටහන | ප්‍රාග්ධන දීමනාව | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිතය | එකතුව |
|---|---|---|---|---|---|
| **2021 ජනවාරි 1 වන දිනට ශේෂය** | | **166,986,090** | **161,734,566** | **684,348,375** | **1,013,069,030** |
| වාහන ප්‍රත්‍යාගණනය අතිරික්තය | | - | 16,000,000 | - | 16,000,000 |
| 2021 කාල සීමාව සඳහා නැවත සඳහන් කළ අතිරික්තය | අ | - | - | 97,956,285 | 97,956,285 |
| **2022 ජනවාරි 1 වන දිනට ශේෂය** | | **166,986,090** | **177,734,566** | **782,304,660** | **1,127,025,315** |
| 2022 කාල සීමාව සඳහා අතිරික්තය | | - | - | 110,203,167 | 110,203,167 |
| වට්ටම් අනුපාතයේ වෙනස්වීම් හේතුවෙන් ලද සැබෑ ලාභය | | - | - | 4,071,134 | 4,071,134 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **166,986,090** | **177,734,566** | **896,578,961** | **1,237,228,483** |

| **සටහන අ. ගැලපීම්** | රු. |
|---|---|
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | (5,211) |
| කාර්යාලීය ගෘහභාණ්ඩ | (34,998) |
| පුස්තකාල පොත් | (57,582) |
| අස්පෘශ්‍ය ක්‍රමක්ෂය කිරීම | (59,000) |
| වාහන අංශය | 110,511 |
| **මුළු ගැලපීම්** | (46,280) |

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය **05 පිටුව**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | 2022 | නැවත ප්‍රකාශිත අගය 2021 |
|---|---|---|
| | | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| **අතිරික්තය** | 110,203,167 | 97,956,285 |
| පූර්ව වර්ෂ ගැලපීම | | |
| **ගැලපීම්:** | | |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | 16,218,021 | 13,913,093 |
| පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම් | 1,303,951 | 1,596,224 |
| වත්කම් අපහරණය කිරීමේ පාඩුව/ලාභය | - | (46,000) |
| කාර්ය මණ්ඩල ණය වලින් ලැබෙන පොලී ආදායම | (141,182) | (139,672) |
| ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම | (85,184,792) | (37,000,362) |
| ශාලා ගාස්තු වලින් ලැබෙන ආදායම | (2,678,618) | (198,000) |
| | **39,720,548** | **76,081,568** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්** | | |
| ගබඩා තොගය (වැඩිවීම)/ අඩුවීම | (17,961,733) | 124,851 |
| අත්තිකාරම් සහ පෙරගෙවීම් (වැඩිවීම)/අඩුවීම | (8,612,251) | (4,345,400) |
| ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | 22,765,589 | 33,468,061 |
| ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | 306,000 | 35,000 |
| අත්තිකාරම් වශයෙන් ලැබුණු ආදායම වැඩි වීම/(අඩුවීම). | (1,037,133) | 6,986,060 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් වැඩි වීම/(අඩු වීම). | (1,354,945) | (1,186,896) |
| ප්‍රතිපාදන වැඩිවීම/(අඩු වීම). | 1,082,920 | 3,146,772 |
| | **34,908,994** | **114,310,016** |
| පාරිතෝෂික ගෙවීම් | (3,794,151) | (7,683,936) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **31,114,843** | **106,626,080** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (16,629,758) | (6,048,105) |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම | (150,000) | - |
| ගොඩනැගිල්ල ඉදිකිරීම | (83,935,491) | (44,241,180) |
| පැරණි ගබඩා අයිතම විකිණීම | - | 46,000 |
| ශාලා ගාස්තු මත ආදායම | 2,678,618 | 198,000 |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන ආපසු ගැනීම | 118,805,523 | - |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන වැඩි වීම (සමුච්චිත ස්ථාවර තැන්පතුවල එකතුව නැවත ආයෝජනය කිරීම) | (210,250,619) | (13,467,423) |
| ණය සහ අත්තිකාරම් සඳහා පොලී | 141,182 | 139,672 |
| ආයෝජන සඳහා පොලී | 18,118,895 | 22,403,931 |
| සමුච්චිත ස්ථාවර තැන්පතුවල ආයෝජන සඳහා පොලී | 7,470,654 | 17,008,087 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(163,750,996)** | **(23,961,018)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | - | - |
| පරිත්‍යාග අරමුදල | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **-** | **-** |
| **වර්ෂය තුළ මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වෙනස් වීම** | **132,636,153** | **82,665,061** |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 348,492,712 | 265,827,651 |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | **215,856,559** | **348,492,712** |
| **මුදල් සහ මුදල් සමාන දෑ විශ්ලේෂණය** | | |
| ලංකා බැංකුව - බොරැල්ල ශාඛාව- ගිණුම් අංකය 192596 | (3,888,995) | 2,197,110 |
| සම්පත් බැංකුව පී.එල්.සී. ඇම. ඩොලර් ගිණුම් අංකය 521830000070 | 110,873,191 | 38,667,518 |
| බැංකු ගිණුම - නේවාසික විදේශ මුදල් (ජාත්‍යන්තර මධ්‍යස්ථානය)ගිණුම් අංකය 9719360 | 1,134,900 | 2,812,681 |
| බැංකු ගිණුම (ජාත්‍යන්තර මධ්‍යස්ථානය) ගිණුම් අංකය 021580683001 | 87,461 | 87,461 |
| අරමුදල් කළමනාකරණ ගිණුම | 67,650,002 | 101,947,976 |

| | | |
|---|---|---|
| කෙටි කාලීන ආයෝජන | 40,000,000 | 202,779,966 |
| | **215,856,559** | **348,492,712** |

**06 පිටුව**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය**

**1. සාමාන්‍ය තොරතුරු, සකස් කිරීමේ පදනම සහ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය.**

**1.1 වාර්තා කරන අස්ථිත්වය**

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) යනු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත (2019 අංක 03 ආඥාපනත මගින් සංශෝධිත) යටතේ වූ ආඥාපනත මගින් 1986 දී පිහිටුවන ලද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ අර්ධ - ස්වාධීන ආයතනයකි.

කළමනාකරණ සහ පරිපාලන අධ්‍යයනයන්හි විවිධ අංශවල පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය සහ වෘත්තීයභාවය ප්‍රවර්ධනය කිරීම එහි අරමුණු වේ.

ආයතනය එකවර සිසුන් 500 කට අධික සංඛ්‍යාවක් සඳහා පහසුකම් සපයන අතර එහි දේශන ශාලා, පීඨ කාමර, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක්, පුස්තකාලයක් සහ ආපන ශාලාවක් ද ඇත. පරිශ්‍රයේ, දේශන ශාලා සහ අධ්‍යාපනික උපකරණවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ආයතනය වෘත්තීය සහ නවීන දැක්මක් පවත්වාගෙන යයි.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ අද්විතීය උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ස්වයං මූල්‍යනය වන අතර 1998 සිට එසේ පවතී. එතැන් පටන් එය ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් ලබාගෙන නොමැත. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් (MBA) සහ රාජ්‍ය පරිපාලනවේදී පශ්චාත් (MPA) උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් 5,700 කට අධික පිරිසක් බිහි කර ඇත.

**1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වන කළමනාකාරිත්ව වගකීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ අපක්ෂපාති ලෙස ඉදිරිපත් කිරීම සඳහා පාලක මණ්ඩලය (කළමනාකරණ මණ්ඩලය) වගකීම දරයි.

**1.3** අනුකූලතා ප්‍රකාශ

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර, එම ප්‍රමිතීන් නොමැති අවස්ථාවන්හි දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) අනුගමනය කර ඇත.

**සංසන්දනාත්මක තොරතුරු**

ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ කරගෙන ඇති අතර පූර්ව වසරවලදී ද එම ප්‍රතිපත්තිවලට අනුකූල වී ඇත. සංසන්දනය කිරීමේ අභිමතාර්ථය වෙනුවෙන් පෙර වසරේ සංඛ්‍යාලේඛන දක්වා ඇත.

**1.4 දේපල, පිරියත සහ උපකරණ**

**(අ) පිරිවැය**

දේපල, පිරියත සහ උපකරණ පිරිවැයෙන් අඩු කළ සමුච්චිත ක්ෂයවීම්වල වාර්තා කර ඇත.

**(ආ) ක්ෂය වීම**

ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය තුළ එවැනි මුදල් සමාන වාරිකවලින් කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලුම දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය මත සරල රේඛීය ක්‍රමයක් භාවිතා කර ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කෙරේ.

භාවිතා කරන ලද වාර්ෂික ගාස්තු

| | |
|---|---|
| කාර්යාල උපාංග සහ උපකරණ | 10% |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 10% |
| ගෘහ භාණ්ඩ | 10% |
| රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 20% |
| මෝටර් වාහන | 20% |
| කාර්යාල උපකරණ | 20% |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 20% |
| උපාධි ලෝගු | 20% |
| අස්පෘශ්‍ය වත්කම් | 20% |

දේපල, පිරියත සහ උපකරණ භාවිතය සඳහා පවතින විට දේපල, පිරියත සහ උපකරණ සඳහා ක්ෂයවීම් ලබා දී ඇත.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය තුළ පහත සඳහන් දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කරන ලදී.
ඇස්තමේන්තුගත අනාගත ජීව කාලය සැලකිල්ලට ගනිමින් ප්‍රත්‍යාගණනය කරන ලද අයිතමවල ක්ෂයවීම් සඳහා විධිවිධාන තීරණය කරන ලදී.

1. ගෘහභාණ්ඩ
2. කාර්යාල උපකරණ
3. රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ
4. පිරියත සහ යන්ත්‍රෝපකරණ

මෙම ගොඩනැගිල්ල 2018 වසරේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී. විස්තර පහත දක්වා ඇත.

| | |
|---|---|
| ප්‍රත්‍යාගණනය කිරීමට පෙර ගොඩනැගිල්ලේ පොත් වටිනාකම | = Rs. 16,834,831 |
| ප්‍රත්‍යාගණනය කළ මුදල | = Rs. 163,340,000 |
| ප්‍රත්‍යාගණනය කිරීමේ ලාභය | = Rs. 146,505,169 |

වසර 38 ක ජීව කාලයක් ඇස්තමේන්තු කරමින් ගොඩනැගිල්ලේ අගය ක්ෂය කරන ලදී.

2021 දී ලංකා ඔටෝමොබයිල් සංගමය විසින් මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරන ලදී. ඇස්තමේන්තුගත අනාගත ජීව කාලය සැලකිල්ලට ගනිමින් මෝටර් රථ ක්ෂයවීම් සඳහා විධිවිධාන තීරණය කරන ලදී.

| | |
|---|---|
| ප්‍රත්‍යාගණනය කිරීමට පෙර වාහනවල පොත් වටිනාකම | =Rs. 0 |
| ප්‍රත්‍යාගණනය කළ මුදල | =Rs. 16,000,000 |
| ප්‍රත්‍යාගණනය කිරීමේ ලාභය | =Rs. 16,000,000 |

**ආයෝජන**
ස්ථාවර තැන්පතු වලින් සමන්විත ආයෝජන අවසාන අලුත් කිරීමේ දිනට තැන්පතු වටිනාකමින් දක්වා ඇත.

1.5 **ජංගම වගකීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත පියවීමට අපේක්ෂිත ඒවා වේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය**

**1.6 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්**

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිතය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 පරිදි, ආයතනය පාරිතෝෂිත සූත්‍ර ක්‍රමය මත පදනම්ව පාරිතෝෂික වගකීම් සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව, සේවකයකු විසින් වසර 5 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසු ගෙවීමේ වගකීම පැන නගී.

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්- විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවක භාර අරමුදල**

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තෝරා නොගත් සේවකයින් සම්බන්ධයෙන්, ආයතනය විසින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සේවකයින්ගේ දළ වැටුපෙන් (ජීවන වියදම් දීමනාව ඇතුළුව) 15%ක් දායක කරයි.

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සම්බන්ධ වී ඇති සේවකයින් සම්බන්ධයෙන්, ආයතනය විසින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට පිළිවෙළින් සේවකයන්ගේ දළ වැටුපෙන් 7%ක් සහ 8%ක් දායක කරයි.

සේවක භාර අරමුදලට ආයතනයේ දායකත්වය සේවකයන්ගේ දළ වැටුපෙන් 3% කි.

**1.7 අයභාරය හඳුනාගැනීම**

ආර්ථික ප්‍රතිලාභය ආයතනයට ගලා ඒමට සහ ඒ ආශ්‍රිත පිරිවැය දැරීමට හෝ දැරීමට ඉඩ ඇති ප්‍රමාණයට ආදායම හඳුනාගෙන ඇත.

(අ) පාඨමාලා ගාස්තු
උපකාරක පන්ති ගාස්තු ලෙස සිසුන්ගෙන් ලැබෙන ආදායම කාල සමානුපාතික පදනම මත හඳුනා ගැනේ.

(ආ) ආයෝජනයෙන් ලැබෙන පොලී
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලී උපචිත පදනම මත හඳුනා ගැනේ.

(ඇ) ව්‍යාපෘති වලින් ලැබෙන ආදායම
ව්‍යාපෘතියෙන් ලැබෙන ආදායම නිම කිරීමේ පදනම මත හඳුනා ගැනේ.

(ඈ) වෙනත්
අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ

**1.8 (අ) වියදම් හඳුනාගැනීම**

දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර ඍජු සම්බන්ධතාවයක පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදම් හඳුනාගෙන ඇත. ආයතනය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දරනු ලබන සියලුම වියදම් ආදායමට අයකර ඇත.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය**

1.8 (ආ) **අසම්භාව්‍ය වගකීම්**

නඩු පැවරීමෙන් පැන නගින වගකීම් සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන සපයා නැත. 2022 දෙසැම්බර් 31 වන විට උසාවියක එක් නඩුවක් පවතින අතර වගකීම් නොමැත.

**1.9** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි සඳහන් වන පරිදි මුදල් සහ මුදල් හා සමාන දෑ යන්නට අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 2 අනුව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ "වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය **10 පිටුව**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා** **රු.**

| | **2022** | **2021** |
|---|---|---|
| සටහන **01 .** පාඨමාලා ගාස්තු | | |
| MBA (2018/2019) | 143,750 | 556,250 |
| MBA (2019/2020) | 125,000 | 2,101,925 |
| MBA (2020/2021) | 21,652,100 | 94,490,965 |
| MBA (2021/2022) | 111,835,570 | 111,252,000 |
| MBA (2022/2023) | 86,533,500 | - |
| MBA CIT (2021/2022) | 9,725,000 | 12,000,000 |
| Executive MBA (2019) | - | 175,000 |
| Executive MBA (2021) | (1,500,000) | 15,170,000 |
| Executive MBA (2022) | 12,513,333 | |
| MBA Taxation (2019/2020) | - | 4,945,750 |
| MBA Taxation (2020/2021) | - | 15,275,000 |
| MBA Taxation (2022/2023)-I (IRD) | 13,650,000 | - |
| MBA Taxation (2022/2023)-II- General | 3,200,000 | |
| PHD (2016/2018) | 500,000 | - |
| PHD (2018/2020) | 750,000 | 83,358 |
| PHD (2020/2022) | 2,020,000 | 6,880,000 |
| MPA (2015/2019) | 295,800 | - |
| MBA UAE (2019/2020) | - | 773,699 |
| MBA Qatar (2018/2019) | - | 2,267,338 |
| MBA Qatar (2020/2021) | 405,461 | 2,026,594 |
| MBA Kuwait (2018/2019) | - | 756,066 |
| MBA Bangladesh (2018/2019) | - | 790,084 |
| MBA Baharain (2020/2021) | - | 317,405 |
| MBA International (2021/22) (UAE, Oman, Kuwait) | 27,376,382 | 4,155,861 |
| MPA in Education Management- I (2022) | 13,329,525 | - |
| MPA in Education Management- II (2022) | 4,250,000 | - |
| *MBA වර්ග නොකළ | 3,577,690 | 3,846,465 |
| මුළු එකතුව | **310,383,112** | **277,863,758** |

* වසර සඳහා වර්ගීකරණය නොකළ පාඨමාලා ගාස්තු

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය **11 පිටුව**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | සටහන | 2022 | රු. 2021 |
|---|---|---|---|
| **සටහන 02. අනෙකුත් ආදායම්** | | | |
| පොලී ආදායම | **2.1** | 85,325,974 | 37,140,034 |
| කුලී ආදායම සහ ශාලා ගාස්තු | | 2,678,618 | 198,000 |
| විදේශ විනිමය ලාභ/(අලාභ) | | 43,948,184 | 5,508,456 |
| විනිමය අනුපාත හේතුවෙන් පාඨමාලා ආදායම් ලාභය/(අලාභය) | | 14,729,762 | - |
| ප්‍රකාශන විකිණීම | | 124,000 | 257,500 |
| පුස්තකාල දඩ මුදල් සහ ගාස්තු | | 7,200 | 21,800 |
| විවිධ ලැබීම් | **2.2** | 3,264,900 | 320,384 |
| වත්කම් අපහරණය මත ලාභය | | - | 46,000 |
| පාරිතෝෂිත දීමනාව ඉක්මවා යාම | | - | 116,959 |
| | | **150,078,638** | **43,609,133** |

| | 2022 | 2021 |
|---|---|---|
| **සටහන 2.1 : පොලී ආදායම** | | |
| පොලී ආදායම - ස්ථාවර තැන්පතු සහ ඉතිරිකිරීමේ ගිණුම් | 85,184,792 | 37,000,362 |
| - කාර්ය මණ්ඩල ණය | 141,182 | 139,672 |
| | **85,325,974** | **37,140,034** |

| | 2022 | 2021 |
|---|---|---|
| **සටහන 2.2: විවිධ ලැබීම්** | | |
| අධිභාර ගාස්තු | 930,517 | 72,375 |
| පිටපත් ගාස්තු | 56,000 | 37,500 |
| ටෙන්ඩර් ගාස්තු | 132,000 | 2,000 |
| විවිධ ආදායම් | 2,146,383 | 208,509 |
| | **3,264,900** | **320,384** |

| | සටහන | 2022 | 2021 |
|---|---|---|---|
| **සටහන 03. සාමාන්‍ය පරිපාලනය සහ කාර්ය මණ්ඩල පිරිවැය** | | | |
| වැටුප් සහ වේතන | | 32,276,797 | 27,550,845 |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | | 3,295,845 | 2,511,914 |
| සැපයුම් | | 10,653,593 | 3,217,428 |
| නඩත්තු | | 5,496,890 | 2,045,835 |
| ගිවිසුම්ගත සේවා | | 24,276,438 | 17,418,565 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 3.2 | 13,891,322 | 17,435,375 |
| | | **89,890,885** | **70,179,963** |

| | 2022 | 2021 |
|---|---|---|
| **සටහන 3.2- අනෙකුත් පුනරාවර්තන වියදම්** | | |
| විශේෂ සේවා - සභාව සහ කමිටු | 817,235 | 1,019,330 |
| විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත් ගාස්තු | 1,065,991 | 1,064,583 |
| වෙනත් සංවිධාන සඳහා ප්‍රදාන | 1,325,000 | - |

| | | |
|---|---|---|
| විනෝදාස්වාදය | 836,406 | 1,828,675 |
| බැංකු ගාස්තු | 1,554,204 | 1,332,042 |
| වෙනත් -පුවත්පත් සඟරා ආදිය. | 1,671,586 | 1,202,929 |
| සුභසාධක සංගමය | 4,902,553 | 9,844,924 |
| වෙනත් | 1,651,347 | 1,142,893 |
| | **13,824,322** | **17,435,375** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය** **12 පිටුව**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**සටහන 04. අධ්‍යයන සේවා**

| | | | |
|---|---|---|---|
| වැටුප් සහ වේතන | | 65,942,346 | 54,176,633 |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | | 2,857,260 | - |
| සැපයුම් | | 919,318 | 2,273,166 |
| ගිවිසුම්ගත සේවා | | 1,632,539 | 752,584 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 4.2 | 46,523,470 | 20,073,816 |
| නඩත්තු | | 103,213 | - |
| MBA - ජාත්‍යන්තර වැඩසටහන් | | 11,647,333 | 3,339,075 |
| | | **129,625,478** | **80,615,274** |

**සටහන 4.2- අනෙකුත් පුනරාවර්තන වියදම්**

| | | |
|---|---|---|
| විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත් ගාස්තු | 6,271,064 | 308,745 |
| ශාස්ත්‍රීය පර්යේෂණ | 6,847,979 | 2,234,729 |
| විනෝදාස්වාදය | 1,694,605 | 179,228 |
| උපාධි ප්‍රදානෝත්සවය | 10,916,767 | 5,177,118 |
| විභාග වියදම් | 18,293,351 | 10,562,346 |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 1,308,723 | - |
| වෙනත් වියදම් | 1,190,980 | 1,611,651 |
| | **46,523,470** | **20,073,816** |

**සටහන 05. ඉගෙනුම් සම්පත්**

| | | | |
|---|---|---|---|
| වැටුප් සහ වේතන | | 4,759,142 | 3,725,358 |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | | 702,595 | 297,550 |
| සැපයුම් | | 9,998,904 | 13,077,658 |
| නඩත්තු | | - | - |
| ගිවිසුම්ගත සේවා | | - | - |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 5.2 | 4,143,714 | 3,696,217 |
| | | **19,604,356** | **20,796,783** |

**සටහන 5.2 : අනෙකුත් පුනරාවර්තන වියදම්**

| | | |
|---|---|---|
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 4,143,714 | 3,661,867 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | - | 34,350 |
| | **4,143,714** | **3,696,217** |

**සටහන 06. අනුබද්ධ ක්‍රියාකාරකම්**

| | | | |
|---|---|---|---|
| වැටුප් සහ වේතන | | 5,400,465 | 4,718,870 |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | | 281,100 | 248,900 |
| සැපයුම් | | 2,538,344 | 31,045 |
| නඩත්තු | | 112,512 | 51,238 |
| ගිවිසුම්ගත සේවා | | - | 998,067 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 6.2 | 1,093,474 | 1,564,937 |
| | | **9,425,895** | **7,613,057** |

**සටහන 6.2 : අනෙකුත් පුනරාවර්තන වියදම්**

| | | |
|---|---|---|
| දායකත්ව සහ සාමාජික ගාස්තු | - | 151,384 |
| වෙනත් - පුවත්පත් සඟරා ආදිය. | 1,093,474 | 1,413,553 |
| | **1,093,474** | **1,564,937** |



**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2022 දෙසැම්බර් 31 දිනට**

**සටහන 07 : ලැබිය යුතු පාඨමාලා ගාස්තු ශේෂයන් කපා හැරීම**

| | සටහන | 2022 | රු. 2021 |
|---|---|---|---|
| ලැබිය යුතු MBA 2019/20 | | 2,225,000 | 712,500 |
| ලැබිය යුතු MBA 2020/21 | | 5,818,250 | 6,950,000 |
| ලැබිය යුතු MBA 2021/22 | | 12,200,000 | - |
| ලැබිය යුතු EMBA 2018 | | - | 425,000 |
| ලැබිය යුතු MBAT 2019/20 | | 850,000 | - |
| ලැබිය යුතු MPA 2018/19 | | 375,000 | - |
| ලැබිය යුතු PHD 2020/23 | | 6,400,000 | - |
| ලැබිය යුතු MBA QATAR 2016/18 | | - | 442,724 |
| ලැබිය යුතු MBA QATAR 2018/19 | | 5,547,083 | - |
| ලැබිය යුතු MBA QATAR 2020/21 | | 3,056,900 | 2,982,560 |
| ලැබිය යුතු MBA UAE 2019/20 | | 4,496,025 | 1,232,636 |
| ලැබිය යුතු MBA Oman 2019/20 | | 426,775 | - |
| ලැබිය යුතු MBA Bangladesh 2019/21 | | 2,858,400 | 8,919,719 |
| ලැබිය යුතු MBA Baharain 2020/21 | | 808,888 | 699,038 |
| | | **45,062,320** | **22,364,176** |

**සටහන 08. දේපල, පිරියත සහ උපකරණ**

**පිරිවැය**

| අයිතමය | 2022.01.01 දිනට ශේෂය | එකතුවීම් | ප්‍රත්‍යාගණනය | අපහරණය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ඉඩම් | 5,000,000 | - | - | - | 5,000,000 |
| ගොඩනැගිලි | 163,340,000 | - | - | - | 163,340,000 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 4,852,112 | - | - | - | 4,852,112 |
| ගෘහභාණ්ඩ | 18,234,736 | 8,930,131 | - | - | 27,164,867 |
| කාර්යාල උපකරණ සහ සවි කිරීම් | 3,050,032 | - | - | - | 3,050,032 |
| කාර්යාල උපකරණ | 50,983,440 | 5,606,271 | - | - | 56,589,711 |
| විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ | 13,734,566 | 1,983,500 | - | - | 15,718,066 |
| මෝටර් රථ | 16,000,000 | - | - | - | 16,000,000 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 25,544,679 | 109,856 | - | - | 25,654,536 |
| උපාධි ලෝගු | 2,682,027 | - | - | - | 2,682,027 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **එකතුව** | **303,421,592** | **16,629,758** | **-** | **-** | **320,051,350** |

**ක්ෂය වීම**

| අයිතමය | **2022.01.01** දිනට ශේෂය | ක්ෂය | ක්ෂය ගැලපීම | අපහරණය සඳහා ක්ෂය | **2022.12.31** දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 17,193,684 | 4,298,421 | - | - | 21,492,105 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 4,662,307 | 189,805 | - | - | 4,852,112 |
| ගෘහභාණ්ඩ | 11,634,780 | 1,440,530 | - | - | 13,075,310 |
| කාර්යාල උපකරණ සහ සවි කිරීම් | 3,049,924 | 108 | - | - | 3,050,032 |
| කාර්යාල උපකරණ | 43,899,018 | 4,540,566 | - | - | 48,439,583 |
| විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ | 7,003,401 | 2,128,827 | - | - | 9,132,228 |
| මෝටර් රථ | 422,822 | 2,530,000 | - | - | 2,952,822 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 23,683,562 | 452,703 | - | - | 24,136,265 |
| උපාධි ලෝගු | 2,399,932 | 121,500 | - | - | 2,521,432 |
| **එකතුව** | **113,949,432** | **15,702,459** | **-** | **-** | **129,651,891** |
| | | | | | |
| **රැගෙන යා හැකි ශුද්ධ මුදල** | **189,472,160** | | | | **190,399,459** |

**14 පිටුව**

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2022 දෙසැම්බර් 31 දිනට**

**සටහන 09. කෙරෙමින් පවතින වැඩ - ගොඩනැගිල්ල (අදියර II)**

| | **2022** | **2021** |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ කෙරෙමින් පවතින වැඩ | 124,482,283 | 62,701,621 |
| අවසන් කළ වැඩ | 92,094,869 | 56,760,843 |
| සේවයේ යෙදවීමේ අත්තිකාරම් අයකර ගැනීම් | - | 5,019,819 |
| | 216,577,152 | 124,482,283 |

**සටහන 10. සේවයේ යෙදවීමේ අත්තිකාරම් - ගොඩනැගිල්ල (අදියර II)**

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | 20,113,086 | 32,632,749 |
| ගෙවන ලද අත්තිකාරම් | - | - |
| අයකර ගැනීම | (8,159,378) | (12,519,663) |
| වර්ෂය අවසානයේ දී ශේෂය | 11,953,708 | 20,113,086 |

**සටහන 11. අස්පෘශ්‍ය වත්කම්**

**පිරිවැය**

රු.

| අයිතමය | **2022.01.01** දිනට ශේෂය | එකතු කිරීම් | බැහැර කිරීම් | **2022.12.31** දිනට ශේෂය |
|---|---|---|---|---|
| පද්ධති මෘදුකාංග | 2,540,000 | 150,000 | - | 2,690,000 |
| **එකතුව** | **2,540,000** | **150,000** | **-** | **2,690,000** |

**ක්‍රමක්ෂය**

| අයිතමය | **2022.01.01** දිනට ශේෂය | කාල සීමාව සඳහා ක්‍රමක්ෂ කිරීම | අපහරණය සඳහා ක්‍රමක්ෂ කිරීම | **2022.12.31** දිනට ශේෂය |
|---|---|---|---|---|
| පද්ධති මෘදුකාංග | 763,062 | 515,562 | - | 1,278,624 |
| **එකතුව** | **763,062** | **515,562** | **-** | **1,278,624** |

| | | |
|---|---|---|
| එගෙන යා හැකි ශුද්ධ මුදල | **1,776,938** | **1,411,376** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය** **15 පිටුව**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2022 දෙසැම්බර් 31 දිනට**

**සටහන 12. ස්ථාවර තැන්පතු - 2022**

| ස්ථාවර තැන්පතු අංකය | බැංකුව/ මූල්‍ය ආයතනය | මුහුණත වටිනාකම | 2022.12.31 දිනට මුහුණත වටිනාකම |
|---|---|---|---|
| 88961256 | ලංකා බැංකුව | 132,261,575 | 132,261,575 |
| 88961263 | ලංකා බැංකුව | 165,386,199 | 165,386,199 |
| 88961260 | ලංකා බැංකුව | 144,240,312 | 144,240,312 |
| 320-60-01-00013088-7 | මහජන බැංකුව | 36,999,539 | 36,999,539 |
| 2-0061-12-96507 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 51,553,956 | 51,553,956 |
| | | **530,441,582** | **530,441,582** |

**සටහන 12. ස්ථාවර තැන්පතු - 2021** රු.

| ස්ථාවර තැන්පතු අංකය | බැංකුව/ මූල්‍ය ආයතනය | මුහුණත වටිනාකම | 2022.03.31 දිනට තැන්පතු වටිනාකම |
|---|---|---|---|
| 220141 | ලංකා බැංකුව | 35,000 | 35,000 |
| 220209 | ලංකා බැංකුව | 50,000 | 50,000 |
| 220018 | ලංකා බැංකුව | 43,690 | 43,690 |
| 220267 | ලංකා බැංකුව | 40,000 | 40,000 |
| 9543899 | ලංකා බැංකුව | 2,000,000 | 5,925,058 |
| 9680349 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9680373 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9680289 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9680400 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9680415 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9717250 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9735361 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9735355 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9798584 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9798615 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9798638 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9802042 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 9802088 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 70393465 | ලංකා බැංකුව | 2,000,000 | 5,359,365 |
| 70393475 | ලංකා බැංකුව | 2,000,000 | 5,359,365 |
| 70393484 | ලංකා බැංකුව | 2,000,000 | 5,359,365 |
| 70393496 | ලංකා බැංකුව | 2,000,000 | 5,359,365 |
| 70393501 | ලංකා බැංකුව | 2,000,000 | 5,359,365 |
| 70431699 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 70431966 | ලංකා බැංකුව | 2,000,000 | 2,000,000 |
| 70505660 | ලංකා බැංකුව | 2,000,000 | 5,291,989 |
| 70505677 | ලංකා බැංකුව | 2,000,000 | 5,291,989 |
| 80233140 | ලංකා බැංකුව | 25,000,000 | 25,000,000 |
| 80601267 | ලංකා බැංකුව | 17,000,000 | 17,000,000 |
| 80601341 | ලංකා බැංකුව | 15,000,000 | 15,000,000 |
| 80601361 | ලංකා බැංකුව | 15,000,000 | 15,000,000 |
| 81110575 | ලංකා බැංකුව | 35,000,000 | 35,000,000 |
| 81817205 | ලංකා බැංකුව | 35,000,000 | 35,000,000 |
| 83301982 | ලංකා බැංකුව | 30,000,000 | 30,000,000 |
| 83615260 | ලංකා බැංකුව | 45,000,000 | 58,288,994 |
| 8402199 | ලංකා බැංකුව | 15,000,000 | 15,000,000 |

| | | | |
|---|---|---|---|
| 8470918 | ලංකා බැංකුව | 12,000,000 | 12,000,000 |
| 85230220 | ලංකා බැංකුව | 20,000,000 | 23,346,440 |
| 424736 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 20,000,000 | 48,417,510 |
| 413214 | මහජන බැංකුව | 15,000,000 | 36,468,991 |
| | | | **438,996,485** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය** **16 පිටුව**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්** සටහන

**2022 දෙසැම්බර් 31 දිනට**

| | **2022** | **2021** |
|---|---|---|
| **සටහන 13 . තොග** | | |
| ප්‍රකාශන - මධ්‍ය ගබඩා | 8,003,661 | 3,758,881 |
| ප්‍රකාශන - ජාත්‍යන්තර මධ්‍යස්ථානය | 832,912 | 832,912 |
| ලිපි ද්‍රව්‍ය සහ වෙනත් | 4,660,188 | 3,038,657 |
| පෙළ පොත් තොගය | 18,907,597 | 7,664,210 |
| අත් පොත් තොගය | 852,035 | - |
| | 33,256,393 | 15,294,660 |

| | | |
|---|---|---|
| **සටහන 14 .අත්තිකාරම් සහ පෙරගෙවුම්** | | |
| **අත්තිකාරම්** | | |
| ජාත්‍යන්තර මධ්‍යස්ථානය | 1,641,000 | 1,641,000 |
| ආර්. එම්. එස්. පුෂ්පකුමාර - (CSR) | 50,000 | - |
| ඒ. කේ. එල්. ජයවර්ධන - (CSR) | 203,000 | - |
| ආර්. බමුණුසිංහ - (CSR) | 43,700 | - |
| ඒ. ධර්මසිරි - (CSR) | 80,000 | - |
| NARA | 518,170 | - |
| ගිනි අනතුරු ඇඟවීම | - | 37,500 |
| Tuirnitin LLC | - | 388,852 |
| Science Land Informatics | - | 53,438 |
| **පෙරගෙවුම්** | | |
| AACSB | - | 338,565 |
| EBSCO International (Pvt) Ltd | - | 2,740,937 |
| Metroplolitan Office | 7,245 | - |
| AG Melco Elevator | 142,593 | 127,334 |
| භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව.කොළඹ මහ නගර සභාව | - | 554,400 |
| ශ්‍රී ලංකා දුම්රිය සේවය | - | 13,500 |
| Sunila Textile | - | 13,688 |
| Site Ground Spain S.L | - | 757,377 |
| Grammerly (S.Athuraliyage) | 42,371 | - |
| Science Land Information | 53,413 | - |
| සැපයුම් අත්තිකාරම් ගොඩනැගිල්ල (අදියර II) | 12,497,349 | - |
| | **15,278,840** | **6,666,589** |

| | | | |
|---|---|---|---|
| **සටහන 15. ලැබිය යුතු මුදල්** | | | |
| සිසුන්ගෙන් ලැබිය යුතු මුදල් | **15.1** | 68,999,985 | 92,015,869 |
| කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් | **15.2** | 3,499,984 | 3,523,128 |

| | | | |
|---|---|---|---|
| ලැබිය යුතු පොලී | | 68,755,233 | 9,159,990 |
| අනෙකුත් ලැබිය යුතු දේ | **15.3** | 1,090,869 | 817,431 |
| | | **142,346,071** | **105,516,418** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය** **17 පිටුව**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2022 දෙසැම්බර් 31 දිනට**

රු.

| **සටහන 15.1 සිසුන්ගෙන් ලැබිය යුතු මුදල්** | සටහන | **2022** | **2021** |
|---|---|---|---|
| විධායක සංවර්ධන වැඩසටහන් | | 1,807,155 | 417,400 |
| EMBA 2018/2019 | | 625,000 | 625,000 |
| EMBA 2022/2023 | | 5,403,333 | - |
| EMBA 2021/2020 | | - | 3,500,000 |
| MBA 2014/2015 | | 154,700 | 154,700 |
| MBA 2022/2023 | | 8,175,000 | - |
| MBA 2021/2022 | | 18,500,000 | 15,400,000 |
| MBA 2020/2021 | | 150,000 | 13,716,150 |
| MBA 2019/2020 | | - | 2,525,000 |
| MPA 2018/2019 | | - | 375,000 |
| MBAT 2019/2020 | | - | 1,783,250 |
| MBAT 2022/23 -General | | 2,100,000 | - |
| MBAC 2021/22 | | 2,775,000 | - |
| MPA in Education Management- II (2022) | | 4,250,000 | - |
| PhD 2020/2023 | | 3,940,000 | 9,340,000 |
| MBA (Baharain) 2020/2021 | | - | 3,677,213 |
| MBA (Oman) 2019/2020 | | 540,615 | 3,971,985 |
| MBA (Oman) 2017/2018 | | 1,369,558 | 754,300 |
| MBA (Qatar) 2016/2017 | | 855,974 | 471,438 |
| MBA (Qatar) 2018/2019 | | - | 6,905,834 |
| MBA (Qatar) 2020/2021 | | 405,461 | 10,408,745 |
| MBA (UAE) 2015/2016 | | 5,840,444 | 3,216,692 |
| MBA (UAE) 2017/2018 | | 4,279,869 | 2,947,924 |
| MBA (UAE) 2019/2020 | | - | 6,451,250 |
| MBA (Kuwait) 2018/2019 | | 2,306,624 | 1,880,391 |
| MBA (Bangladesh) 2018/2019 | | - | 3,493,600 |
| MBA (International) 2021/2022 | | 5,496,253 | - |
| ACRMM 2022 | | 25,000 | - |
| | | **68,999,985** | **92,015,869** |

| **සටහන 15.2 කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල්** | | |
|---|---|---|
| ආපදා ණය | 2,832,843 | 3,159,855 |
| පරිගණක ණය | 199,000 | 160,500 |
| වාහන ණය | 438,141 | 199,023 |
| උත්සව අත්තිකාරම් | 30,000 | 3,750 |
| | **3,499,984** | **3,523,128** |

**සටහන 15.3 වෙනත් ලැබිය යුතු සහ තැන්පතු**

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර මධ්‍යස්ථානය | 438,000 | 438,000 |
| ලැබිය යුතු දේපල ආදායම | - | 24,000 |
| ඉන්ධන තැන්පතු | 200,000 | 100,000 |

| | | |
|---|---|---|
| තැපැල් තැන්පතු | 49,798 | 102,359 |
| පොලී මත ලැබිය යුතු WHT | 153,072 | 153,072 |
| ලැබිය යුතු තැන්පතු | 250,000 | - |
| | **1,090,869** | **817,431** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය** **18 පිටුව**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්** සටහන

**2022 දෙසැම්බර් 31 දිනට**

| **සටහන 16. මුදල් සහ මුදල් සමාන දෑ** | | **2022** | **2021** |
|---|---|---|---|
| ලංකා බැංකුව - බොරැල්ල ශාඛාව- ගිණුම් අංකය 192596 | | (3,888,995) | 2,197,110 |
| සම්පත් බැංකුව පී.එල්.සී. ඇම. ඩොලර් ගිණුම් අංකය 521830000070 | | 110,873,191 | 38,667,518 |
| බැංකු ගිණුම - නේවාසික විදේශ මුදල් (ජාත්‍යන්තර මධ්‍යස්ථානය) ගිණුම් අංකය 9719360 | | 1,134,900 | 2,812,681 |
| බැංකු ගිණුම (ජාත්‍යන්තර මධ්‍යස්ථානය) ගිණුම් අංකය 021580683001 | | 87,461 | 87,461 |
| අරමුදල් කළමනාකරණ ගිණුම | | 67,650,002 | 101,947,976 |
| කෙටි කාලීන ආයෝජන (මාස 1-3) | **16.1** | 40,000,000 | 202,779,966 |
| සුළු මුදල් අග්‍රිමය | | - | - |
| | | **215,856,559** | **348,492,712** |

**සටහන 16.1. කෙටි කාලීන ආයෝජන (මාස 1-3)**

| **ස්ථාවර තැන්පතු අංකය** | **බැංකුව / මූල්‍ය ආයතනය** | **මුහුණත වටිනාකම** | **2022.12.31 දිනට තැන්පතු වටිනාකම** | **2021.12.31 දිනට තැන්පතු වටිනාකම** |
|---|---|---|---|---|
| 90076949 | ලංකා බැංකුව | 20,000,000 | 20,000,000 | - |
| 90076939 | ලංකා බැංකුව | 20,000,000 | 20,000,000 | - |
| 74147601 | ලංකා බැංකුව | 25,000,000 | - | 51,931,511 |
| 74811175 | ලංකා බැංකුව | 20,000,000 | | 20,000,000 |
| 75405922 | ලංකා බැංකුව | 20,000,000 | - | 20,000,000 |
| 76869279 | ලංකා බැංකුව | 15,000,000 | - | 25,848,454 |
| 78439704 | ලංකා බැංකුව | 25,000,000 | - | 25,000,000 |
| 86833771 | ලංකා බැංකුව | 60,000,000 | - | 60,000,000 |
| | | | **40,000,000** | **202,779,966** |

| **සටහන 17. ප්‍රත්‍යාගණන සංචිතය** | **2022** | **2021** |
|---|---|---|
| ගෘහ භාණ්ඩ ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | 4,761,623 | 4,761,623 |
| විද්‍යාගාර සහ ඉගෙනුම් උපකරණ ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | 10,424,585 | 10,424,585 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | 43,188 | 43,188 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | 146,505,169 | 146,505,169 |
| වාහන ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | 16,000,000 | 16,000,000 |
| **දෙසැම්බර් 31 වන දිනට ප්‍රත්‍යාගණන සංචිතය** | **177,734,566** | **177,734,566** |

| **සටහන 18. පාරිතෝෂික සඳහා වෙන් කිරීම්** | | |
|---|---|---|
| ජනවාරි 01 වැනි දිනට වෙන් කිරීම් | 16,954,659 | 23,042,372 |
| එකතු කළා - වර්ෂය සඳහා ප්‍රතිපාදන | 1,303,951 | 1,596,224 |
| වට්ටම් අනුපාතයේ වෙනස්වීම් හේතුවෙන් සැබෑ ලාභය | (4,071,134) | - |
| | 14,187,477 | 24,638,595 |
| අඩු කළා - පාරිතෝෂික ගෙවීම් | (3,794,151) | (7,683,936) |
| **කාලසීමාව අවසානයේ දී ප්‍රතිපාදන** | **10,393,326** | **16,954,659** |

| **සටහන 19. පරිත්‍යාග අරමුදල** | | |
|---|---|---|
| ඩී. එස්. ජයසුන්දර ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 290,524 | 290,524 |
| කමල්ගොඩ මහතා/ මහත්මිය ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 28,568 | 28,568 |
| ශිෂ්‍යත්ව අරමුදල | 118,516 | 118,516 |
| | **437,608** | **437,608** |

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**19 පිටුව**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 දිනට

| සටහන 20. ප්‍රතිපාදන | 2022 | 2021 |
|---|---|---|
| විගණන ගාස්තු | - | 1,286,755 |
| වියදම් | 5,193,200 | 4,437,900 |
| PIM ALUMNAI සාමාජික ගාස්තුව | 7,992,794 | 6,378,419 |
| | **13,185,994** | **12,103,074** |

| සටහන 21. ආපසු ගෙවිය යුතු තැන්පතු | | |
|---|---|---|
| ටෙන්ඩර් තැන්පතු | 401,000 | 95,000 |
| ආරක්ෂක තැන්පතු | 35,000 | 35,000 |
| | **436,000** | **130,000** |

| සටහන 22. අත්තිකාරම් වශයෙන් ලැබුණු ආදායම | | |
|---|---|---|
| විධායක සංවර්ධන වැඩසටහන | 5,384,894 | 778,650 |
| MBA 2021/22 | - | 34,377,400 |
| MBA 2022/23 | 19,775,000 | 21,955,000 |
| MBA 2023/24 | 14,250,000 | - |
| MBAT 2022 -I (IRD) | 10,000,000 | - |
| MBAC 2021/22 | 250,000 | - |
| MPAEM I | 2,700,000 | - |
| PHD 2020/23 | 280,000 | - |
| MBA 2021/22 International | 2,708,121 | 4,520,010 |
| MBA QATAR 2023/24 | 5,245,913 | |
| | **60,593,928** | **61,631,060** |

| සටහන 23. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | | |
|---|---|---|
| ජාත්‍යන්තර මධ්‍යස්ථානය | 7,860,000 | 7,860,000 |
| උපචිත වියදම් | 9,178,313 | 8,158,006 |
| ශිෂ්‍යාධාර ගිණුම - විදේශ - සිටි බැංකුව | 1,340,999 | 1,148,399 |
| PIM ALUMNI සංගමය | 2,720,000 | 2,117,325 |
| ආපදා ණය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 112,120 | 116,286 |
| ගෙවිය යුතු - සුබසාධක සමිතිය | 6,942 | 4,096,953 |
| ශිෂ්‍ය ගෙවිය යුතු | 20,000 | - |
| ගෙවිය යුතු විගණන ගාස්තුව | 887,400 | - |
| කාර්ය මණ්ඩලය-උත්සව අත්තිකාරම් | 16,250 | - |
| | **22,142,024** | **23,496,970** |

**සටහන 3.1, 4.1, 5.1, 6.1**
**මුළු පුනරාවර්තන වියදම්**

රු.

| මාතෘකාව / විෂය | | සටහන 3.1<br>සාමාන්‍ය පරිපාලනය | සටහන 4.1<br>අධ්‍යයන සේවා | සටහන 5.1<br>ඉගෙනුම් සම්පත් | සටහන 6.1<br>උපකාරක ක්‍රියාකාරකම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| **වැටුප් සහ වේතන** | | | | | | |
| 04101-4201 | වැටුප් සහ වේතන | 17,693,479.97 | 37,492,248.16 | 2,868,266.75 | 3,746,255.00 | 61,800,249.88 |
| 04102-4202 | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 1,697,313.42 | 3,615,411.12 | 413,422.68 | 474,478.38 | 6,200,625.60 |
| 04103-4203 | විශ්‍රාම වැටුප් | 630,939.45 | 601,610.23 | 61,054.48 | 52,832.40 | 1,346,436.56 |
| 04104-4204 | සේවක භාරකාර අරමුදල | 465,650.74 | 843,404.30 | 94,895.44 | 105,462.18 | 1,509,412.66 |
| 04105-4205 | වැඩ බැලීමේ දීමනාව | 12,000.00 | - | - | - | 12,000.00 |
| 04107 | පර්යේෂණ දීමනාව | 231,601.32 | 922,498.50 | - | - | 1,154,099.82 |
| 04108 | අධ්‍යයන දීමනා | - | 5,236,164.00 | - | - | 5,236,164.00 |
| 04208 | අතිකාල | 2,482,077.21 | - | 664,007.46 | 423,940.88 | 3,570,025.55 |
| 04110-4210 | අනෙකුත් දීමනා | 7,583,439.92 | 5,966,713.18 | 473,670.25 | 460,298.96 | 14,484,122.31 |
| 04111 | බාහිර කථිකාචාර්ය ගාස්තු | - | 10,186,037.55 | - | - | 10,186,037.55 |
| 04112-4212 | පාරිතෝෂිකය | 396,094.54 | 774,059.14 | 90,225.04 | 43,597.59 | 1,303,976.31 |
| 04213 | ජීවන වියදම් දීමනාව | 1,084,200.00 | 304,200.00 | 93,600.00 | 93,600.00 | 1,575,600.00 |
| | | 32,276,796.57 | 65,942,346.18 | 4,759,142.10 | 5,400,465.39 | 108,378,750.24 |
| **ගමන් වියදම් හා යැපීම් දීමනා** | | | | | | |
| 0501 | දේශීය | 3,177,530.00 | 2,503,684.00 | 702,595.00 | 281,100.00 | 6,664,909.00 |
| 0502 | විදේශීය | 118,314.90 | 353,576.00 | - | - | 471,890.90 |
| | | 3,295,844.90 | 2,857,260.00 | 702,595.00 | 281,100.00 | 7,136,799.90 |
| | | | | | | |
| **සැපයුම්** | | | | | | |
| 0601 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 3,255,683.01 | 811,768.25 | 9,974,984.20 | 57,460.00 | 14,099,895.46 |
| 0602 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 1,303,883.00 | - | - | - | 1,303,883.00 |
| 0603 | නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු | 1,260,107.50 | - | - | - | 1,260,107.50 |
| 0604 | යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 748,483.25 | 107,550.00 | 23,000.00 | 2,406,650.00 | 3,285,683.25 |
| 0607 | අනෙකුත් සැපයුම් | 4,085,436.68 | - | 920.00 | 74,233.53 | 4,160,590.21 |
| | | | | | | - |
| | | 10,653,593.44 | 919,318.25 | 9,998,904.20 | 2,538,343.53 | 24,110,159.42 |

| මාතෘකාව / විෂය | | සටහන 3.1<br>සාමාන්‍ය පරිපාලනය | සටහන 4.1<br>අධ්‍යයන සේවා | සටහන 5.1<br>ඉගෙනුම් සම්පත් | සටහන 6.1<br>උපකාරක ක්‍රියාකාරකම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| **නඩත්තු** | | | | | | |
| 0701 | වාහන | 1,629,695.79 | - | - | - | 1,629,695.79 |
| 0702 | පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 567,317.90 | - | - | - | 567,317.90 |
| 0703 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 1,308,189.00 | 103,212.50 | - | - | 1,411,401.50 |
| 0705 | අනෙකුත් | 1,991,687.77 | - | - | 112,511.63 | 2,104,199.40 |
| | | 5,496,890.46 | 103,212.50 | - | 112,511.63 | 5,712,614.59 |
| **ගිවිසුම්ගත සේවා** | | | | | | |
| 0801 | ප්‍රවාහන | - | - | - | - | - |
| 0802 | විදුලි සංදේශ | 2,373,246.44 | 24,524.23 | - | - | 2,397,770.67 |
| 0803 | තැපැල් ගාස්තු | 68,997.68 | - | - | - | 68,997.68 |
| 0804 | විදුලි ගාස්තු | 6,544,570.65 | - | - | - | 6,544,570.65 |
| 0805 | ආරක්ෂක සේවා | 2,796,991.92 | - | - | - | 2,796,991.92 |
| 0806 | ජලය | 483,232.25 | - | - | - | 483,232.25 |
| 0807 | සනීපාරක්ෂක සේවා | 3,581,482.33 | - | - | - | 3,581,482.33 |
| 0808 | පළාත්පාලන ආයතන සඳහා වන කුලී සහ බදු ගාස්තු | 854,475.92 | - | - | - | 854,475.92 |
| 0810 | මුද්‍රණය, ප්‍රචාරණය ආදිය. | 7,520,003.06 | 1,608,014.42 | - | - | 9,128,017.48 |
| 0811 | අනෙකුත් | 53,437.50 | - | - | - | 53,437.50 |
| | | 24,276,437.75 | 1,632,538.65 | - | - | 25,908,976.40 |
| | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **අනෙකුත් පුනරාවර්තන වියදම්** | | | | | | |
| 0902 | විශේෂ සේවා - සභාව සහ කමිටු | 817,235.00 | 80,000.00 | - | - | 897,235.00 |
| 0903 | විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත් ගාස්තු | 1,132,990.75 | 6,271,064.03 | - | - | 7,404,054.78 |
| 0904 | වැඩමුළුව, සම්මන්ත්‍රණ | 810,397.00 | 694,150.00 | - | - | 1,504,547.00 |
| 0905 | අධ්‍යයන පර්යේෂණ | - | 6,847,979.41 | - | - | 6,847,979.41 |
| 0906 | කාර්ය මණ්ඩල සංවර්ධනය | 189,700.00 | - | - | - | 189,700.00 |
| 0907 | අනෙකුත් සංවිධාන සඳහා ප්‍රදාන | 1,325,000.00 | - | - | - | 1,325,000.00 |
| 0908 | නිවාඩු බලපත්‍ර සහ වාර ප්‍රවේශපත් | 106,500.00 | - | - | - | 106,500.00 |
| 0909 | විනෝදාස්වාද වියදම් | 836,406.00 | 1,694,605.00 | - | - | 2,531,011.00 |
| 0910 | බැංකු ගාස්තු | 1,554,204.03 | - | - | - | 1,554,204.03 |
| 0912 | දායකත්ව සහ සාමාජික ගාස්තු | - | 1,308,723.03 | 4,143,714.36 | - | 5,452,437.39 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 0913 | උපාධි ප්‍රදානෝත්සව | - | 10,916,766.90 | - | - | 10,916,766.90 |
| 0914 | විභාග වියදම් | 544,750.00 | 18,293,351.33 | - | - | 18,838,101.33 |
| 0915 | අනෙකුත් - පුවත්පත් සඟරා ආදිය. | 1,671,585.62 | 416,830.00 | - | 1,093,474.37 | 3,181,889.99 |
| 0916 | සුබසාධක සංගමය | 4,902,553.25 | - | - | - | 4,902,553.25 |
| | | 13,891,321.65 | 46,523,469.70 | 4,143,714.36 | 1,093,474.37 | 65,651,980.08 |

**21 පිටුව**

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**සටහන 3.1, 4.1, 5.1, 6.1**

**මුළු පුනරාවර්තන වියදම්**

| | සටහන 3.1 | සටහන 4.1 | සටහන 5.1 | සටහන 6.1 | එකතුව |
|---|---|---|---|---|---|
| මාතෘකාව / විෂය | සාමාන්‍ය පරිපාලනය | අධ්‍යයන සේවා | ඉගෙනුම් සම්පත් | උපකාරක ක්‍රියාකාරකම් | |
| | | | | | |
| MBA ( UAE) 2017/2018 | | 288,403.25 | | | 288,403.25 |
| MBA ( UAE) 2019/2020 | | 1,619,975.00 | | | 1,619,975.00 |
| MBA ( Qatar) 2018/2019 | | | | | - |
| MBA ( Qatar) 2020/2021 | | 2,970,863.01 | | | 2,970,863.01 |
| MBA (Oman)2019/2020 | | 975,866.00 | | | 975,866.00 |
| MBA (Kuwait) 2018/2019 | | 122,868.00 | | | 122,868.00 |
| MBA (Bahrain) 2019/2021 | | 1,227,010.38 | | | 1,227,010.38 |
| MBA International | | 4,442,347.11 | | | 4,442,347.11 |
| උප එකතුව | **-** | **11,647,332.75** | **-** | **-** | **11,647,332.75** |
| මුළු එකතුව | **89,890,884.77** | **129,625,478.03** | **19,604,355.66** | **9,425,894.92** | **248,546,613.38** |

**ඇමුණුම 1**

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් එළඹ ඇති ගිවිසුම් සඳහා සෘජු හෝ වක්‍ර බැඳියාවක් දක්වන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයාගේ නියෝජනය**

| ගිවිසුම පිළිබඳ ලුහුඬු විස්තරය සහ එහි ස්වභාවය | ආයතනය විසින් එළැඹ ඇති ගිවිසුම් සඳහා සෘජු හෝ වක්‍ර බැඳියාවක් දක්වන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයාගේ නම | ආයතනයේ ව්‍යාපාර සඳහා සාමාන්‍ය හේතුවක් තිබේද නැතහොත් ඉදිරිපත් කර ඇති විශේෂ කොන්දේසි තිබේද යන්න |
|---|---|---|
| 1. අධ්‍යක්ෂක | - ආචාර්ය ඩබ්ලිව්.ජී.එස්.කැළුම් | සාමාන්‍ය |
| 2. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපදේශක | -අසංග රණසිංහ මහතා | සාමාන්‍ය |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එවර්ඩී/ඩී/පීඅයිඑම්/එෆ්ඒ/04 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 ජුනි 30 දින |

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ. ෆොන්සේකා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් : 01. උපකුලපති - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

02. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

03. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඩී/පීඅයිඑම්/එෆ්/22/04 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 ජුනි 30 දින

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1985 අංක 3 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 19 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 39 ඡේදය අනුව මුදල් ප්‍රවාහයන් නොවන රු.14,729,762 ක විදේශ විනිමය ලාභ මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂවලට අදාලව රු.131,575 ක් වූ ඌන ක්ෂය වෙන්කිරීම් පෙර වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 45,671,870 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් කාණ්ඩ තුනකට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය රු. 422,543 ක් අඩුවෙන් ගණනය කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය හා ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි..

(ඉ) කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.3.850,000 ක් වූ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට අදාලව ආපසු ගෙවන ලද රු.1,500,000 පාඨමාලා ගාස්තු ආදායම පොදු සංචිත ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ගිණුමෙන් අඩු කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දේශීය පාඨමාලා 07 ක හා විදේශීය පාඨමාලාවක ආදායම ලෙජර් ගිණුම් හා උපලේඛන සමග සැසඳීමේ දී පිළිවෙලින් රු.19,990,520 ක හා රු.4,081,690 ක වෙනසක් පැවතුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රකාශන තොගයෙහි වටිනාකම රු. 8,003,661 ක් වුවද තොග සමීක්ෂණ වාර්තා අනුව එම ශේෂය රු. 5,642,226 ක් වූයෙන් රු. 2,361,435 ක වෙනසක් පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

---

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**2.1.1** මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක සභාවේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව යම් සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පාලක සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/ විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 2/2020 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා 2017 අගෝස්තු 23 දිනැති අංක DMS/0011/PIM දරන කලමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | කොන්ත්‍රාත් පත්වීම් ඇතුළු සියළුම බඳවා ගැනීම්/ පුරප්පාඩු පිරවීම් අනුමත සේවා ව්‍යවස්ථාවට හෝ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූල විය යුතු වුවද බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීමකින් තොරව ආයතනය විසින් කළමනාකරණ උපදේශක තනතුර 04 ක් සහ ජොෂ්ඨ කළමනාකරණ උපදේශක තනතුර 06 ක් සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවා ගෙන තිබුණි. |

පිටුව 6 | 7

| | | |
|---|---|---|
| (ආ) | 2022 ජුනි 10 දිනැති අංක 03/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛය | විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට අදාල අයදුම්පත් නැවත දැනුම් දෙන තුරු ඉදිරිපත් නොකරන ලෙස චක්‍රලේඛ උපදෙස් ලබාදී තිබුණද 2021 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකු චක්‍රලේඛ දිනෙන් පසුවද කොන්ත්‍රාත් පත්වීම දීර්ඝ කරමින් සේවයේ යොදවාගෙන තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය සිය බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

අනුමත කාර්ය මණ්ඩලයට අනුව නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරක් පමණක් පවතින අතර ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත නියෝජ්‍ය මූල්‍යාධිකාරීන් දෙදෙනෙකු 2022 මැයි සිට සේවයේ යොදවා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබෙන නියෝජ්‍ය මූල්‍යාධිකාරී වෙත සමාලෝචිත වර්ෂයේ මැයි මාසයේ සිට දෙසැම්බර් දක්වා එකතුව රු. 1,818,960 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පි.සි. වික්‍රමරත්න
විගණකාධිපති.

## 2022 මූල්‍ය ප්‍රකාශන

## විගණකාධිපති වාර්තාව

## විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු

### 1.2 තත්ත්වාගණනය කළ මතය

අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදි කර 2023 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු ඇත.

ආ) විමර්ශනයට යටත් වූ සියලුම කාර්යාල උපකරණවල ඵලදායී ආයු කාලය 2022 දෙසැම්බර් 31 දිනට අවසන් වී ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2014 - 2022 කාලය තුළ ක්ෂයවීම් සඳහා වත්කම් ලැයිස්තුව සකස් කිරීමේදී අයිතම කිහිපයක් ලැයිස්තුවෙන් මඟ හැරීම නිසා ඇති වූ ක්ෂයවීම් හිඟය ඇතුළත් කිරීමෙන් මෙම දෝෂය සිදුවී ඇත. එම දෝෂය නිසා ඇති වූ බලපෑම අතීතයට බලපාන සේ ගැළපීමට සහ 2023 වර්ෂයේදී ගිණුම් වාර්තා තුළ නැවත ප්‍රකාශ කිරීමට පියවර ගනු ඇත.

ඇ) කොවිඩ්-19 බලපෑම සහ ඒ හා සම්බන්ධව ආයතන වැසීම, ප්‍රවාහන දුෂ්කරතා සහ සේවකවන් සේවයට පැමිණීමේ දී සිදු වූ බාධාවන් හේතුවෙන් වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු ප්‍රමාද විය. ජංගම නොවන වත්කම්වල ඵලදායී ආයු කාලය සමාලෝචනය කිරීම සහ එම වත්කම් ප්‍රත්‍යාගණනය දැනටමත් ආරම්භ කර ඇත.

ඈ) 2014 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද සහ 2018 වර්ෂයේදී මිල දී ගත් යන්ත්‍ර සූත්‍ර ක්ෂය කිරීමේ දී සිදු වූ අඩුවෙන් ගණනය කර තිබීම 2023 වර්ෂයේ මූල්‍ය වාර්තාවල අතීතයට බලපාන සේ ගැළපීමට සහ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගනු ඇත.

පුස්තකාල පොත්වල සහ වාර සඟරාවල මිල ගණන් ගිණුම් පොත්වල පවතින අගයන් සමඟ සංසන්දනය කිරීමේදී ගිණුම් පොත්වල රුපියල් 17,013ක වැඩියෙන් දක්වා ඇති බව අනාවරණය වීම නිසා එම අගය ගිණුම් පොත්වලින් ඉවත් කර ඇත. ගිණුම් පොත්වලින් ඉවත් කරන ලද වටිනාකමට අදාළ ක්ෂයවීම් ප්‍රමාණයේ බලපෑම හේතුවෙන් රු.3,403 ක් ක්ෂයවීම් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව ක්ෂයවීම් නිවැරදිව ගිණුම්ගත කර ඇත.

ඉ) සමාලෝචනය රුපියල් 4,050,000 ක් ලෙස නිවැරදි විය යුතුය. එම මුදල පාඨමාලාව හැරගිය සිසුන් 15 දෙනෙකුට අදාළ වේ. එයින් රුපියල් 800,000 (රු. 400,000 x 2) සිසුන් දෙදෙනෙකුගෙන් (02), රු. 3,250,000 (250,000 x 13) සිසුන් දහතුන්දෙනෙකුගෙන් (13) අය විය යුතුය. එම සිසුන් අක්‍රිය ගණයට අයත් වන බැවින් ආදායම් ලෙස ගිණුම්ගත කර නොමැත.)

ඊ) විධායක ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි (EMBA) 2021 පාඨමාලා ගාස්තුවෙන් ආපසු ගෙවන ලද රුපියල් 1,500,000 ක මුදල අතීතයට බලපාන සේ

ගළපා ගිණුම් වාර්තාවල නැවත ප්‍රකාශ කිරීමට 2023 වර්ෂයේ දී පියවර ගනු ලැබේ.

ට) අගයන්හි වෙනස්කම් පරීක්ෂා කිරීමේදී, ගැලපීම් අවශ්‍ය බව අනාවරණය වුවහොත්, 2023 වර්ෂයේදී ඒ සම්බන්ධයෙන් පියවර ගනු ලැබේ.

ඨ) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් ඇතැම් මුල් තොග අයිතම බැහැර කිරීම නිසා මෙම වෙනස සිදු වේ. අතීතයට බලපාන සේ ගළපා ගිණුම් වාර්තාවල නැවත ප්‍රකාශ කිරීමට 2023 වර්ෂයේ දී පියවර ගනු ලැබේ.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

### 2.2.2 නීතිරීති/ විධානයට යොමුව

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බඳවා ගැනීමේ පටිපාටි හා අනුකූලව ආයතනය ස්ථිර කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් බඳවාගෙන ඇත.

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා කළමනාකරණ උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, එම පටිපාටිවලට අනුකූලව බඳවා ගැනීම් සිදු කර ඇත.

ආ) 2022 මැයි 25 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක PCS/ APP/HB/01/2022 විශ්වවිද්‍යාල පද්ධතියට නොව රාජ්‍ය සේවයට අදාළ වේ.

2009 පෙබරවාරි 20වන දින නිකුත් කරන ලද අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන් දක්වා ඇති අතර එම විධිවිධාන රාජ්‍ය සේවකයන්ට අදාළ වේ. ගැසට් පත්‍රයේ XXII පරිච්ඡේදයට අනුව රාජ්‍ය සංස්ථා සේවකයන් රාජ්‍ය සේවක අර්ථ දැක්වීමෙන් බැහැර කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 69ට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණයට අනුව විශ්වවිද්‍යාල අයත් වන්නේ රාජ්‍ය සංස්ථා ගණයටය. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් හෝ චක්‍රලේඛ විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ නොවන බව පැහැදිලිය. විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත විශ්වවිද්‍යාල පද්ධතියට බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිකුත් කළ ලිපිය මගින්

බලපෑමක් එල්ල විය හැකි බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2022 මැයි 25 දිනැති අංක 03/2022 චක්‍රලේඛය නිකුත් කර ඇත.

### 2.3 වෙනත් කරුණු

අ) ආයතනයේ ස්ථිර සේවක සංඛ්‍යාව තුළ ඇත්තේ එක් නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරක් පමණි. 2021 වසර අවසන් වනතුරු එම තනතුරේ රාජකාරි කටයුතු කළේ විශ්වවිද්‍යාල පද්ධතියේ අත්දැකීම් බහුල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයෙකු විසිනි. මූල්‍ය, ප්‍රසම්පාදන, ගිණුම්කරණය, ව්‍යාපෘති, ජාත්‍යන්තර මූල්‍ය, ආනයන ආදී ක්ෂේත්‍ර ගණනාවක පළපුරුද්දක් ඇති නිලධාරියකු බැවින් ආයතනයේ මූල්‍ය අංශයේ කාර්යසාධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට ඔහුට හැකි විය.

එම නිලධාරියාගේ පළපුරුද්ද මෙන්ම ආයතනයේ කටයුතු පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සැලකිල්ලට ගෙන විශ්‍රාමික නිලධාරියාගේ සේවය ආයතනයට සුදුසු බව තීරණය විය. කොන්ත්‍රාත් පදනම මත පත් කරන ලද විශ්‍රාමික නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයාගේ රාජකාරි පැහැදිලිවම වෙන් කර දක්වා ඇති අතර, නිලධාරියාට වැටුපට අමතරව අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල වැනි විශ්‍රාම ප්‍රතිලාභ කිසිවක් හිමි නොවේ.

සේවක වැටුප් මෙන්ම ප්‍රාග්ධන වියදම් ද ඇතුළුව සියලුම පුනරාවර්තන වියදම් මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී ස්වයං මූල්‍යන පදනමක් මත ආයතනය විසින් දරනු ලබන බව මෙහි දී අවධානයට ලක් කළ යුතුය.